# ගෘහ කළමනාකරණය සහ පවුල් සංවර්ධනය



පර්යේෂක

**විමල් දිසානායක**

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

# ගෘහ කළමනාකරණය
# සහ
# පවුල් සංවර්ධනය

G. DISSANAYAKE
OFFICER-IN-CHARGE
Rural Development Training
and Research Institute
24/4, Castle Street,
COLOMBO 03.

**කාර්යබද්ධ පර්යේෂණයකි**

පර්යේෂක
විමල් දිසානායක

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

2002

ප්‍රථම මුද්‍රණය : 2003

© ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ISBN 955-8225-04-5

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

දිසානායක, විමල්
ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය/
විමල් දිසානායක - කොළඹ :
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, 2003
පි. 172: රූපසටහන්; සෙ.මී. 21.5

**ISBN** 955-8225-04-5 මිල :රු. 375.00

i. 640 ඩිවි 21 ii. ග්‍රන්ථ නාමය
1. ගෘහ ආර්ථික විද්‍යාව

මුද්‍රණය:- එස්. ඇන්ඩ්. එස්. ප්‍රින්ටර්ස්
49, ජයන්ත වීරසේකර මාවත,
කොළඹ 10.
දුරකතනය: 384028, 390873

බෙදාහැරීම:- ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය
24/4 කාසල් වීදිය, කොළඹ 08.
දුරකථන: 01-682091, 695579 Fax: 696592
E-Mail - rdtri@sltnet.lk

# පෙරවදන

මෙම ග්‍රන්ථය සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස හැඳින්වීම වඩාත් යෝග්‍ය වේ. විශේෂයෙන් මෙම ග්‍රන්ථයට අදාල පර්යේෂණ සැලැස්ම ඉතා කැමැත්තෙන් අනුමත කොට ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙමින්, එහි ප්‍රගතිය නිතර විමසා බලමින් මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත්වනතුරු නොඉවසිල්ලෙන් බලා සිටි. ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ දැනට යෞවන කටයුතු අමාත්‍යාංශයේ ආර්.ආර්.එම්.අමරතුංග මහතාණන්ට මගේ හෘදබැඳි ගෞරවාදර ස්තූතිය ප්‍රථම කොට පුද කරමි.

එමෙන්ම මෙම ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) අනුරාධ විජේකෝන් මහතා පර්යේෂණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය උපදෙස් දෙමින් නිරන්තරයෙන් මෙහි ප්‍රගතිය විමසා බලමින් මෙම නිර්මාණය සඳහා පූර්ණ නිදහස ලබාදුන්නා පමණක් නොව, ක්ෂෙත්‍රයට ගොස් මා හා එක්ව අදාල කාර්යයන්ට ක්‍රියාකාරීව සහභාගී වෙමින් දක්වන ලද සහාය බෙහෙවින්ම අගය කළයුත්තකි. එබැවින් එතුමාණන්ටද මගේ ගෞරවාදර ස්තූතිය මින් පුදකරමි.

වර්තමාන අධ්‍යක්ෂ ලයනල් විජේරාම මහතාණන්ද එම තනතුරට පත්ව ආ කෙටි කාලය තුල මේ පිළිබඳ අවශ්‍ය විමසීම් කරමින් පහසුකම් සලසමින් වඩාත් නිර්මාණශීලි නිබන්ධනයක් බිහිකරලීම සඳහා දැක්වූ සහාය බෙහෙවින්ම අගය කළයුත්තකි. එබැවින් එතුමාණන්ටද මගේ ගෞරවාදර ස්තූතිය මින් පුදකරමි.

මාස ගණනාවක් තිස්සේ සිදු කෙරුණු මෙම කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාවලියට නිරන්තරයෙන්, අවශ්‍ය දත්ත සියල්ල ලබාදෙමින්, ක්ෂෙත්‍රයේ පුහුණු වැඩමුළු සංවිධානය කරමින්, විශේෂයෙන් දත්ත විග්‍රහය සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කරමින් හා සියළුම ක්ෂෙත්‍ර කටයුතු සංවිධානය කරමින්, සෑම අවස්ථාවක මෙම ක්‍රියාවලියේ පර්යේෂක සහායකයන් වශයෙන් කටයුතු කළ හබරාදුව සහභාගිත්ව සංවර්ධන පදනමේ සභාපති එච්.පී.කාන්ති මෙනෙවියටත් එහි ලේකම් ඉන්ද්‍රා දිවියගහ මහත්මියටත් මගේ ගෞරවාදර ස්තූතිය මින් පුදකරමි.

මීට අමතරව ක්ෂෙත්‍ර කටයුතු වලදී සහායවූ ඩී.කේ.මල්ලිකා, ඉන්ද්‍රා හේමානි, එල්.පී.නලනි, එල්.එම්.ආරියවංශ, යූ.එච්.පද්මසිලි යන ක්ෂෙත්‍ර සහායිකාවන්ටත්, ලිපි ලේඛණ සකස් කිරීමේදී සහායවූ දිල්රුක්ෂි කුඩාගම මෙනෙවියටත් මගේ ගෞරවාදර ස්තූතිය මින් පුදකරමි.

එමෙන්ම පරිගණක වදන් සකසා දුන් ශ්‍රියානි මානෙල් සිරිවර්ධන මහත්මියටත්, මුල්‍ය පහසුකම් සලසාදුන් ගාමිණී මදනායක මහතාටත්, පොත්බැඳීමේ කටයුතු නිසි පරිදි නිමකරදුන් අක්මීමන පුලස්ති මුද්‍රණාලයාධිපති ටී.කේ.අමරතුංග මහතාටත් මගේ ගෞරවාදර ස්තූතිය මින් පුදකරමි. මීට අමතරව ගොවියාපාන, වැල්හේන්ගොඩ, වැල්අද්දරගොඩ, පියදිගම නැගෙනහිර හා මීපේ යන ගම්මාන වලින් මෙම පර්යේෂණ ක්‍රියාවලියේ නියමු පිරිස ලෙස හඳුනාගත් පවුල් සියයේ සියළුමදෙනාටමත් මගේ බලවත් කෘතඥතාව මින් ප්‍රකාශ කරමි.

2002.10.31

විමල් දිසානායක

හැඳින්වීම.

මෙම පර්යේෂණ ක්‍රියාදාමය නවමු අත්දැකීමකි. විශේෂයෙන් කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමයක් වන නිසා මෙම ග්‍රන්ථය හැඳින්විය යුත්තේ එකී කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමයේ මූලාරම්භය වශයෙනි. පර්යේෂණ ග්‍රන්ථයට ගොනුගත කරනු ලබන අවස්ථා, සිද්ධීන්, දත්ත, තොරතුරු, සටහන් ප්‍රකාශයන් නිගමන හා යෝජනා ආදී සියල්ල කාර්යබද්ධ පර්යේෂණයේ මූලාරම්භයට අයත් වේ. එහෙත් ඉදිරියට දිගහැරෙන සංවර්ධන ක්‍රියාවලියකට අයත් ක්‍රියාකාරකම් පිළිබඳ වැඩසටහන් සහිත තොරතුරු ද ඇතුලත් වන නිසා පර්යේෂණ ග්‍රන්ථයේ පුළුල් ගැඹුරු හා අර්ථවත් ස්වභාවයද නොඅඩුව රැඳී පවතී.

සමාජ සංස්ථාව තුළ පවත්නා කිසියම් ප්‍රශ්නයක, ගැටළුවක, අර්බුදයක හෝ සංසිද්ධියක යථා ස්වභාවය දැකීමත්,, එම දැක්ම හරහා පර්යේෂකයගේ නිගමන, හා යෝජනා නිර්දේශ අදාල ක්‍රියාකාරීන් වෙත හෝ සමස්ත සමාජය වෙත දක්වාලීම සමාජ පර්යේෂකයගේ මූලික කාර්යභාරය වේ. ඉන්පසු අදාල පර්යේෂණ ක්‍රියාදාමය පිළිබඳ පර්යේෂක සතු වගකීමද නිමාවට පත්වේ. මෙය වර්තමාන සමාජ පර්යේෂණවල මූලික ස්වභාවයයි. මෙම සමාජ පර්යේෂණවල තවත් වැදගත් මෙන්ම වඩාත් ඵලදායි අවස්ථාවක් ලෙස කාර්යබද්ධ පර්යේෂණ යොදා ගැනේ. එහෙත් කාර්යබද්ධ පර්යේෂණ සුලභ ලක්ෂණයක් ලෙස සංවර්ධන ක්ෂේත්‍රය තුළ දැකිය නොහැක. ව්‍යවහාරාත්මක පර්යේෂණ, කාර්ය පර්යේෂණ, කාර්ය මූලික පර්යේෂණ, කාර්යබද්ධ පර්යේෂණ, ක්‍රියාකාරී පර්යේෂණ, ක්‍රියා මූලික පර්යේෂණ, කාර්ය මූල්‍ය පර්යේෂණ (Action Research) යන විවිධ නම් වලින් මෙම කාර්යබද්ධ පර්යේෂණ හඳුන්වනු ලැබේ.

කාර්යබද්ධ (Action) යන වචනාර්ථයෙන්ම ගත්විට මෙහි ඇති මූලික හා වැදගත්ම අවස්ථාව වන්නේ කිසියම් සමාජ ගැටළුවක් පාදක කරගෙන පර්යේෂණ ක්‍රියාවලිය ආරම්භ වනඅතර, ඊට හවුල්වන දායකවන, අදාලවන සියළුම දෙනාගේ සහභාගිත්වයෙන් අදාල ගැටළුව සඳහාවූ විසඳුම් ක්‍රියාවලියක් ද නිර්මාණය වීමයි. එබැවින්, කාර්යබද්ධ පර්යේෂණ යන්න තවදුරටත් සරලව ප්‍රකාශ කළයුත්තේ, පර්යේෂණාත්මක සංවර්ධන වැඩපිළිවෙළක් වශයෙනි.

දිළිඳුකම මෙහි සංවර්ධන ගැටළුව ලෙස මූලිකවම පාදක කර ගැනේ. ඒ හා බැඳි පවත්නා ගෘහ කළමනාකරණයත් ස්ත්‍රී හා පුරුෂ වශයෙන් පවත්නා වර්ගීකරණයත් ඔවුන් සියළුම දෙනාගේ සමස්ත චර්යාවනුත් කෙතරම් දුරට එම පවුලේ සංවර්ධන ක්‍රියාදාමය සඳහා බලපා ඇද්ද යන්න ප්‍රායෝගිකව විග්‍රහ කර ගැනීමටත් එහි යථා ස්වභාවය පවුලේ මූලිකයන් හා

එක්ව හඳුනාගැනීමටත් මෙම ක්‍රියාදාමය තුළ මූලික වශයෙන් උත්සාහ ගැනේ. එම යථා ස්වභාවය දැකීම තුළ සිදුවන විග්‍රහය තුළින් පවුලේ සංවර්ධනය පිළිබඳ විසඳුම් ක්‍රියාවලියක් නිර්මාණය කර ගැනීමට ද උත්සාහ ගැනේ. මෙහිදී ඔවුන්ගේ දායකත්වය (සම්පත්) සාමූහිකත්වය මෙන්ම බාහිර සහාය ගලපා ගැනීම්ද සැලකිල්ලට ගැනේ. අවසන් වශයෙන් පවුල කේන්ද්‍රගත් යථාර්ථවාදී සංවර්ධන ක්‍රියාවලියක් නිර්මාණය වීම මෙම කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාවලිය තුළ දිග හැරේ.

මේ සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ගොවියපාන වැල්අද්දරගොඩ,, වැල්හේන්ගොඩ පියදිගම නැගෙනහිර,, මීපේ, යන ගම්මාන පහ තෝරාගත් අතර, එම ගම්මාන වලින් අඩු ආදායම්ලාභි පවුල් 20 බැගින් පවුල් සියයක් මෙම කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමයට දායක කරවා ගැනුනි.

පර්යේෂණ ග්‍රන්ථය පරිච්ජේද හයකින් යුක්ත වේ. පළමු පරිච්ජේදයෙන්, කාර්යබද්ධ පර්යේෂණ, දිළිඳුබව අවම කරලීමේ කාලීන සංවර්ධන වැඩසටහන්වල මූලික ස්වභාවයන්, ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය, ස්ත්‍රී පුරුෂ වර්ගීකරණයේ කාලීන මුහුණුවර යන මාතෘකා හතර යටතේ පර්යේෂණ මාතෘකාව පිළිබඳ මූලික පසුබිම් අධ්‍යයනයක් දක්වා ඇත.

දෙවන පරිච්ජේදයෙන් හඳුනාගත් ගම්මානවල මූලික ස්වභාවයන් මෙන්ම පර්යේෂණ ක්‍රියාවලියේ මූලිකයන් ලෙස සැලකෙන පවුල් සියය පිළිබඳ මූලික තොරතුරු විග්‍රහය ප්‍රකාශ වේ. නවමු ආකාරයකින් පවත්වන්නට යෙදුණු සැමියා හා බිරිඳ එක්ව දායකවූ පුහුණු වැඩමුළුව පිළිබඳ විග්‍රහයද පවුල් 25 ක කථා පුවත්ද - සැමියා හා බිරිඳ එකිනෙකා දුටු අයුරු හා පවුලේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ ගනු ලැබූ තීරණද තුන්වන පරිච්ජේදයට ඇතුලත් වේ.

සිව්වන පරිච්ජේදයේ දී පළමු පුහුණු වැඩමුළුවෙන් එළඹි නිගමනයන්ගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ආපසු හැරී බැලීමේ සමාලෝචනයක් ඇතුලත් වේ.

පස්වන පරිච්ජේදයෙන් සහාය ආයතන ගැලපුම හා ඒ යටතේ හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම පිළිබඳ තොරතුරු නිකුත් වේ. ඊට අමතර නව මසකට පසුව එම ගම්මානවල ග්‍රාමීය සංවිධානවල සිදුවූ ප්‍රගතියද ඇතුලත් වේ.

සයවන පරිච්ජේදයෙන් සමස්ත පර්යේෂණ ක්‍රියාවලිය පිළිබඳ පර්යේෂකගේ නිගමන හා යෝජනා ඇතුලත් වේ.

# පටුන


පෙරවදන I
හැඳින්වීම II-III
පටුන IV
සිතියම් ලැයිස්තුව V
වගු ලැයිස්තුව V - VI
පර්යේෂණ ක්‍රමවේදය VII - VIII

1 පරිච්ඡේදය
- ❖ කාර්යබද්ධ පර්යේෂණ 1-5
- ❖ දිළිඳුබව අවම කරලීමේ කාලීන සංවර්ධන වැඩසටහන්වල මූලික ස්වභාවයන් 5-11
- ❖ ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය 11-115
- ❖ ස්ත්‍රී පුරුෂ වර්ගීකරණයේ කාලීන මුහුණුවර 15-18

2 පරිච්ඡේදය
- ❖ හඳුනාගත් ගම්මානවල මූලික ස්වභාවයන් 19-28
- ❖ පර්යේෂණ ක්‍රියාවලියට දායකවූ පවුල් සියය පිළිබඳ මූලික තොරතුරු විග්‍රහය 29-59

3 පරිච්ඡේදය
- ❖ පවුල් සියය වෙනුවෙන් පැවැත්වූ මූලික පුහුණු වැඩමුළුව 60-67
- ❖ පවුල් පිළිබඳ ප්‍රකාශිත කථා පුවත් හා ඒ තුලින් මතු කෙරුණු අවස්ථා (පවුල් 25) 68-119
- ❖ පුහුණු වැඩමුළුවේදී සැමියා බිරිඳ එකිනෙකා දුටු අයුරු 120-126
- ❖ පළමු පුහුණු වැඩමුළුව අවසානයේ ගනු ලැබූ පොදු තීරණය 127

4 පරිච්ඡේදය
- ❖ තෙමසකට පසු පැවැත්වූ ප්‍රගති සමාලෝචන වැඩමුළුව 128-129

5 පරිච්ඡේදය
- ❖ සහාය ආයතන ගැලපුම 129-133
- ❖ හබරාදුව සහභාගිත්ව සංවර්ධන පදනම 133-148
- ❖ පවුල් සියය අයත්වන ග්‍රාමීය සංවිධානවල නව මසක ප්‍රගතිය

6 පරිච්ඡේදය
- ❖ පර්යේෂකගේ නිගමන හා යෝජනා 149-153

උපැදි
1. ගෘහ තොරතුරු විමර්ශන ආකෘතිපත්‍රය 154-169
2. ගෘහ තොරතුරු විමර්ශනය සඳහා යොදාගත් උපදෙස් පත්‍රිකාව 170
3. සැමියාගේ යහපත් චර්යාවන් හා දුබලතාවයන් ලිවීමට යොදාගත් සරල ආකෘති පත්‍රය (බිරිඳ) 171
4. බිරිඳගේ යහපත් චර්යාවන් හා දුබලතාවයන් ලිවීමට යොදාගත් ආකෘතිපත්‍රය (සැමියා) 172

## සිතියම් ලැයිස්තුව


ගොවියාපතන ග්‍රාමනිලධාරී වසම ........ 20

වැල්අද්දරගොඩ ග්‍රාමනිලධාරී වසම ........ 22

වැල්හේන්ගොඩ ග්‍රාමනිලධාරී වසම ........ 24

පියදිගම නැගෙනහිර ග්‍රාමනිලධාරී වසම ........ 26

මීපෙ ග්‍රාමනිලධාරී වසම ........ 28

හබරාදූව ඉමදූව ප්‍රා.ලේ.කොට්ඨාශ සිතියම ........ 147


## වගු ලැයිස්තුව


| වගු අංකය | වගුව | |
|---|---|---|
| 01 | පවුල් වර්ගීකරණය ගොවියාපාන | 19 |
| 02 | පවුල් වර්ගීකරණය වැල්අද්දරගොඩ | 21 |
| 03 | පවුල් වර්ගීකරණය වැල්හේන්ගොඩ | 23 |
| 04 | පවුල් වර්ගීකරණය පියදිගම නැගෙනහිර | 24 |
| 05 | පවුල් වර්ගීකරණය මීපේ | 26 |
| 06 | දුප්පතුන් පිළිබඳ ප්‍රතිශතය | 29 |
| 07 | වයස් කාණ්ඩ අනුව හා ස්ත්‍රී පුරුෂ වශයෙන් පවුල් සියයේ ජනගහනය | 30 |
| 08 | වයස් කාණ්ඩ අනුව පවුල් සියයේ ජනගහන ප්‍රතිශතය | 30 |
| 09 | නිවාස අයිතිය | 31 |
| 10 | නිවාස තත්ත්වය | 32 |
| 11 | මුළුතැන්ගෙයි ස්වභාවය | 33 |
| 12 | මුළුතැන්ගෙයි ස්වභාවය | 34 |
| 13 | වැසිකිළිවල ස්වභාවය | 34 |
| 14 | වැසිකිළි නඩත්තුව හා පරිහරණ ස්වභාවය | 35 |
| 15 | පානීය ජල සැපයුම | 36 |
| 16 | නිවසේ පවිත්‍රතාවය | 37 |
| 17 | රෝග හා ආබාධ තත්ත්වයන් | 38 |
| 18 | ප්‍රධාන ආදායම් මාර්ග | 39 |
| 19 | අතුරු ආදායම් මාර්ග | 40 |

20 ආදායම් මාර්ග නිතරවීම් - පුද්ගල ........ 4

21 ප්‍රධාන ආදායම් මාර්ග නිරතවීම් - ගෘහමූලික හැර ........ 4

22 අතුරු ආදායම් මාර්ග නිතරවීම් - ගෘහමූලික හැර ........ 4

23 ආදායම් කාණ්ඩ අනුව පවුල්වර්ගීකරණය ........ 4

24 ආදායම් කාණ්ඩ අනුව සමෘද්ධිලාභී වර්ගීකරණය ........ 4

25 ඉඩම් අයිතිය (හිමිකම) ........ 4

26 ඉඩම් ප්‍රමාණය (හිමිකම) ........ 4

27 ඉඩම්වල හිතානුකූල ස්වභාවය ........ 4

28 වැඩිහිටියන්ගේ නිමාවූ අධ්‍යාපන මට්ටම ........ 4

29 ඉතුරුම් හා ණය ක්‍රියාවලියේ පවුල් දායකත්වය ........ 4

30 පවුල් සාමාජික ඉතුරුම් ගිණුම් ........ 4

31 ණය ලබාගත් ආයතන සංඛ්‍යාව - පවුල් ........

32 ණය හා පොලී වාරික ගෙවීම් සඳහා පවුල්වල මාසික වෙන්කිරීම් ප්‍රමාණයන් ........

33 ණයලාභී පවුල් ඉදිරියට ගෙවියයුතු මුදල් ප්‍රමාණයන් කාණ්ඩ වශයෙන් ........

34 ඉතුරුම් ක්‍රියාවලියට දායක වූ පවුල් 84 - ඉතුරුම් තත්ත්වයන් ........

35 ඉතුරුම් ගිණුම් හිමියන් වර්ගීකරණය ........

36 ආහාරපාන සඳහා වියදම් කාණ්ඩ වශයෙන් ........

37 මත්පැන්, දුම්වැටි හා බුලත්විට් සඳහා වියදම් කාණ්ඩ පවුල් වශයෙන් ........

38 පාරිභෝගික ද්‍රව්‍ය ලබාගැනීම - කාලවකවානු ........

39 පාරිභෝගික ද්‍රව්‍ය ලබාගන්නා ස්ථාන ........

40 ගෘහභාණ්ඩ අයිතිය ........

41 ප්‍රජා සංවිධාන දායකත්වය ........

42 ප්‍රගති සමාලෝචන - ප්‍රගතිය ලැබූ පවුල් ........

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමය සඳහා යොදාගනු ලැබූ ක්‍රමවේදය වඩාත් ප්‍රායෝගික ක්‍රමරටාවන් ඔස්සේ මෙන්ම සරල උපාය මාර්ගයන් තුළ ගොඩනඟන්නට උත්සාහ දරා ඇත. සහභාගිත්ව සංවර්ධනය පිළිබඳ මෙන්ම ප්‍රජාව සමඟ දිගුකලක් කටයුතු කිරීමෙන් පරිචයක් ලද පිරිසක් මේ සඳහා ක්‍රියාකාරීන් ලෙස යොදා ගන්නා ලදී. පර්යේෂක වරයාට අමතරව සහාය පර්යේෂකයන් දෙපලක්ද ක්ෂෙත්‍ර සහායකවරුන් පස් දෙනෙකුද යොදා ගන්නා ලදී. විශේෂයෙන් කාර්යබද්ධ පර්යේෂණයේ මූලික කටයුතු මෙන්ම ඉදිරියට විකාශය වන සංවර්ධන ක්‍රියාවලිය සඳහා මෙම ක්ෂෙත්‍ර සහායක වරුන්ගේ මඟපෙන්වීම් වැදගත් කොට සැලකේ. සමාජ පර්යේෂණ පිළිබඳ න්‍යායාත්මක ක්‍රමවේදයන් කෙරෙහි ආදානග්‍රාහී නැඹුරුවක් නොවූවද ඒවායෙන් උකහා ගතයුතු ඇතැම් දෑ සුදුසු පරිදි ක්‍රමවේදය තුළ රඳවා තබන්නට කටයුතු කර ඇත. එයින් උත්සාහ දරණු ලැබූයේ කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමයේ ප්‍රායෝගික සිද්ධි මාලාව තුළින් නව සම්ප්‍රදායක් මෙන්ම නව ක්‍රමවේදයක් නිර්මාණය වෙනු ඇතැයි යන විශ්වාසය මේ සඳහා පදනම් කර ගැනීමයි.

ක්ෂෙත්‍ර සහායකයන් ගම්මානවල දිළිඳු පවුල් හමුවීමෙන් පසු ඔවුන් හා එක්ව කරනු ලබන සුහද කථාබහක ප්‍රතිඵලයක් ලෙස තමන්ගේ පවුල පිළිබඳ කථාබහ කරන එක්දින වැඩමුළුවකට සැමියාටත් බිරිඳටත් ක්ෂෙත්‍ර සහායක විසින් ආරාධනා කර ඇත. මෙම එක්දින වැඩමුළුවට සැමියා හා බිරිඳ එක්ව සහභාගිවීම ඔවුන්ගේ ගෘහ ජීවිතයේ පළමු අවස්ථාව වීම මෙහි පවත්නා විශේෂත්වයයි. එනිසාම ඒ තුළ කිසියම් ආකර්ශනීය බවක් මෙන්ම ප්‍රහසනයක් උද්‍යෝගයක් නිරායාසයෙන්ම රැඳී පැවතුනි. එය වැඩමුළුවක් වූවද ඉතා සරලව සැහැල්ලුව සිදුවූ කථාබහක් පිළිබඳ වූ ගලායාමකි. සහභාගිවූවන්ගේ පවුල්වල අභ්‍යන්තරික ගැටළු පිළිබඳව ඉතා ගැඹුරින් තවත් එබඳුම පිරිසක් සමඟ අදහස් හුවමාරු කර ගැනීමේ වැදගත් අවස්ථාවක් බවට පුහුණු වැඩමුළුව පත්ව තිබුණි. මෙම විවෘත භාවය කාර්යබද්ධ පර්යේෂණයේ ඉදිරි කටයුතු සඳහා ඉතා ශක්තිමත් මෙන්ම යෝග්‍ය පසුබිම් නිර්මාණයක් විය.

පවුල් පිළිබඳ මූලික තොරතුරු පද්ධතියක් ගොඩනඟා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් තුළින් දත්ත සපයා ගැනීමේ අවශ්‍යතාවය පැවති බැවින් ප්‍රශ්නාවලිය සඳහා විෂය මාතෘකාවන් මෙන්ම අනුමාතෘකාන් කවරේද යන්න මූලික පුහුණු වැඩමුළුවේදී හඳුනා ගන්නා ලදී. ඉන් පසු ප්‍රශ්නාවලිය නිර්මාණය කරන ලදී. ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරලීම සඳහා එම පවුල් සමඟ කථාබහක යෙදුණු ක්ෂෙත්‍ර සහායකට සත්‍යමවූ දත්ත ලබාගැනීමට පෙර පැවති වැඩමුළුවේ විවෘත භාවය වැදගත් අනුග්‍රහයක් වූබව ප්‍රකටවම දක්නට ලැබුණි. එනිසාම මෙහිදී යොදාගනු

ලැබූ ප්‍රශ්නාවලිය පළමු පුහුණු වැඩමුළුවේදී ප්‍රකාශිත හා සාකච්ඡා කරනු ලැබූ කරුණු සම්පි
කිරීමක් ව්‍යුහගත කිරීමක් වශයෙන් දැක්විය යුතුය.

මේ අනුව යොදාගනු ලැබූ පර්යේෂණ ක්‍රමවේදයේ පදනම පළමු පුහුණු වැඩමුළු
හැඳින්වීම ඉතා යෝග්‍ය වේ. ඒ වටා ඒමත අනෙකුත් සියළුම අවස්ථාවන් නිර්මාණය වි
විවාහයෙන් ඇරඹෙන ඔවුන්ගේ යුග දිවියත් එහි ආරම්භය ඉතා සුවදායක එකක්
අනුක්‍රමයෙන් විවිධාකාරවූ සම්බාධක වලින් පිරුණු අනපේක්ෂිත කටුක දිවියකට අවතීර්
අයුරුත්, තමන්ට පැවරී ඇති සමාජ වගකීම සඳහා තම පවුලවෙතින් ඉටුවිය යුතු
සඳහා ශක්තියක් නොමැති වීමත්, ඒ මත සිදුවන පසුතැවිල්ල හා දුක් දොම්නස් ස්
සමාලෝචනය කරලීමට පුහුණු වැඩමුළුව තුළ පුහුණුලාභින් වශයෙන් ඉදිරිපත්වූ බිරින්ද,වර
සැමියන්ටත් හැකියාව ලැබුණි.

මේ තුළ ගෘහ කළමණාකරණ ක්‍රියාවලිය, පවුල් සංවර්ධන වැඩපිළිවෙල එහි
අංග එම අංගවල පවත්නා ඌණතාවයත්, ඒ සඳහා බලපා ඇති හේතු මතුවී ඇති සං
ගැටළු, ඒවායේ ස්වභාවයන් ක්ෂණිකව තම පවුලටම විසදාගතහැකි ගැටළු, බාහිර ස
අවශ්‍යවන ගැටළු, මේ සියළු කටයුතු සඳහා පවුලේ සැමියා හා බිරිඳ වශයෙන් ප
වගකීම් හා දැනට ඒවායේ නිරතවී සිටින අන්දමත් විවෘත ස්වභාවයකින් මෙන්ම සංවේදී
බහ කරන්නට මෙම පවුල් මූලිකයන් පෙළඹුණි. පවුල තුල පවත්නා ඇතැම් සිද්ධීන් 
පවත්නා අඩු අවධානයද මෙහිදී හඳුනා ගන්නා ලදී. එනිසා පුහුණු වැඩමුළුව අවසානයේ
කිපයක් ගනු ලැබුණි. තෙමසකට පසු පැවැත්වූ සමාලෝචන වැඩමුළුවෙන් පළමු වැඩ
නියමිත යෝජනා ක්‍රියාත්මක කළ අන්දමින් නැවත කළයුත්තේ කුමක්ද යන්නත් පැහැදිලි
හඳුනා ගන්නා ලදී. විශේෂයෙන් මෙහිදී පවුල් - පවුල් වශයෙන් සාමූහිකව එක්ව ස
කිරීමේ අවශ්‍යතාවය හා වැදගත් කමත් බැහැර සම්පත් සහාය ලබාගැනීමට එය බෙ
ඉවහල් වන වගත්, හේතු සාධක මත රැඳී සිට අවබෝධ කරගන්නා ලදී. මෙම පර්
ග්‍රන්ථය සඳහා මාස දහයක කාලයක් ගතවූ බැවින් පළමු වැඩමුළුවෙන් මාස 9 කට පසු
ක්ෂෙත්‍ර සහායිකාව මඟින් අදාල ග්‍රාමීය සංවිධානවල ප්‍රගතිය විමසිල්ලට ලක් කෙරුණි.
ග්‍රන්ථයට ඇතුලත් කරන ලදී. එනිසාම මෙම කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාවලියේ පළමු
තෙමසකින් හිමාවූවද වසරකට පසු කෙරෙන පසුවිල ඇගයීමකින් තවත් බොහෝ ක්‍රමෝ
ක්‍රියාකාරකම් ඔස්සේ හඳුනාගත හැකි බව විශ්වාස කෙරේ. වසරකට පසු පසුවිල (In
ඇගයුමක් කරනු ලැබූවද විශේෂයෙන් ආයතන බද්ධ ක්ෂෙත්‍ර සහායකයන් පස්දෙනෙකු
ඇති බැවින්, මාසිකව මෙම හඳුනාගත් පවුල්වල සිදුවන සංවර්ධන ක්‍රියාවලියත් ඒ 
පවුල් සාමාජිකයන්ගෙත් මූලිකයන්ගේත් චර්යාවේ සිදුවන වෙනස්වීම් මෙන්ම භෞතිකව
කරගන්නා දැ පිළිබඳවත් විමර්ශනයක නිරත වෙමින් සහාය වෙමින් පසුවීම ඔවුන්ගේ කාර්ය
ලෙස මෙම ක්‍රමවේදය තුළ රැඳී පවතී.

# පළමුවන පරිච්ඡේදය
# කාර්යබද්ධ පර්යේෂණ

කිසියම් සේවාවකින් හෝ නිෂ්පාදනයකින් තමන්ගේ පැවැත්මටත් සමාජ පැවැත්මටත් දායකවීම මානව වර්ගයාගේ මූලික ස්වභාවයයි. මෙම මූලික ස්වභාවය විවිධ වැඩසටහන්, ව්‍යාපෘතීන්, වෘත්තීන්, කාර්යයන්, වශයෙන් පවත්වාගෙන යාමට පුද්ගල කුසලතාවයන් හා රුචි අරුචිකම් මත එකිනෙකා වර්ගීකරණය වී සිටිති. මූලික අවශ්‍යතා පිරිමසාලීමට අවශ්‍ය දෑ මෙන්ම ද්විතියික අවශ්‍යතාවයන්ගෙන් ඔබ්බටද ඇතැම් දෑ නිෂ්පාදන හා සේවාවන් වශයෙන් සමාජගත කිරීමට මිනිස් වර්ගයාට හැකි වී තිබේ.

ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක් තමන්ට හිමි කාර්යයන් උපරිම අන්දමින් නිමකර ලීම සඳහා අරමුණු කරනු ලැබුවද එය ඒ අයුරින්ම සිදු නොවන වග ප්‍රකට කරුණකි. කාර්යබද්ධ පර්යේෂණ තුළින් උත්සාහගනු ලබන්නේ ඕනෑම ක්‍රියාදාමයක් වඩාත් සාර්ථක අන්දමින් ප්‍රතිඵල ලබාදෙන ක්‍රියාදාමයක් බවට පත්කර ලීමටය. සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් මෙය වැදගත් කොට සැලකේ. සමාජ පර්යේෂණ වලට උප විෂයක් වශයෙන් නිර්මාණය වූ කාර්යබද්ධ පර්යේෂණ සංවර්ධන ක්‍රියාවලිය හරහා සළකා බැලූ විට අපේක්ෂිත අරමුණු එපරිද්දෙන්ම ඉටුකර ගැනීම සඳහා වඩාත් උචිත පර්යේෂණ ක්‍රමවේදයකි.

එමෙන්ම සමාජ පර්යේෂණ ක්‍රියාදාමය හා සළකා බැලූවිට සංවර්ධන ක්‍රියාවලිය හා එහි පවත්නා විබද්ධ තාවය නිම කිරීම සඳහා වන ඌණ පූරණයක් ලෙසද කාර්යබද්ධ පර්යේෂණ හඳුන්වාලිය හැකිය. ප්‍රකට සමාජ විද්‍යාඥයෙකු වන ජේඅඑලියට් (1991) කාර්යබද්ධ පර්යේෂණ පිළිබඳ සිය කෘතියෙන් මේ පිළිබඳ පියවරයන් හතක් දක්වා ඇත.

## පළමු පියවර

කිසියම් ප්‍රශ්නයකට, ගැටළුවකට හෝ අර්බුදයකට මුහුණපා සිටින පිරිස විසින් එය මැනවින් හඳුනාගැනීම පළමු පියවර ලෙස සලකනු ලැබේ. මෙය ගවේෂණාත්මක හඳුනාගැනීමකි. එනිසා මෙමගැටළුව විසඳා නොගතහොත් සිදුවන සමාජ හා පුද්ගල බලපෑම අහිතකර ස්වභාවය මෙම හඳුනාගැනීම තුළ ගැබ්ව ඇත. තමන්ට හිමිවියයුතු යහපත් ස්ථානයක් තමන් දැනට සිටිනා අයහපත් ස්ථානයත් පිලිබඳ පුද්ගලයා අවබෝධමත් වීම මේ තුළ පවත්නා විශේෂ ස්වභාවයයි. එනිසාම එහි ප්‍රතිඵලයක් ලෙස දෙවන පියවර නිර්මාණය වේ.

## දෙවන පියවර

අදාල ගැටළුවට දායකවූවන් විසින්ම එය විසඳාගැනීම සඳහා වන වැඩපිළිවෙලක් සැලසුම් කරනු ලබයි. මෙහි විශේෂත්වය වන්නේ බැහැරින් කුමන සහායක් ලබාගනු ලැබුවද ගැටළුවට බඳුන් වී සිටින පිරිස විසින්ම මෙම වැඩපිළිවෙල සැලසුම් කිරීමයි.

## තෙවන පියවර

තෙවන පියවර වන්නේ සැලසුම්කළ වැඩපිළිවෙල ක්‍රියාවට නැංවීමයි. එහිද විශේෂත්වය වන්නේ ඊට භාජනය වූ පුද්ගලයන් විසින්ම එය ක්‍රියාවට නැංවීමයි.

## සිව්වන පියවර

ක්‍රියාත්මක වන ක්‍රියාවලියේ ස්වභාවය නිරීක්ෂණය කිරීම, හා සොයා බැලීම, සිව්වන පියවර වශයෙන් සැලකේ. එහිද විශේෂත්වය වන්නේ අදාල පිරිස විසින්ම ඒ පිළිබඳ සොයා බැලීමයි.

## පස්වන පියවර

ක්‍රියාත්මක ක්‍රියාදාමය විපරම් කිරීමෙන් නිරීක්ෂණය කිරීමෙන් ලද ප්‍රතිඵල මත ක්‍රියාදාමයේ සාර්ථක අසාර්ථක භාවය මැන බැලීම සිදුවේ. ඇතැම්විට අදාල ගැටළුව පූර්ණ වශයෙන්ම හෝ කිසියම් කොටසක් විසඳී තිබියහැක. ඇතැම් විට අපේක්ෂිත විසඳුම් ඒ අයුරින් ලැබී තිබිය නොහැක. මෙම ස්වභාවයන් සැලකිල්ලට ගෙන සයවන අදියර ක්‍රියාත්මක කෙරේ.

## සයවන අදියර

ගැටළු විසඳී නොමැතිනම් හෝ කොටසක් විසැඳී ඇත්නම් නැවත සංශෝධිත ප්‍රතිකාර්ය සැලසුමක් සකස් කිරීම සයවන අදියරේදී සිදුවේ. ආරම්භයේ සකස්කළ සැලසුමේ ඉවත් කළයුතු සංශෝධනය කළයුතු කොටස් පිළිබඳවද මෙහිදී අවධානය යොමු කෙරේ.

## සත්වන අදියර

සකස්කළ නව සැලැස්ම ක්‍රියාත්මක කිරීම සත්වන අදියරේදී සිදුවේ. සත්වන අදියර මෙම ක්‍රියාදාමයේ නිමාවම නොවේ. මෙම අදියර තුළින් නිර්මාණය වූ සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ක්‍රියාත්මක වේ. එම ක්‍රියාවලියද ගවේෂණාත්මක හුරුව මත ක්‍රියාත්මක වන අතර, අවශ්‍ය පරිදි යොදාගන්නා ඕනෑම කාලපරිච්ඡේදයක් තුළ කාර්යබද්ධ පර්යේෂණ වැඩපිළිවෙල තුළින් සොයාගන්නා දෑ සලකා බැලියහැක.

මෙම අදියරයන් පිළිබඳ සළකා බලනවිට පෙනී යන්නේ කිසියම් සංවර්ධන ක්‍රියාදාමයක් අරමුණුගත කෙරුණු අන්දමින් ප්‍රතිඵල ලබාගැනීම සඳහා කාර්යබද්ධ පර්යේෂණ ක්‍රමය භාවිතා කළහැකි බවයි. සංවර්ධන ක්ෂේත්‍රය තුළ / කාර්යබද්ධ පර්යේෂණ / එතරම් ප්‍රචලිත විෂය ධාරාවක් නොවේ. මේ පිළිබඳ ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රකට අත්දැකීමක් ලෙස 1978 ආරම්භ කොට ක්‍රියාත්මක කරන ලද විපර්යකාරක වැඩසටහන හඳුන්වාලිය හැකිය. එම වැඩසටහන හඳුන්වනු ලැබුයේ ග්‍රාමසංවර්ධනය පිළිබඳ කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහනක් (Action Research and Training Programme for the Rural Development) වශයෙනි. විශේෂයෙන් මෙම කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන අප මෙහි දක්වාලූ කාර්යබද්ධ පර්යේෂණ වැඩසටහනකින් අපේක්ෂිත ප්‍රතිඵල ශ්‍රී ලංකා සංවර්ධන ඉතිහාසයට එක් කිරීමට සමත්වී ඇත. ගතවූ වසර 23 ක කාලපරිච්ඡේදය පිළිබඳ සලකා බැලූවිට ග්‍රාමසංවර්ධනය ප්‍රජා සංවර්ධනය මෙන්මප සමාජ සංවර්ධනය පිළිබඳව ද නව ප්‍රවේශයක් නිර්මාණය කිරීමට මෙම වැඩසටහන සමත් වී ඇත. කුඩා කණ්ඩායම් ක්‍රමය කේන්ද්‍රකොටගත් නව ප්‍රජා සංවිධාන ක්‍රම රටාවක් බිහිවීමත් ඒ තුළින් දිළිඳු ප්‍රජාව එතෙක් බාහිරයන් සතුව පැවති තමන්ගේ සංවර්ධනය පිළිබඳ වගකීම තමන් වෙත පවරාගෙන කටයුතු කිරීමත් මෙහි මූලික ලක්ෂණයක්ව පවතී. විශේෂයෙන් දිළිඳු ප්‍රජාව කිසිවක් නොදන්නා කිසිවක් කරගත නොහැකි පිරිසක් ලෙසට ගොඩනැඟී තිබූ සම්ප්‍රදාය බිඳදමා ප්‍රජාව අවබෝධයෙන් යුතුව සාමූහික වීම තුළ (යථාර්ථවාදී ප්‍රජා සහභාගිත්වය) දිළිඳු ප්‍රජාවගේ සැඟවී පවත්නා ශක්තීන් ප්‍රබෝධනය වී, අකර්මණ්‍යවූවන් සක්‍රිය වී ඔවුන් සතු සුළු සම්පත් ප්‍රමාණයන් ඒකරාශි කොට සංවර්ධන ක්‍රියාවලියක ආරම්භය නිර්මාණය කළහැකිය යන්න විපර්යකාරක කාර්යබද්ධ පර්යේෂණය තුළින් සංවර්ධන ක්ෂේත්‍රය වෙත හිමිකර දී ඇත. මේ තුළින් සහභාධාර සංවර්ධන ප්‍රවේශය ප්‍රජාව වෙත ගොඩනඟා තිබූ දීන මානසිකය අහෝසිවී තමන් කෙරෙහි විශ්වාසයක් ඇති කරගත් ප්‍රජාව තමන්ගේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීමට මෙන්ම පුළුල් කර ගැනීමටත් බාහිර ආධාර යොදාගැනීමේ නව ක්‍රමය හඳුනාගෙන ඇත. මේ අයුරින් බාහිර සම්පත් හා සේවාවන් ගලපා ගැනීමෙන් තමන් ගොඩනැඟූ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් පෝෂණය කරගන්නා ප්‍රජාව සමාජගත වීම නිරායාසයෙන් සිදුවන්නක් බව විපර්යකාරක වැඩසටහන පසක්කර දී ඇත.

දිළිඳු ප්‍රජාව වශයෙන් දිගුකලක් තිස්සේ නම්කර,, කොන්කර, වෙන්කර තැබූ ප්‍රජා කණ්ඩායම මෙසේ සංවර්ධන ප්‍රවාහය වෙත අවතීර්ණය වීම අවසානයේ සාධාරණ සමාජයක් බිහිකිරීම සඳහා වන / තීරණ ගැනීමේ / අයිතිය හිමිකර ගැනීම දක්වා දිවයන්නක් බව විපර්යකාරක ක්‍රමවේදය වෙතින් ප්‍රකාශිතය මින් ගම්‍ය වන්නේ / දූප්පතුන් දූප්පතුන් නොව / පවත්නා සමාජ ආර්ථික බලවේග මගින් ඔවුන් අකර්මණ්‍ය කොට සමාජ වරප්‍රසාද අහිමිවූවන් බවට පත්කර ඇති බවය. මෙම සමාජ යථාර්ථය අදාල පුද්ගලයන් විසින්ම තෙරුම් ගන්නා

නිසා මෙය පුද්ගල චින්තන පෙරලියක් ලෙසද සඳහන් කරනු ලැබේ. එනිසාම මෙ
විද්‍යාත්මක ක්‍රියාවලියකි.

අනුක්‍රමයෙන් පවුල මුල්කරගත් සංවර්ධන ක්‍රියාවලිය ප්‍රජා කණ්ඩායම තුළ පුළුල් 
ජාලයක් හරහා සමස්ත සමාජය ග්‍රහණය කරන නිසා මෙය සමාජ විද්‍යාත්මක ක්‍රියා
ලෙසද සලකනු ලැබේ.

එමෙන්ම සහභාගිත්ව සංවර්ධන පුහුණු ක්‍රමවේදය ප්‍රචලිත කරලීම සඳහාද විපර්
පුහුණු ක්‍රමවේදය ඉමහත් කාර්ය භාරයක් ඉටුකර ඇත. සංවර්ධන ක්ෂේත්‍රය තුළ බහු
පුහුණු වැඩසටහන් වර්තමානයේ මෙම ක්‍රමවේදය (සහභාගිත්ව පුහුණු ක්‍රමවේදය) ගල
සිටී. දිළිඳු ප්‍රජාව තමන් සතුව පවත්නා දැනුම, ආකල්ප හා කුසලතා වල ඇතිකර
වෙනස මෙම දැවැන්ත සංවර්ධන ක්‍රියාවලිය නිර්මාණය කරන්නට හේතුවන වග විපර්
වැඩසටහන හඳුන්වාදුන් සහභාගිත්ව (ද්විපාර්ශවීය) සංවර්ධන පුහුණු ක්‍රමවේදයේ හර
රැඳී පවතී. එනිසාම අද එය සංවර්ධන ක්ෂේත්‍රයේ බොහොමයක් පුහුණු වැඩසටහ
ව්‍යුහාත්මක හා ගුණාත්මක වෙනස සඳහා ගලපාගෙන සිටී. සමාජ සජීවීකරණ විෂය
ලෙස පසුකාලීනව නවීකරණය වී සංවර්ධන ක්ෂේත්‍රයට අවතීර්ණය වන්නේද මෙම විපර්
ක්‍රමවේදයයි. සංවර්ධන ක්ෂේත්‍රය තුළ මෙබඳු දැවැන්ත පෙරළියක් ඇතිකර ලීම සඳහා 
විපර්යකාරක කාර්යබද්ධ පුහුණු හා පර්යේෂණ වැඩසටහන වර්තමානයේ බහුතරයක් රා
රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම දේශීය විදේශීය ආධාර යොදාගන්නා සංවර්ධන ව්‍යාප
සකද ක්‍රමවේදයක් ලෙස භාවිතා වෙමින් පවතී. පර්යේෂණ අත්දැකීම් සමුදායක් අත්ප
දුන්නාක් මෙන්ම සංවර්ධන ක්‍රියාවලියක්ද නිර්මාණය කරලීමට මෙම කාර්යබද්ධ වැඩ
සමත්වී ඇත./ කාර්යබද්ධ පර්යේෂණ / ක්‍රමවේදය සංවර්ධන වැඩසටහනක් සඳහා ගල
අවශ්‍යතාවය අවබෝධ කරලීම සඳහා විපර්යකාරක කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාවලිය
උදාහරණයක්ව පවතී.

බොහොමයක් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීමෙන් පසු ප්‍රජාවට හිමිකර
ප්‍රතිඵල පිළිබඳ සලකා බලනවිට කාර්යබද්ධ පර්යේෂණ ක්‍රියාදාමය කාලීනව අත්‍යාවශ්‍ය
සේ සැලකිය හැකිය. විශේෂයෙන් දිළිඳු ප්‍රජාව කේන්ද්‍රකොටගෙන ක්‍රියාත්මක වන බොහෙ
වැඩසටහන් ප්‍රජාව තුළ දැකිය හැකි ප්‍රතිඵල (මතුපිට මුහුණත) මුල්කරගෙන ව්‍යාපෘති
ගනිමින් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම ප්‍රජාව එහි වගකීම බාරගන්නාවාට වඩා බාහිරයන්
වගකීමද දරනු ලැබේ. උදාහරණයක් ලෙස විවිධ ග්‍රාමීය ණය වැඩසටහන් ආදායම්වර්ධක/නිෂ්
වැඩසටහන් සුබසාධක වැඩසටහන් යටිතල පහසුකම් සැපයීමේ වැඩසටහන් ආදිය හඳුන්
හැකිය. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මූලික වශයෙන් පාදකවූ බලපෑ


සාධකයන් ( හේතුඵල සබඳතාවන් ) සොයා බැලීම හා අදාල පුද්ගලයන් විසින් එම ක්‍රියාදාමය තුළ නිරතවීම සාම්ප්‍රදායික සංවර්ධන වැඩසටහන්වල දැකිය නොහැකිය. මෙම තත්ත්වය යටතේ මෙම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළ අවාසිදායක කරුණු ගණනාවක් සිදුවේ.

දැවැන්ත සම්පත් නාස්තිය
අපේක්ෂිත අරමුණු ඉටුනොවීම.
අදාල ප්‍රජාව කලකිරීමට හා අසීරුවට පත්වීම.
ප්‍රජාව වෙනත් සංවර්ධන වැඩසටහන් කෙරෙහි වුවද යොමුකරවීමේ අපහසුතාව
කිසියම් ශුභවාදී සංවර්ධන ක්‍රමවේදයක් නිර්මාණය නොවීම.
ඇතැම්විට ප්‍රජාව සතු හා බාහිර සම්පත් යොදාගත් නිසා මූලද්‍රව්‍ය වශයෙන් සිදුවන පිරිවැය සංසරණයන් නිසා පොදුවේ මිල මට්ටම් ඉහළයාම,
ආදායම් විෂමතාවය වර්ධනය වීම.
ප්‍රජාව අතර අර්බුද / විකෘතින් ඇතිවීම.
ප්‍රජාව හා සංවර්ධන වැඩකරුවන් / ආයතන අතර මතභේද හා දුරස්ථ වීම් ඇතිවීම.

මෙබඳු දුබලතා රැසකින් සංවර්ධන වැඩසටහන් මහහරවා ගැනීම සඳහා යෙදිය හැකි ප්‍රබල උපාය මාර්ගයක් ලෙස කාර්බද්ධ පර්යේෂණ හඳුන්වාලිය හැකියි. මේ නිසා ජේ.එලියිට් / කිසියම් ක්‍රියාදාමයක් ඉතා සියුම්ව හා ගැඹුරින් හේතුඵල සබඳතා සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක කිරීම කාර්යබද්ධ පර්යේෂණ ලෙස හඳුන්වා ඇත.

## දිළිඳුබව අවම කරලීමේ කාලීන සංවර්ධන වැඩසටහන්වල මූලික ස්වභාවයන්

ජීවත්වීම සඳහා වන මූලික අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේ අපහසුතාවයන්ට ලක්වූවන් දිළිඳු පිරිස වශයෙන් සැලකේ. මෙම පිරිස නැවත දිළින්දන් හා අන්ත දිළින්දන් වශයෙන් කොටස් දෙකකට වර්ගකර දැක්වේ. අන්ත දිළින්දන් වශයෙන් සලකනු ලබන්නේ තමන් උපයන මුළු ආදායම් ප්‍රමාණයම යෙදැවත් එමඟින් සිරුරට අවශ්‍ය කැලරි ප්‍රමාණය ලබාගත නොහැකි පිරිස වන අතර, තමන් උපයන ආදායමෙන් 80% ක් යෙදූවත් සිරුරට අවශ්‍ය කැලරි ප්‍රමාණය ලබාගත නොහැකි පිරිස දිළින්දන් වශයෙන් සැලකේ. අවම ආදායම් තත්ත්වය මත මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමේ අපහසුතාව ඉස්මතු වනවිට එය ආර්ථික දිළිඳුබව වශයෙන් තහවුරු වනවා පමණක් නොව ඒ මතින් සමාජ දිළිඳුබවද නිර්මාණය වේ.




ඉහත ස්වභාවය මත දිළිඳුබව සමාජ සංසිද්ධියක් වශයෙන් මෙන්ම සමාජ ගැටළුවක් වශයෙන්
ප්‍රකාශ වේ. ඉතා සරලව සලකනු ලැබුවහොත් ආහාරපාන හිඟකම, නිවාස පහසුකම් නිසි පරි
නොමැතිකම ප්‍රමාණවත් ඇඳුම් පැළඳුම් නොමැතිකම, අධ්‍යාපන ක්‍රියාවලිය අඩාලවීම, සෞඛ
පිළිබඳ දුර්වල තත්ත්වයන් හා අපහසුතා නිසා එක් පිරිසක් තවත් පිරිසකගෙන් වෙන්වී සිටී
වෙන්කර ඇත. කොන්වී සිටිති. කොන්කර ඇත. ආදායම අඩුකම මූලික හේතු සාධකය වුව
ඒමඟින් ගොඩනැඟුණු මූලික අවශ්‍යතාවයන් ඉටුවීමේ දුර්වල, දුක්ඛදායක ස්වරූපය නි
ගොඩනැඟුණු සමාජ දිළිඳුබව ඉතා දැඩිලෙස සමාජ ව්‍යුහය ග්‍රහණය කරගෙන සිටී. දිළිඳුබ
පිළිබඳ සංස්කෘතිය නිර්මාණය වන්නේද මෙම සමාජ දිළිඳුබව තුළිනි. සමාජ දිළිඳුබව ලෙ
භෞතික ක්‍රියාදාමය තුළ රැඳී සිටිනවා පමණක් නොව චක්‍රිය ලෙස නැවත ආර්ථික දිළිඳුබව ද
පුද්ගලයා රඳවා තැබීම සඳහාද ක්‍රියාත්මක වේ. සංවර්ධන ප්‍රවාහයට දිළිඳු ප්‍රජාවට එක්වන්
ඉඩනොදී අයිතිවාසිකම් දිනාගන්නට ඉඩ නොදී කටයුතු කරන්නේද මෙම සමාජ දිළිඳු භාව

දිළිඳුබව අවම කරලීමේ බහුතරයක් සංවර්ධන වැඩසටහන් නිර්මාණය වන්නේ භෞතිකව හඳුනාගන්නා සමාජ ව්‍යුහය තුළින් මතුපිට ප්‍රකටව පවත්නා දිළිඳුබව හා බැඳුණු හේතු සාධකයන් නොව ඉන්මතුවූ ඵලයන් පදනම් කර ගෙනය. ආහාරපාන හිඟ නිසා ඒ සඳහා සලාකයක් හෝ සහනාධාරයක් සැපයීම, නිවාස නොමැති බැවින් නිවාස ඉදිකර දීම, ඇඳුම් පැළඳුම් හිඟ නිසා ඒවා ලබාදීම, අඩාලවූ අධ්‍යාපනය සඳහා අවශ්‍ය දෑ ලබාදීම සෞඛ්‍ය අපහසුකම් මඟහරවාලීම, ආදි වශයෙන් භෞතික හඳුනාගැනීම් සඳහා භෞතික වශයෙන්ම මූල්‍යමය හෝ ද්‍රව්‍යමය වශයෙන් සැපයීම් තුළින් සහාය වීම මෙහි ප්‍රචලිත ලක්ෂණය වේ.

මෙබඳු දිළිඳුබව අවම කරලීම සඳහා වන සංවර්ධන වැඩසටහන් වලින් දිගුකාලීන පැවැත්ම පිළිබඳ ප්‍රතිඵල අපේක්ෂා කළහැකිද යන්න විමසා බැලිය යුතුය. නිවසක් නොමැති අයෙකුට නිවසක් සපයාදීමේදී ඔහු අපහසුවට පත්ව සිටින්නේ නිවසක් ඉදිකර නොගන්නේ ඔහු සතු ආර්ථික නොහැකියාව මතය. එය හුදෙක් නිවස සඳහා පමණක් බලපාන්නක් නොව ඔහු වටා ඔහුගේ පවුල තුළ පවත්නා සෙසු මූලික අවශ්‍යතා සඳහාද බලපා ඇත. එනිසා එරින් වර ඔහුගේ පවුල තුල ආහාරපාන හිඟකම, ඇඳුම් පැලඳුම් හිඟකම, අධ්‍යාපන කටයුතු පිළිබඳ අපහසුතා සෞඛ්‍ය අපහසුතා ආදි වශයෙන් මූලික අවශ්‍යතා පිළිබඳ ගැටළු ඉස්මතු වෙමින් එම පවුල අසීරුවට පත්කරනු ලබයි. එහිදී එක් අවස්ථාවක පවුලේ කුසගින්න ඉස්මතුවී ආවිට නිවස තුල ඔහුට සැනසිල්ල ලබාගත නොහැක. එහි යමක් අලෙවි කළහැකි නම් ඔහු කුසගින්න සඳහා එය සිදුකරනු ඇත. තත්ත්වය මෙසේ පවතිද්දී නිවස පිළිබඳ නඩත්තුවක් ඉදිරි සංවර්ධනයක් කිසිසේත් අපේක්ෂා කළ නොහැක. එබැවින් මූලික අවශ්‍යතා අපහසුව පිළිබඳ වන ඍජු සැපයීම් ක්‍රමය දිළිඳුබව අවම කරනවාට වඩා ප්‍රකාශ කළයුත්තේ දිළිඳුබව පවත්වාගෙන යාම සඳහා ක්‍රියාත්මක වන්නක් වශයෙනි.

අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳවද සලකා බලනවිට මෙම තත්ත්වය මැනැවින් ප්‍රකට වේ. 90 දශකය පිළිබඳ සලකා බැලූවිට බහුතරයක් පාසැල් සඳහා ගොඩනැගිලි, විද්‍යාගාර පහසුකම්, පරිඝනක පහසුකම් වෙනත් මෙවලම් ලබාදීම හා පහසුකම් සැලසීම ඉතා ප්‍රකට අවදියක්ව පැවතුනි. ගොඩනැගිල්ලක් ඉඳි නොවූ පාසැලක් සොයා ගැනීම ඉතා අපහසු කාර්යයක්ද විය. මේ අතර පාසැල් පොත් සැපයීම හා වාර්ෂික නිල ඇඳුම් සැපයීමද දිගටම සිදු කෙරුනි. සෑම ජාතික අයවැයකින්ම 4% - 6% අතර මූල්‍ය ප්‍රතිපාදන අධ්‍යාපනයට වෙන්කෙරුනි.

එහෙත් පාසැල් හැරයාමේ ප්‍රවනතාවය පහත සඳහන් පරිදි වර්ධනය වී ඇත.

| | | |
|---|---|---|
| 1999 | - | 12% |
| 2000 | - | 18% |
| 2001 | - | 20% |

මේ අතර, 2001 ජුනි වනවිට ගම්බද පාසැල් 531 ක් වසා දැමුණි. මෙයින් අධ්‍යාපනය අඩාල වන්නේ කවුරුන්ගේද යන්න විමසිය යුත්තකි. ඒ අතර විදේශිය ණය / ආධාර යටතේ විවිධ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක විය. කෙසේ වෙතත් මෙම ඍජු සැපයීම් ක්‍රමය තුළ අදාල ගැටළුවේ මූලික ස්වභාවයන්ට පිළිතුරු ලැබෙනවාද යන්න නැවත සිතා බැලිය යුත්තකි. ඍජු සැපයීම් ක්‍රමය පූර්ණ වශයෙන් ප්‍රතික්ෂෙප නොකළ යුත්තකි. එහෙත් එහිදී සලකා බැලියයුතු හා ගලපාගතයුතු තවත් මූලික සාධකයන් ඇද්ද යන්න නැවතත් සොයා බැලිය යුත්තේ අපේක්ෂිත ප්‍රතිඵල ඒ අයුරින්ම නොලැබෙන බැවිනි.

පසුගිය දශක දෙකක කාලය තුල ක්‍රියාත්මක වූ දිළිඳුබව අවම කරලීමේ වැඩසටහන්වල සුවිශේෂතාවයක් දක්නට ලැබුණි. ඒ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය ගලපා ගැනීමයි. එහෙත් මෙම දශක දෙක අවසානයේ අපේක්ෂිත ප්‍රතිඵල ලැබුණාද යන්න නැවත සලකා බැලිය යුතුව ඇත. මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වන මුහුණතට යොදනු ලබන සැපයීම් ප්‍රතිකාර ක්‍රමය වෙනුවට ආදායම් වර්ධනය පිළිබඳ අවධානය යොමුවූ අතර, එහිදීද ප්‍රජාවගේ ඉතුරුම් හා සාමූහික ණය ගනුදෙනු ක්‍රමයක් තුලින් ප්‍රජා මූලික මූල්‍ය ක්‍රියාවලියක් නිර්මාණය වීම විශේෂත්වයකි. ගතවූ කාලවකවානුව පිළිබඳ සලකා බලනවිට පෙරට වඩා මෙයින් කිසියම් ප්‍රතිඵලයක් දිළිඳු ප්‍රජාව ලබා ඇත. එහෙත් එයද සලකා බැලිය යුත්තේ දිගුකාලීනව දිළිඳු ප්‍රජාව තුල කුමක් ජනිත කරන්නේද යන්නයි. බංගල්දේශයේ මහාචාර්ය යුනුස් විසින් සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය ද ගලපා ගනිමින් දිළිඳු ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද / ග්‍රාමීන් බැන්ක් / වැඩසටහන සාර්ක් රටවල පමණක් නොව අපරදිග රටවලද ප්‍රචලිත වූ දිළිඳුබව අවම කරලීම සඳහා වූ අති සාර්ථක වැඩසටහනක් ලෙස පිළිගැනුණි. එහෙත් 1999 වසරේ මේ පිළිබඳ විමර්ශනයක යෙදුණු රීඩ්ස් ඩයිජස්ට් සඟරාව ප්‍රකාශ කළේ / ග්‍රාමීන් බැන්ක් / වැඩසටහන දිළිඳුබව අවම කරලීම සඳහා නොව තාවකාලිකව දිළින්දන්ගේ කුසගිනි නිවීම සඳහා ප්‍රබල පිටුවහලක් වූ බවයි.

සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය හරහා නිර්මාණය වුවද මෙම ප්‍රජාමූලික මූල්‍ය ක්‍රියාවලියේ භාවිතය හා හරය අතර පරස්පර විරෝධි ස්වභාවයක් පවතී. වෙනත් විධියකින් කියතොත් මෙම ක්‍රමවේදය දිළිඳු ප්‍රජාව වෙතට නිසි පරිදි ගෙන යාහැකි ගලපා ලියහැකි ප්‍රජාව තුල ක්‍රියාත්මක වියහැකි සජිවීකරුවන් (මැදිහත්කරුවන්, විපර්යකාරකයන්) බිහිවූවාද යන්න සැක සහිතය. එනිසා නොදැනුවත්වම මෙම මූල්‍ය ක්‍රියාවලිය තුලින්ද සාම්ප්‍රදායික අංග ලක්ෂණ ප්‍රකට කෙරුණි. සංකල්පිය වශයෙන් නව ඉතුරුම් හා ණය ක්‍රියාවලිය තුලින් නව ආයෝජන රටාවක් දිළිඳු ප්‍රජාව තුල බිහිවීමෙන් සිදුවන ආදායම් වර්ධනය තුලින් මූලික අවශ්‍යතා සපුරා ගැනීම පෙර පැවති ක්‍රමයට වඩා අර්ථවත්ය යන්න වාදයට තුඩු දෙන්නක් නොවේ.

එහෙත් විශේෂයෙන් ණය සැපයුම තුල අපේක්‍ෂා කළ ගැඹුරුබව දක්නට නොහැකි විය. දිළිඳු පුද්ගලයා සතු යථා ස්වභාවය ණය ක්‍රියාවලිය සඳහා හෙළිදරව් කර ගැනීමට බොහෝ ණය වැඩසටහන් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩකරුවන්ට නොහැකි විය. ණයලාභියාගේ සත්‍යවාදී මානසිකය හෙළිදරව් නොවූ නිසා කුමන මාතෘකාවක් යටතේ ණය ලැබුවත් තමන්ට පෞද්ගලික වූ න්‍යාය පත්‍රයකට අනුව ණය භාවිතා කරන්නට පුද්ගලයා පෙළඹීම ස්වභාවික අවස්ථාවක් විය. මේ නිසා ණය ලබාදී ආයෝජන ක්‍රියාවලිය ශක්තිමත් කොට ආදායම් වර්ධනය තුලින් මූලික අවශ්‍යතා පිළිබඳ ක්‍රියාවලිය ශක්තිමත් කොට පවුලේ සංවර්ධනයක් අපේක්‍ෂා කරනු ලැබුවත්, එම ප්‍රතිඵලය නොලැබුණා පමණක් නොව භාවිතය පිළිබඳ ගැටළුව තුලින් අනපේක්‍ෂිත විකෘතීන් රැසක්ද මතු කෙරුණි. මෙය කොතරම් උග්‍රවීද යත් දිළිඳු ප්‍රජාව සඳහා වන ඇතැම් ණය වැඩසටහන් වලදී ක්‍රියාකාරීන්ට නීතිමය පිළිසරණ පැතීමට පවා සිදුවී ඇති අවස්ථාවන්ද දැන් ප්‍රකට වෙමින් පවතී.

මෙයින් ගම්‍ය වන්නේ දිළිඳුබව හා බැඳුණු මතුපිට ප්‍රතිඵල මත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම එතරම් ප්‍රතිඵලදායී නොවන වගයි. විශේෂයෙන් ඕනෑම භෞතික සාධකයක් හා බැඳුණු ගැඹුරු හේතුසාධක සොයාබලා පුද්ගලයාට අභ්‍යන්තරික වශයෙන් විවෘත වන්නට ඉඩගැර සංවර්ධන ක්‍රියාවලිය හා බද්ධ වන්නට ඉඩකඩ සැලසීම වඩා ඵලදායී වන වග මෙම අසතුටුදායක තත්ත්වය තුලින් පසක් කරගතයුතු වේ.

බාහිර සහනාධාරද දිළිඳුබව තුරන් කරලීමේ සංවර්ධන වැඩසටහන්වල මූලික සාධකයක්ව පවතී. දිගුකලක් මේ පිළිබඳ ලැබූ හුරුව නිසා දිළිඳු ප්‍රජාව තුල ගොඩනැඟී ඇති දීන මානසිකය එතරම් මවිත වියයුත්තක්ද නොවේ. එහෙත් බහුතරයක් සංවර්ධන වැඩකරුවන් තුල පවතින සහනාධාර නොමැතිව දිළින්දන් සඳහා කිසිවක් කළ නොහැක යන ආකල්පය මවිත වියයුතු අවස්ථාවකි.

අප පෙර සඳහන් කළ සමාජ දූප්පත්කම ඇසුරින් නිර්මාණය වූ දිළිඳුබවේ සංස්කෘතිය තුල දූප්පතුන් සතුව කිසිවක් නැත. ඔවුන්ට කිසිවක් කළ නොහැක යන ආකල්පය බහුතරයක් සංවර්ධන වැඩකරුවන් තුලද ගැබ්ගෙන ඇත. ග්‍රහණය වී ඇත. දිළිඳු ප්‍රජාව වෙත දිළිඳුබව අවම කරලීම සඳහා සංවර්ධන ප්‍රයත්නයක නියැලීමට කටයුතු කරන සංවර්ධන වැඩකරු මූලික වශයෙන් ඔහු සතු ආකල්පයන් වෙනසකට භාජනය කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. ඉන් අනතුරුව ඔහුට දිළිඳු ප්‍රජාව සතු සාවද්‍ය ආකල්ප වෙනස්වන අන්දමේ සංවර්ධන ක්‍රියාවලියක් නිර්මාණය කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

ඉන්දියාවේ Peedith ආයතනය නිර්මාණය කළ දාසගුප්ත මහාචාර්ය වරයාගේ එක් කියමනක් වූයේ දිළින්දන් දිළිදන් නොවේ යන්නයි. එතුමා අදහස් කළේ දිළිඳු ප්‍රජාව සතු සම්පත් කන්දරාවක් පවතින වගය. ඒවා භෞතික හා මානව සම්පත් වශයෙන් වර්ග කෙරේ.

ඉඩම්, මුදල්, ද්‍රව්‍ය උපකරණ ආදී භෞතික සම්පත් සුළු ප්‍රමාණයක් තිබියදීත් ඒවා නැත යනුවෙන් සමාජ දිළිඳුබව තුල හංවඩු ගසා ඇත. දැනුම, හැකියාවන්, අත්දැකීම්, පළපුරුද්ද ශ්‍රමය ආදිය විසිරී අක්‍රමණ්‍යව පැවතීම නොහැකියාව වශයෙන් හඳුන්වා ඇත. සිදුවී ඇත්තේ සමාජ දිළිඳුභාවය තුල පවත්නා සාම්ප්‍රදායික පිළිගැනීම සහ සමස්ත සමාජයේ සමාජ ආර්ථික බලවේග තුලින් දිළිඳුබව පිළිබඳ මෙම නිර්වචනයන් ප්‍රකාශ වී ඇති බවය.

දිළිඳුබව අවම කරලීම සඳහා වන දිගුකාලීන සංවර්ධන අත්දැකීම් වලින් පසක් වී ඇත්තේ දිළිඳු ප්‍රජාව වෙනුවෙන් පටන්ගත් සංවර්ධන ක්‍රියාදාමයන් වඩා සාර්ථක වන්නේ ඔවුන්ගේ සම්පත් ආරම්භක ශක්තිය වශයෙන් යොදාගතහොත් පමණි. ඒ තුලින් මතුවන ප්‍රජාවගේ සක්‍රිය බව, තමන්ගේ බව, දැනුවත් බව, ඉදිරි දැක්ම. ආදී කිසිදු ගුණාංගයක් බාහිර සම්පත් සංවර්ධන ක්‍රියාවලියේ ආරම්භයට යොදාගත් විට අපේක්ෂා කළනොහැකි බවට සංවර්ධන ඉතිහාසය පුරා දහස් ගණන් උදාහරණ පවතී. එහෙත් දිළිඳු ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාදාමය ශක්තිමත් කිරීමට, ඉක්මන් කිරීමට හා පුළුල් කිරීමට බාහිර සම්පත් දෙවනුව හෝ සුදුසු අවස්ථාවක යොදා ගැනීම යෝග්‍ය බව සංවර්ධන ඉතිහාසය තුල උදාහරණ වලින් ද සනාථ වී ඇත.

මූලික අවශ්‍යතා සපුරාගැනීම පිළිබඳ අපහසුතාව ගැන කෙරෙන විග්‍රහයකදී දැකිය හැකි ඉතා තාර්කික සිද්ධිය නම් මෙම අවශ්‍යතාවයන් එකිනෙකට බද්ධ වූ ඒකාබද්ධ ක්‍රියදාමයක් වශයෙන් පවතින වගයි. සෞඛ්‍ය. අධ්‍යාපන, නිවාස, ඇඳුම් පැළඳුම්, ආහාරපාන ආදී වශයෙන් වර්ග කරනු ලැබුවද එහි යථාර්ථය තුල එසේ වෙන් කොට දැකිය නොහැක. ඒ සෑම අවස්ථාවක්ම එකිනෙකට සම්බන්ධය (Inter Relation Ships) එකිනෙක මත යැපෙන (Inter Deperdencic) ස්වභාවයක් ද එහි පවතී.

එහෙත් සම්ප්‍රදාය තුල එක් අංශයක් සඳහා වෙන්වූ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීම සුලභවූ අවස්ථාවකි. එසේ ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් වලද අන්තර්ගතය විමර්ශනය කර බලන්නේ නම් ඒ තුල අප සඳහන් කරන ඒකාබද්ධතාවයට අදාල විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වේ. උදාරහණයක් වශයෙන් නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වනවිට ඊට අදාල අනු ක්‍රියාකාරකම් වශයෙන් ගෙවතු වගා, සෞඛ්‍ය වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන්, ආදායම් වර්ධක වැඩසටහන්, පෝෂණ වැඩසටහන් වශයෙන් ක්‍රියාත්මක වේ. මෙයින් ගම්‍යවන්නේ එක් අවශ්‍යතාවයක් පදනම් කරගත් එක් විෂයක් හුදකලාව සංවර්ධන ක්‍රියාවලියට ගලපාලීම ප්‍රායෝගික නොවන බවය. එමෙන්ම දිළිඳු ප්‍රජාව සම්බන්ධයෙන් සලකා බැලූවිට දිගුකාලීන ප්‍රතිඵල අත්පත් කර ගැනීමටද ඒ තුලින් නොහැකි වගය. ඇතැම්විට හුදකලාව ලබාගන්නට උත්සාහ දරණ ලබාගත් ප්‍රතිඵල අනෙක් සංවර්ධන ගැටළුව නිසා ප්‍රතිඵල රහිතවූවක් බවට පත්වීමටද ඇති අවකාශය ඉතා විශාලය.

බැහැරින් සිට සමස්තය සැලකිල්ලට ගෙන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද කාලීන සංවර්ධන ක්‍රියාදාමයන් තුල දැකිය හැක. ගම, දිළිඳුබව, ආදායම් වර්ධනය, ණය වැඩසටහන්, සෞඛ්‍ය, පෝෂණ, අධ්‍යාපන, ආදී විවිධ විෂය අනුමාතෘකාවන් ඔස්සේ මෙම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. පවුල හරහා සමාජ ගතවී සිටින පුද්ගලයාට එම සංවර්ධන ක්‍රියාදාමයන් බෙහෙවින්ම ආගන්තුකය. සමාජගත සබඳතාවයන් නිසා හෝ නීතිමය වශයෙන් අනිවාර්ය වන නිසා පුද්ගලයා මේ සඳහා දායක වේ. එහෙත් ඔහුට ඔහුගේ පවුලට සෘජුවම බලපවත්නා ගැටළුව පිළිබඳ විග්‍රහයක යෙදුණේ නම් ඔහුගේ පවුලේ පෞද්ගලික න්‍යාය පත්‍රයේ සඳහන් ප්‍රමුඛතා ගතකිරීම මෙම බාහිර සංවර්ධන වැඩසටහන නොවන්නට ඉඩ තිබිණි. මේ තත්ත්වය යටතේ ඔහුගේ / පවුලේ සංවර්ධන අවශ්‍යතාවයන් සහ බාහිර ක්‍රියාකාරීන්ගේ අරමුණු එකිනෙක ගැටී පැවතීම ස්වභාවික අවස්ථාවක් බවට පත්වේ. සංවර්ධන ප්‍රයත්නයේ අවසන් අරමුණ හා ගලපා බැලූවිට එය ඉටු නොවනවා පමණක් නොව සම්පත් නාස්තියක් ද නිතැතින්ම සිදුවේ. එමෙන්ම බාහිර සංවර්ධන උපාය මාර්ගයන් පිළිබඳ ප්‍රජා විශ්වාසයද බිඳවැටේ. ඇතැම්විට සංවර්ධන විකෘතීන් බිහිවන අතර, ප්‍රජාව තුල පවතින සමඟි සමාදානයන් ද පළුදුවීමට මෙබඳු සංවර්ධන වැඩසටහන් හේතුවී ඇති වගට උදාහරණ සොයා ගැනීම ඉතා පහසු කාර්යයක් වී ඇත.

## ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන ක්‍රියාවලිය

පවුල් - අධ්‍යාපන - ආර්ථික - දේශපාලන - ආගමික - නීතිය හා සිරිත් යන සංස්ථාවල ඒකාබද්ධතාවයෙන් සමාජ ව්‍යුහය නිර්මාණය වී ඇත. මෙම සැකැස්ම තුල මූලික සාධක දෙකක් විද්‍යමානව පවතී. එනම් සෑම සංස්ථාවක්ම සෑම සංස්ථාවක් සමඟම අන්තර් සබඳතාවකින් ... යුක්ත වීම ඉන් එක් සාධකයකි. අනෙක් සාධකය නම් සෑම සංස්ථාවක්ම සෑම සංස්ථාවක් මත යැපීමයි. ... මෙම සමාජ මූලධර්මය පිළිබඳ සලකා බලනවිට එය ක්‍රියාවට පරිවර්තනය වන්නේ සමාජ පිවියා වශයෙන් සැලකෙන පුද්ගලයා තුලිනි. පුද්ගලයාගේ මූලික සංස්ථාව පවුල් සංස්ථාවයි. ඔහු අනෙකුත් සියළුම සංස්ථාවන් සමඟ අන්තර් සබඳතා පවත්වන්නේත් ඒ මත යැපෙන්නෙත් පවුල් සංස්ථාව කේන්ද්‍ර ස්ථානය කරගෙනය. එනිසාම අනෙකුත් සියළුම සංස්ථාවන් වඩාත් කාර්යක්‍ෂමව සමාජ පැවැත්ම සඳහා යොමු කරලීමට ඒ තුල පවතින කළමනාකරණ ක්‍රියාවලිය හේතුවන්නාක් මෙන් පවුල් කළමනාකරණ ක්‍රියාවලියද මෙම සංස්ථාවන් හා එක්ව සමාජ ව්‍යුහයේ පැවැත්ම තහවුරු කරන්නකි.

සමාජ ව්‍යුහයේ සංස්ථාවන් තුල මෙබඳු යහපත් කළමනාකරණ ක්‍රියාවලියක් පිළිබඳ සාකච්ඡා කෙරුණද එහි හරය හා භාවිතය අතර සමානතා මෙන්ම අසමානතාද පවතී. මෙහිදී පවුල් සංස්ථාවේ පවුල් ඒකකය පිළිබඳ සළකා බැලූවිට එහි කළමනාකරණ ක්‍රියාවලිය ස්වභාවිකව නිර්මාණය වන්නක් ලෙස සැලකේ. එබැවින්, ඒ පිළිබඳ කිසියම් විද්‍යාත්මක ගැලපුමක් ගැන අවධානය යොමු නොකෙරේ. එහෙත් සමාජ නවීකරණය පිළිබඳ එළඹුමත්, අනුකරනය මත සමාජය ඉදිරියට ගලයාමේ ස්වභාවයත්, පුද්ගලයා තුළ ගොඩනැඟී ඇති පාරිභෝගික චින්තනය පිළිබඳ නැමියාවත් පසුබිම් වශයෙන් සළකා බලනවිට පවුල් ඒකකයේ කළමනාකරණ ක්‍රියාවලියේ ස්වභාවික පැවැත්ම ප්‍රමාණවත් නොවන බව ඒ පිළිබඳ විමර්ශනයක යෙදෙනවිට හඳුනාගත හැකිය. එබැවින්, පවුල් ඒකකයේ කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ විද්‍යාත්මක හැදෑරීමක් මෙන්ම ක්‍රියාත්මක වීමක්ද අවශ්‍ය යුගයකට අප අවතීරණය වී සිටින්නෙමු. සමාජ ව්‍යුහයේ පද්ධති වලත් කුඩා උප ශාඛාවන් තුළත් මිනිසා කිසියම් සේවාවක හෝ නිෂ්පාදනයක නියැලී සිටී. මිනිසා නිෂ්පාදනය කරන බොහෝ දේ මිනිසාගේ මූලික හා ද්විතියික අවශ්‍යතාවයන් සඳහා වේ. ඇතැම් විට ඉන් ඔබ්බට ගිය නිෂ්පාදනයන් ද විශ්වීය ලෙස සළකා බැලූවිට නැතුවා නොවේ. එහෙත් මූලික හා ද්විතියක අවශ්‍යතාවයන් බහුතරය පුද්ගලයා පරිහරණය කරන්නේ ඔහුගේ පවුල් ඒකකය තුළය. එමෙන්ම තම වර්ගයා සමාජගත කිරීමේ උත්තරීතර වගකීමද දරා සිටින්නේ පවුල් ඒකකය තුළය. එනිසා එහි කළමනාකරණ ක්‍රියාවලියක් නොපැවතීම සමාජව්‍යුහයේ මූලධර්මයන් ඔස්සේ (අන්තර් සබඳතා, අන්තර් යැපීම) සළකා බැලූවිට සමස්ත සමාජයේම බිඳ වැටීමට හේතුවීම වළක්වාලිය නොහැකිය.

දිළිඳුබව අවම කරලීම සඳහා වන සංවර්ධන වැඩසටහන් පිළිබඳ සළකා බලන විට මෙම පවුල් කළමනාකරණ ක්‍රියාවලිය අත්‍යාවශ්‍යම අවස්ථාවක් වශයෙන් සඳහන් කළහැකිය. දිළිඳුබව අවම කරලීම සඳහා රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් ප්‍රජා සංවිධාන දරණ උත්සාහයන් මෙන්ම ඒ වෙනුවෙන් යොදවන සම්පත් ප්‍රමාණය පිළිබඳ සලකා බැලූවිට ඊට සමානුපාතිකව දිළිඳුබව අවමනොවීම ප්‍රකට කරුණකි. දිළිඳුබව අවම කරලීමේ බහුතරයක් සංවර්ධන වැඩසටහන් පවුල් ඒකකය වෙත හඳුන්වා දෙනු ලබන්නේ සමස්තයක් වශයෙනි. එහෙත් එක් එක් පවුල පිළිබඳ සලකා බැලූවිට විශේෂයෙන් මතු පිටට නොදැක්වෙන සැමියා හා බිරිඳ මෙන්ම පවුලේ සාමාජිකයින්ට සීමාවූ සංවර්ධන ගැටළු මෙන්ම අවශ්‍යතා පෞද්ගලික වශයෙන් පවුල තුළ වැසී පවතී. එමෙන්ම සංවර්ධන අවශ්‍යතාවයන්ගේ ස්වරූපය ද පවුලෙන් පවුලට වෙනස් වියහැකිය. ඇතැම්විට පවුලේ ස්වභාවික කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකයා සැමියා වියහැක. තවත් තැනක බිරිඳ වියහැක. තවත් තැනක වැඩිමහලු දරුවෙකු විමටද ඉඩකඩ පවතී. එමෙන්ම ඇතැම් විට බිරිඳ පවුල් සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ දැඩි උනන්දුවකින් බැඳීමකින් කටයුතු කරන අතර, සැමියාට එබඳු හැඟීමක් නොතිබෙන්නට පුළුවන

ඇතැම්විට පවුලේ සවර්ධනය පිළිබඳ සළකා බැලුවිට සැමියා පවුලේ සංවර්ධනය අඩාල කරන්නෙකු වියහැක. මෙම ස්වරූපයම ඇතැම් බිරින්ඳෑවරුන් වෙතද පැවතිය හැක. මෙබඳු අසමානතාවයක් පවතිද්දී සමානවූ සංවර්ධන ක්‍රියාකාරකමක් පවුල් ඒකකය වෙත හඳුන්වාදී ක්‍රියාත්මක වන්නට ඉඩහැර ප්‍රතිඵල අපේක්ෂා කලද ප්‍රතිඵල නොලැබීම මවිත වියයුත්තක් නොවේ. උදාහරණය වශයෙන් ග්‍රාමීය ණය පිළිබඳ සළකා බැලිය හැක. දිළිඳු ප්‍රජාව වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට උත්සාහ දරණ බොහොමයක් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවර්ධන ආයතන දිළිඳු ප්‍රජාවට විවිධ ණය වැඩසටහන් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම සුලභ දර්ශනයකි. / ණය / ලබාගැනීම පිළිබඳ කිසියම් පහසු ක්‍රමයක් දිළිඳු ප්‍රජාවගේ සවණත වැකුණු විගස එය / ලබාගැනීම / ඔවුන් අභිමුඛකරගත් / එහි වටපිටාව, යෙදවීම, ආපසු ගෙවීම, ගෙවීමේ හැකියාව, ආදී සියළුම තොරතුරු සත්‍යද අසත්‍යද යන්නට වා තමන්ට ණය ලබාගැනීම සඳහා අවශ්‍ය වන අන්දමට ගලපා ගනී. මේ අතර ඇතැම් ණය දෙන ආයතනද ආපසු ණය ලැබීමෙන් සැහීමකට පත්වෙති. තවත් තැනෙක ණය ආපසු නොලැබෙන නිසා නීතියේ පිහිට පැතීමට යන අවස්ථාද නැතුවා නොවේ. දිළිඳුබව අවම කරලීමේ අරමුණ හා මෙසේ දකින්නට ලැබෙන ප්‍රායෝගික තත්ත්වයන් එකිනෙකට ගලපා බැලීම / සංවර්ධන / වැඩසටහන් පිළිබඳ යථාර්ථය මතුකර ගන්නටත් පවුලේ ක්‍රියාකාරීත්වය දැකගැනීමටත් යෝග්‍ය අවස්ථාවක් වේ. ඇතැම්විට ණය වැඩසටහන් නිසා අසීරුවට පත්වූවන් පිළිබඳ ඔවුන්ගේ යටපත්ව ඇති තොරතුරු විමසා බලන විට කුමන විෂයක් යටතේ කොන්දේසි හා පොරොන්දු යටතේ ණය ලැබුවත් තමන්ගේ පවුලේ ආවරණය වී පවතින පෞද්ගලික මූල්‍ය න්‍යායපත්‍රයේ ප්‍රමුඛතාවයට එම මුදල් වියදම් කිරීමට ණයලාභියා නිරායාසයෙන්ම පෙළඹී ඇත. ඒ සඳහා ණයලාභියාට දොස් පැවරීමට දඬුවම් ලබාදීමට වඩා සිදු කළයුතුව ඇත්තේ ණය ලබාදීමට පෙර පවුලේ මූල්‍ය ක්‍රියාවලිය පිළිබඳ පෞද්ගලික න්‍යාය පත්‍රය දැකගන්නට හැකිවන පරිදි පවුලේ වැසී ඇති කළමනාකාරීත්වය ඉස්මතු කර ගැනීමට හැකිවන පරිදි සංවර්ධන ක්‍රමෝපායන් නිර්මාණය කරගැනීමය.

බහුතරයක් දිළිඳු ගෘහ තමන්ට ලැබෙන ආදායම මෙන්ම එය වියදම් කරන ආකාරය පිළිබඳවත් හිඟය පියවා ගන්නා උපාය මාර්ගවල සුදුසු නුසුදුසු භාවයන් පිළිබඳවත් සළකා බැලීමත්, සාකච්ජා කිරීමත් සටහන් තබා ගැනීමක් දක්නට ලැබුණොත් ඒ කලාතුරකිනි. ඇතැම්විට පවුලට මාසිකව ලැබෙන ආදායම පිළිබඳ සළකා බැලුවිට එය කිසියම් සතුටුදායක මට්ටමක පවතී. එහෙත් වියදම්වල පවතින අත්‍යාවශ්‍ය - අවශ්‍ය - සාමාන්‍ය - අනවශ්‍ය ආදී වර්ගීකරණයක නිරත නොවන නිසා බහුතරයක් පවුල් මාසිකව ණයකරුවන් බවට පත්ව සිටිති. එම ණය වලින් කොටසක් පියවමින් දිගින් දිගටම මෙම ණය ක්‍රියාවලියේ රැඳී සිටී. එපමණක් නොව මේ තත්ත්වය නිසා කිසිදාක ප්‍රමාණවත් ආයෝජන ක්‍රියාවලියක නිරත වන්නට හෝ ඇතැම්විට පවුලේ

අභිවෘද්ධිය සඳහා වන ඉඩකිරීම් හෝ දරුවන්ගේ අත්‍යාවශ්‍ය කටයුතු සඳහා හෝ සිතීමටවත් නොහැකි තත්ත්වයක ඇතැම් පවුල් උදාසීනව පසුවෙති. මෙබඳු පවුල් සඳහා පැහැදිලි කළමනාකරණ ක්‍රියාවලියක් ගලපා නොගෙන මෙන්ම පවත්නා තත්ත්වය මැනවින් විග්‍රහකර නොගෙන ඵලදායි සංවර්ධන ක්‍රියාවලියක් නිර්මාණය කළ නොහැක.

ස්ත්‍රියක හා පුරුෂයෙකු විවාහවීමෙන් ඇරඹෙන පවුල් ජීවිතය පවුල් සංස්ථාවේ ආරම්භයයි. අනතුරුව ලැබෙන දූ,දරුවන්ද සමඟ ඔවුන්ගේ අවශ්‍යතාවයන්ද මුහුකරා යමින් පවුල් සංස්ථාවේ සමාජ මෙහෙවර මෝදුවන්නට පටන් ගනී. මේ සඳහා ඉටු කළයුතු ඉටු වියයුතු වගකීම් රැසකි. එය ආර්ථික ක්‍රියාදාමයට පමණක් සීමා නොවේ. ඇතැම්විට ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත්ව පැවතියද අනෙකුත් ගලපා ගතයුතු සාධක හඳුනානොගෙන ක්‍රියාත්මක වුවහොත් පවුල් සංස්ථාවේ ඇතිවන අනපේක්ෂිත විකෘතීන් සමාජ ව්‍යුහයේ අනෙකුත් සංස්ථාවන් කෙරෙහිද බලපෑමක් ඇති කරනු ලබයි.

වඩා යහපත් ගෘහ කළමනාකරණ ක්‍රියාවලියක් ගොඩනැඟීමේදී පවුලේ මූලිකයන් මෙන්ම වැඩිහිටියන් එක්ව සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම අත්‍යාවශ්‍ය වූවකි. විශේෂයෙන් දිළිඳු පවුල් පිළිබඳ සැලකීමේදී පැනනැඟී ඇති ආර්ථික අපහසුතාවයන් මත එදිනෙදා ඉපයීම් කාර්යය පිළිබඳවත්, මුහුණපා සිටින ගැටළු පිළිබඳවත් හුදකලාව දරණ උත්සාහයන් මිස එක්ව කථාබහ කිරීමක් බහුලව දැකිය නොහැක. එමෙන්ම මේ සඳහා චර්යාත්මකව පුද්ගල ගොඩනැඟීමද අත්‍යාවශ්‍ය සාධකයක්ව පවතී. ඇතැම් ගෘහමූලිකයන් තුළ පවත්නා අධිකාරී ස්වරූපය මත එබඳු කථාබහක් සඳහා යෝග්‍ය පරිසරයක් දක්නට නැත. පවුලේ සිදුවන එදිනෙදා කටයුතු පිළිබඳ ක්‍රියාවලිය ගත්විට එය අංශ ගණනාවකින් යුක්ත වේ. ඇතැම්විට ගෘහය තුළ කටයුතු මෙන්ම ගෘහයෙන් පිටත කටයුතු පිළිබඳවද සැලකූවිට ඒවායේ වගකීම් බොහෝ විට කාන්තාව වෙත හෝ කිහිපදෙනෙකු වෙත පමණක් පැවරී ඇත. වගකීම් දැරීමේ සමබරතාවයක් පැවතීම ගෘහ කළමනාකරණ ක්‍රියාවලිය සාර්ථක කරලීමේ ඉතා වැදගත් අවස්ථාවකි. ස්වභාවයෙන්ම නිර්මාණය වූ පවුලේ කටයුතු පිළිබඳ ක්‍රියාවලියේ දී ආහාරපාන සැකසීම, පිරිසිදු කිරීම්, රෙදි සේදීම්, මිලදී ගැනීම්, ජලය සැපයීම් ආදි කටයුතු පවුලේ බොහෝ දෙනෙකු වෙත පැවරීමට හැකි කාර්යයන් වන අතර, සාම්ප්‍රදායිකව එම කාර්යයන් කිහිප දෙනෙකුගේ වගකීම් බවට පත්ව ඇත. ඇතැම්විට බැලූ බැල්මට මෙම සාම්ප්‍රදායික ක්‍රියාවලිය තුළ ගැටළු සහගත තත්ත්වයන් එකවර හඳුනාගත නොහැක. කිහිපදෙනෙකු සුව පහසුවෙන් සිටිද්දී එක් අයෙකු හෝ දෙදෙනෙකු නිරන්තරයෙන් වෙහෙසිම තුළ සිදුවන කායික අපහසුතාවයන්ගේ බලපෑම ඇතැම්විට විවිධ මුහුණුවරින් පවුලේ සංවර්ධන ක්‍රියාවලියට බාධා පැමිණ වීමට ඇති ඉඩකඩ බොහෝය. ගෘහය ඇතුලත - මුළුතැන්ගෙය ගෙවත්ත පිරිසිදුබව හා අලංකාරය ගෘහ කළමනාකරණ ක්‍රියාවලියේ වැදගත් අවස්ථාවන්ය. නිවසින් පිටවී සිටින ඕනෑම සාමාජිකයෙකු හැකි ඉක්මනින්

නිවසට ආපසු කැඳවීමේ ආකර්ශනීය බවක් නිවසේ පැවතිය යුතුයි. නිවසට ආපසු පැමිණීම අප්‍රසන්න අවස්ථාවක් සේ සැලකූ විට උදා වියහැකි වෙනත් විකල්ප අවස්ථා ඇතැම්විට පවුල් ජිවිතය පවා අඩපණ කිරීමට යෙදුණ බවට බොහෝ උදාහරණ සමාජය තුළ පවති. බිරිඳට මෙන්ම සැමියාටද, දරුවන්ටද, නිවසින් බැහැර තමා නිරතව සිටින රැකියාව හෝ අධ්‍යාපනික කාර්ය නිමාකොට කුටුම්භයේ සෙසු අය හා එක්ව ලැගුම් ගැනීමට ඇති ප්‍රියජනක බව උනන්දුව පවුලේ සෙසු කටයුතු සඳහාද, දැඩි බලපෑමක් එල්ල කරනු ලබයි.

ගෘහය තුළ කළමනාකරණ ක්‍රියාවලියට ඇතුලත් වියයුතු අධ්‍යාපන ආගමික යහපත් සිරිත් විරිත් සමාජ සේවා ආදි කටයුතු පිළිබඳ පවත්නා අවධානය ප්‍රමාණවත් නොවීම කුටුම්භයට පෞද්ගලිකවත් සෙසු සමාජ සංස්ථාවන්ට පොදුවේත් බලපෑම් එල්ල කරනු ලබයි. ගෘහ කළමනාකරණ ක්‍රියාවලියක් නිර්මාණය කිරීමේදී එහි අවශ්‍යතාවය එසේ කළමනාකරණ ක්‍රියාවලියක් නොමැති විට පවුලට සිදුවන බලපෑම, සමාජ ජිවියෙකු ලෙස පුද්ගල වගකීම් ඉටු කිරීමට නොහැකිවීම ආදි කරුණු පිළිබඳ අවබෝධමත් බවක් තිබියයුතු වේ. එමෙන්ම එය න්‍යායාත්මක බවකට වඩා ප්‍රායෝගික ක්‍රියාදාමයක් ලෙස හඳුනාගත යුතුවේ.

විශේෂයෙන් වසර ගණනක් ගෙවා එකම ස්වරූපයෙන් පසුවන දිළිඳු පවුලක විවාහයෙන් ආරම්භ වන කුටුම්භ කථා පුවත විවෘත කර ගැනීම මෙබඳු කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා ඉතා යෝග්‍ය පසුබිමක් නිර්මාණය කරනු ලබයි. ඇතැම්විට දශක එකක් හෝ දෙකක් තුළ විවාහයෙන් පසු තමන් කළ කිදේ විවේචනාත්මකව හා අපක්ෂපාතිව ආපසු හැරී බැලීමට සැමියා මෙන්ම බිරිඳද, සූදානම් වියයුතුය. එය ඔවුන් නව කළමනාකරණ ක්‍රියාවලියක් සඳහා දිරිමත් කරවන අවස්ථාවක් වන්නේය. සමාජ වගකීමෙන් තමන්ට නිදහස් විය නොහැකි බව තේරුම් ගන්නා නිසා ඒ සඳහා පවත්නා ඌණතාවයන් මඟහරවා ගැනීමට නම් පවුල් කළමනාකරණ ක්‍රියාදාමයක් විවිධ අංශයන්ගෙන් පෝෂිතව පැවතිය යුතු බවත් සැමියා මෙන්ම බිරිඳද, පසක් කර ගනී.

## ස්ත්‍රී පුරුෂ වර්ගීකරණයේ කාලීන මුහුණුවර

1950 සිට 1990 දක්වා සංවර්ධන දශක පහක් එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ප්‍රකාශයට පත්කර ඇත. දශකයෙන් දශකයට සමාජයේ පවත්නා සංකීර්ණ ස්වභාවයන් හා වෙනස්වීම් සැලකිල්ලට ගෙන, මිනිස් අවශ්‍යතා වඩාත් ප්‍රශස්ත අන්දමින් සපුරාලීම සඳහා මෙම සංවර්ධන ක්ෂෙත්‍රයන් හඳුනාගෙන ඇත. ආර්ථික වර්ධන වේගය ඇති කිරීම, ධනය හා සම්පත් බෙදියාම, දරිද්‍රතාව අඩුකර ලීම/ කුසගිනි නිවීම, පාරිසරික සංවර්ධනය (තිරසර සංවර්ධනය) ආදි සමස්තයන් මෙන්ම ළමුන් පිළිබඳ වැඩිහිටියන් පිළිබඳ කාන්තාවන් පිළිබඳ සුවිශේෂ සෞඛ්‍ය ගැටළු පිළිබඳ, සාක්ෂරතාව පිළිබඳ, කර්මාන්ත හා කෘෂිකර්මය පිළිබඳ ආදි වශයෙන් නිශ්චිත

විෂයධාරාවන්ද සංවර්ධන ක්ෂේත්‍රය තුළ විමසුමට ලක්කර ඇත. 1960 දශකයේ පටන් අනුක්‍රමයෙන් කාන්තාව හා සංවර්ධනය පිළිබඳවද සාකච්ඡා වෙමින් පවතී. මේ නිසා ලෝකයේ බොහොමයක් රටවල් තමන්ගේ සංවර්ධන ප්‍රයත්නයන් තුළ මේ පිළිබඳවද සාකච්ඡා කළ අතර, ක්‍රියාකාරකම් රැසකටද අවතිර්ණය වී ඇත. පෙරදිග මෙන්ම අපර දිගත් ජාත්‍යන්තර වශයෙනුත් මේ පිළිබඳ උනන්දුවක් පැවති අතර, රාජ්‍ය අංශයෙන් මෙන්ම රාජ්‍ය නොවන සංවිධානද තමන්ගේ සංවර්ධන ක්‍රියාවලිය තුළ මෙම විෂය මාතෘකාව අන්තර් ග්‍රහණය කොට කටයුතු කරමින් සිටිති.

ගතවූ දශක හතරක පමණ කාලවකවානුවක් තුල කාන්තාව හා සංවර්ධනය පිළිබඳ කෙරුණු කථාබහ පැවැත්වූ සාකච්ඡා සම්මන්ත්‍රණ, වැඩමුළු මෙන්ම සුවිශේෂ වැඩසටහන් පිළිබඳ අවධානය යොමු කරනවිට මෙම විෂය මාතෘකාව සංවර්ධනය පිළිබඳ කුමන විෂය ධාරාවකදී වුවද අවධානය යොමු කළයුතු අනු මාතෘකාවක් බවට පත්ව ඇත. විශේෂයෙන් දිළිඳු රටවලට ආධාර සපයන ආධාර ආයතනද, එසේ ආධාර සපයන වැඩසටහන් අතර මේ සඳහා ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. මේ නිසාම රාජ්‍ය අංශය මෙන්ම රාජ්‍ය නොවන සංවිධානද සෘජුවම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවර්ධන ව්‍යාපෘති නිර්මාණය කිරීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් දැඩි උනන්දුවක් දැක්වූහ. මේ තත්ත්වය යටතේ / ස්ත්‍රී පුරුෂ සමාජභාවය / පිළිබඳ/ පුළුල් විෂය මාලාවක් ගොඩනැඟී ඇත. ස්ත්‍රිය පිළිබඳ ජීව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක යථාර්ථය නීතිය, දේශපාලනය, මානව හිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සංස්කෘතිය තුළ ස්ත්‍රිය, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රිය වෘත්තිය අවස්ථාවන් තුළ ස්ත්‍රිය ස්ත්‍රියට හිමි වියයුතු සුවිශේෂ වූ වරප්‍රසාද පිළිබඳ රාජ්‍ය අවධානය ලබාගැනීම, ස්ත්‍රියට ගෘහය තුළත් බැහැරින් මුහුණපෑමට සිදුවන ප්‍රචණ්ඩත්වය ආදි වශයෙන් විවිධ අංශයන් තුළ මෙම විෂය ධාරාව පෝෂණය වී ඇත. විශේෂයෙන් පාසැල් විෂය මාලාවටද විෂය මාතෘකාවක් වශයෙන් මෙය අන්තර් ග්‍රහණය වී ඇත. ආධාර ආයතනවල නොමද අනුග්‍රහය ලද නිසා විශේෂයෙන් සංවර්ධනය පිළිබඳ පුහුණු හා පර්යේෂණ කටයුතුවල නියැලි ජාතික මට්ටමේ ආයතන ද තම ආයතනික පුහුණු විෂය තුළ මෙන්ම පර්යේෂණ විෂය ධාරාවන්ටද මෙය අන්තර් ග්‍රහනය කොට ඇත. එමෙන්ම මේ පිළිබඳ අති දක්ෂ අවබෝධමත් පුහුණු කරුවන් පිරිසක් බිහිවීම සංවර්ධන ක්ෂේත්‍රය තුළ මෙම විෂය තහවුරු කොට ක්‍රියාත්මක වීම සඳහා වන ප්‍රබල අත්වැලකි.

මේ නයින් බලන කල රාජ්‍ය අංශයේත් රාජ්‍ය නොවන අංශ වලත් මේ පිළිබඳ අවබෝධමත් නිර්මාණශීලි පිරිසක් සන්නද්ධව සිටී. විශේෂයෙන් ඔවුන් සතු න්‍යායාත්මක අවබෝධමත් බව කිසියම් ශක්තිමත් ප්‍රායෝගික ක්‍රියාදාමයක් සඳහා බෙහෙවින්ම යෝග්‍ය වූ පසුබිම් නිර්මාණයක්ව පවතී.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යාත්මක අවබෝධයෙන් යුතුව මෙබඳු තත්ත්වයක් නිර්මාණය වීම තුළ ස්ත්‍රීත්වය පිළිබඳ පමණක් කථාබහ කළ ස්ත්‍රීන්ට හෝ පුරුෂවාදීව කථාබහ කළ පුරුෂයන්ට හෝ තවදුරටත් මෙම විෂය ධාරාව තුල රැඳී සිටීමට පවතින ඉඩකඩ සම්පූර්ණයෙන්ම වැසී ඇත. ඇතැම්විට ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ මේ පිළිබඳ කීර්තියක් දිනාගත් පරිචයක් ලද පුහුණුකරුවන් අතර, පුරුෂයන් මෙන්ම ස්ත්‍රීන්ද සිටීම මෙම ක්‍රියාදාමයේ හරවත් බව සඳහා හේතු සාධකයක් වී ඇත.

මෙම ශුභවාදී දැක්ම තුල නැවත වරක් ආපසු හැරී බැලීම යුක්ති යුක්ත වන්නේය. වර්තමානයේ මෙම විෂය ක්ෂෙත්‍රය තුළ වඩාත් ප්‍රබලව සිදුවන්නේ අවබෝධමත් පිරිස් විසින් තවත් පහල පිරිසකට න්‍යායාත්මක දැනුම ලබාදීමට කටයුතු කිරීමයි. එය ගම් මට්ටම හා පවුල් මට්ටම දක්වා ඇතැම් ආයතනවල පහලම තලය දක්වාත් සිදුවෙමින් පවතී. මේ අතර මාධ්‍යමය වශයෙන් වූ ක්‍රියාකාරකම් ගණනාවක්ද සිදුවෙමින් පවතී. එමෙන්ම රාජ්‍ය අංශයට කරන බලපෑම් තුළ ඇතැම් අයිතිවාසිකම් හා ඉල්ලීම් දිනාගැනීමටද බලපෑම් කිරීමටද මෙම ක්‍රියාදාමය තුළ ඉඩකඩ ලැබී ඇත.

මීට අමතරව කාන්තාව මුහුණපා සිටින විශේෂයෙන් දිළිඳු කාන්තාවන් මුහුණපා සිටින ගැටළු පිළිබඳ ඍජු ක්‍රියා කාරී අවධානයක් තාමත් මෙම විද්‍යාර්ථීන් වෙතින් යොමු වී නැත. ඒ සඳහා පුහුණු, සම්මන්ත්‍රණ, සාකච්ඡා මාධ්‍ය වැඩසටහන් කොඩිදින රැස්වීම් ප්‍රමාණවත් නොවේ. බොහෝවිට එහිදී නෙත ගැටෙන්නේ ගැටළුවල මුහුණත ස්වභාවයයි. ගැටළුවල හේතු සාධක එකවර අපට හඳුනාගත නොහැක. අප පිළියම් සෙවිය යුත්තේ එම හේතු සාධකයන් මැනවින් හඳුනාගෙන ඒ සඳහාය. විශේෂයෙන් දිළිඳු පවුල්වල කාන්තාවන් දැඩි සමාජ අසාධාරණයකට ලක්ව සිටී. බහුතරයක් දිළිඳු කාන්තාවන් පවුලේ සියළු බර තම උරහිසමත රඳවා ගෙන සිටී. කායික වශයෙන් පමණක් නොව මානසික වශයෙන්ද ඇයට සහනයක් නැත. බොහෝවිට ඇතැම් විවාහක පුරුෂයන් වෙතින් ඇයට එල්ලවන පීඩනය සුළු පටු නොවේ. ඒ සියල්ල මැද ඇය මෙම පවුල් ඒකකය පවත්වාගෙන යාමට වෙර දැරිය යුතුය. ග්‍රාමීය අංශයේ දිළිඳුකම පිටුදැකීමේ ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන් වල නියැලී සිටින පිරිසෙන් 90% ක් කාන්තාවන්ය. ඇයගේ සකසුරුවම, අරපිරිමැස්ම, ඉපයීම, කිසිවෙකුගේ අවධානයට සැලකිල්ලට පාත්‍ර නොවේ. ඇතැම් විට සැමියාගේ මත්පැන් පානයට හා සූදුවටද මුදල් ඉපයීම ඇගේ කාර්යයක් බවට පත්ව ඇත. ගේදොර ඉඳිකිරීම්, දරුවන් සමාජගත කිරීම සඳහා වන සියළු කටයුතු ඇයගේ පූර්ණ වගකීම බවට පත්ව ඇත. බොහොමයක් දිළිඳු පවුල්වල කාන්තාවන්ට විවාහයට පෙර සිහින මැවූ සුන්දර සිහින ලොව සැබෑ කරගන්නට නොහැකි වී ඇත.

දිළිඳුබව හිසමත තබාගත් කාන්තාවන් 65% ක් මැදපෙරදිගින් උපයන්නට ගියත් ආපසු පැමිණි පසු මෙයින් තම පවුල් ඒකකයද විනාශ කරගන්නා කාන්තාවන් සංඛ්‍යාව 89% කි. තමා දුකසේ ඉපයූ මුදල් පමණක් නොව තම සැමියාද, දූ,දරුවන්ද අහිමිවී සියදිවි හානිකර ගන්නා කාන්තාවන්ගේ සංඛ්‍යාව ඉහළ නැඟෙමින් පවතී.

අප මෙසේ සඳහන් කරන්නේ ජනගහනයේ හරි අඩක් පිළිබඳවය. එනම් රජය ප්‍රකාශ කරන පරිදි ජනගහනයෙන් 51% ක් පිළිබඳවයි. (දූප්පතුන්) ස්ත්‍රිය හා පුරුෂයා පිළිබඳ සමාජගත වීම ඇරඹෙන්නේ විවාහය නිසා ගොඩනැඟෙන පවුල් ඒකකය තුළිනි. ඔවුන් අප වෙත විවෘත නොකරන සමාජයෙන් වසාගෙන සිටින අනන්තවූ දුක් දොම්නස් වලින් පිරුණු කටුක ජීවිතයක් බොහෝ කාන්තාවන්ට දිළිඳුබව තුළ හිමිව ඇත. මේ තත්ත්වය යටතේ ඇය සමාන ආත්ම භාවයකින් සමාජගත වීමට නම් ඇය මුහුණපා සිටින පවුලේ සංවර්ධන ගැටළුවල යථා ස්වභාවය අප දතයුතුව ඇත. ඒවායේ හේතු කවරේද යන්න හඳුනාගත යුතුය. ඒවාට පිළියම් යෙදිය යුතුය. මේවා කථාබහ කළයුත්තේද ඇය සමඟ පමණක් නොව, සැමියාද මේ සඳහා අනිවාර්යයෙන් දායක කරවා ගතයුතුය. පවුලේ සංවර්ධන ගැටළු කාන්තාව සමඟ පමණක් විසඳන්නට උත්සාහ දැරීම ඇයගේ / සමාජ / වරප්‍රසාදවලට කාන්තා අයිතීන්ට කරනු ලබන සාවද්‍ය බලපෑමකි. බැහැරින් අප හඳුන්වාදෙන සංවර්ධන ප්‍රයත්නයන්ගේ වගකීම ඇය දරණ අතර, ඇයට ප්‍රතිලාභ සඳහා ලැබෙන හිමිකම ඉතා අල්ප වියහැක. එසේත් නැත්නම් නැතිවන්නට ඉඩකඩ ඇත. එනිසා අප ඇයගේ සමාජභාවය හුදකලා ආරක්ෂා කරන්නට උත්සාහ දැරිය යුතු නොවේ. එය ස්වාමි පුරුෂයාගේද වගකීමක් බවට පත්කළයුතුය. මෙබඳු පරිසරයක් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය දිළිඳුබව අවමර කරලීමේ වැඩසටහන් සඳහා ඉතා කාලෝචිත විෂය ධාරාවකි. එහි ගැලපුම පවුලේ යථා ස්වභාවය හඳුනාගෙන ප්‍රායෝගිකව සිදුවියයුත්තකි. එසේ සිදුවන විට ස්ත්‍රිය හා පුරුෂයා අතරද ගැටුම්කාරී තත්ත්වයක් උද්ගත නොවනු ඇත. මෙයින් අපේක්ෂා කරනේනේ මෙතෙක් මෙහෙයවුන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ හුදකලා දැනුම පහලට තල්ලුකර ගැනීමේ ක්‍රමය වෙනුවට ඉතා පහල පවුල් තුළින් කාන්තාව මුල්කරගත් ගැටළු වලට විසඳුම් සපයා ගැනීමට සහාය වෙමින් පුරුෂයා හා දරුවන් සමඟ එක්ව පවුල් ඒකකය ශක්තිමත් කොට සමාජගත වන්නට අවකාශ සැලසීමයි. ඒතුල ඇගේ සමාජභාවය ආරක්ෂා වනු ඇත. ඇයටද සමාජ ජීවියෙකු ලෙස සමාජයේ හැසිරීමට පිවත්වීමට ඉඩකඩ ලැබෙනු ඇත. මෙහිදී සිදුවන්නේ ස්ත්‍රී හෝ පුරුෂ වර්ගීකරනයකින් තොරව දෙපිරිසම අවබෝධමත් වීමයි. ගැටුම් හා කලහකාරී බවක්ද එහි නොපවතී.

## දෙවැනි පරිච්ඡේදය

## හඳුනාගත් ගම්මානවල මූලික ස්වභාවයන්.

### ගොවියපාන.


ගාලු - මාතර මහා මාර්ගයට මායිම්ව පිහිටි ගොවියපාන ගම්මානය හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුහුදුබඩ ගම්මානයකි. බෝගහ අසල, ගොඩැල්ල වත්ත, දිවලවත්ත වශයෙන් ගොඩමණ්ඩි තුනකින් ගම්මානය සැකසී ඇත. දිගු කලක පටන් ගමතුළ පැවති හුණුගල් හැරීමේ කර්මාන්තය නිමාවෙමින් පවතින අතර, ඉඩම් හිඟය නිසා එම වලවල් නැවත ගොඩකර නිවාස ඉදිකිරීමට ගැමියන් පෙළඹී සිටිති. ගමෙන් බැහැර රාජ්‍ය අංශයේත්, පෞද්ගලික අංශයේත්, රාජ්‍ය නොවන අංශයේත් රැකියාවල නිරත පිරිසට අමතරව සෙසු ගැමියන් බහුතරය වෙළඳාමේ සහ කොහු නිෂ්පාදන ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලී සිටිති. පොල්ලෙලි මිළ ඉහළයාම, වෙළඳ කලාපයේ ව්‍යාප්තිය හා සමාජ ඇගයුමට ලක් නොවීම වැනි සාධක මත කොහු හා ආශ්‍රිත නිෂ්පාදන සීඝ්‍ර පරිහානියකට බඳුන් වෙමින් පවතී. එබැවින් බහුතරයක් දෙනා ජංගම සුළු වෙළඳාම පිළිබඳ වැඩිමනත් ලෙස යොමු වෙමින් පවතී.

ගම්මානයේ මුළු පවුල් සංඛ්‍යාව 208 ක් වන අතර, ජන සංඛ්‍යාව 752 කි. සමාජ හා ආර්ථික ස්ථිරයන්ගේ ස්වභාවය අනුව මුළු පවුල් සංඛ්‍යාව මේ අයුරින් වර්ගීකරණය කෙරේ.

වගු අංක 01 පවුල් වර්ගීකරණය - ගොවියාපාන

| | |
|---|---|
| ඉතා ඉහළ ආදායම් | 03 |
| ඉහළ ආදායම් | 18 |
| මධ්‍යම | 72 |
| දුප්පත් | 115 |
| එකතුව | 208 |

ග්‍රාමසංවර්ධන සමිතියක් ආරම්භ කර ඇතත්, එය අක්‍රියාකාරීව පවතින අතර, මරණාධාර සමිතිය, සමෘද්ධි සමිතිය, හා විපර්යකාරක ග්‍රාමීය සංවිධානය ක්‍රියාත්මක තත්ත්වයෙන් පවතී. මේවාගේ වැඩි දායකත්වය මධ්‍යම හා දුප්පත් අයට හිමිව ඇත. මෙම ගෘහ කළමණාකරණ වැඩසටහන සඳහා දුප්පත් පවුල් අතරින් හඳුනාගත් පවුල් 20 ක් සහභාගි කරවාගෙන ඇත.




156 ඒ ගොවියාපාන ග්‍රාම නිලධාරී වසම - සිතියම

වැල්අද්දරගොඩ


ගාල්ල - මාතර ප්‍රධාන මාර්ගයට යාබඳව අහංගම කතලූව අතර මෙම ගම්මානය පිහිටා ඇත. මූලික වශයෙන් මුහුදුබඩට තිරුවේ පිහිටි මෙම ගම්මානය ඇලගාවගොඩ, වැල් අද්දරගොඩ, මැදගොඩ වශයෙන් ගොඩමණ්ඩි තුනකින් යුක්ත වේ. යහපත් කෘෂිකාර්මික පරිසරයක් නොපැවතියද, අතරින් පතර සරුසාර පොල් වගාවක් ගමතුළ දක්නට හැකිය. ගම තුළ පැහැදිලි මූලික ආර්ථික ක්‍රියාදාමයක් දක්නට නොමැති අතර, ගමතුළත් ගමෙන් බැහැරත් විවිධ වෘත්තිකයින් වශයෙන් ජීවනෝපාය මාර්ගවල ගැමියෝ නියැලී සිටිති. ගමතුළ වෙසෙන මුළු පවුල් සංඛ්‍යාව 219 කි. මුළු ජනගහණය 951 කි. සමාජ ආර්ථික ස්ථරයන්ගේ ස්වභාවය මත ගම්මානයේ වෙසෙන පවුල් 219 මේ අයුරින් වර්ගීකරණය කෙරේ.

වගු අංක 02 පවුල් වර්ගීකරණය - වැල් අද්දරගොඩ.

| | |
|---|---|
| ඉතා ඉහළ | 36 |
| ඉහළ | 18 |
| මධ්‍යම | 19 |
| දුප්පත් | 49 |
| ඉතා දුප්පත් | 97 |
| එකතුව | 219 |

ස.ණ.ස. සමිතියක් විපර්යකාරක ග්‍රාමීය සංවිධානයක් ගම තුළ ක්‍රියාකාරී ප්‍රජා සංවිධාන වශයෙන් පවතී. තවත් සමිති හයක් පමණ නාම මාත්‍රිකව අකි5යාකාරීව පවතී.

ගෘහ කළමනාකරණ වැඩසටහන සඳහා ඉතා දුප්පත් පවුල් 97 ත් 20 ක් හඳුනා ගෙන සිටී.



164 B
164 G
162A
164 D
වැල්හේන්ගොඩ
මුහුද

වැල්හේන්ගොඩ.


ගාලු - මාතර ප්‍රධාන මහාමර්ගයට මායිම්ව පිහිටි මුහුදුබඩ ගම්මානයක් වන වැල්හේන්ගොඩ අහංගම නගරයත් කතලූව මංසන්දියත් අතර පිහිටා ඇත. බෝගහවත්ත - කතලූගොඩ - වැල්හේන්ගොඩ යන ගොඩ මණ්ඩි තුනක එකතුවෙන් වැල්හේන්ගොඩ ගම්මානය සැකසී ඇත. ගම්මානය පුරාම දැකිය හැකි සුවිශේෂ භූමි ලක්ෂණයක් ලෙස හිරිගල් හෑරීම සඳහන් කළහැකිය. ගම්මානයේ මුළු පවුල් සංඛ්‍යාව 225 ක් වන අතර මුළු ජනගහනය 839 කි.

ගම තුළ හුණුගල් ව්‍යාපාරය මෙන්ම සුළු වෙළඳ ව්‍යාපාර කීපයක්ද පවතී. මීට අමතරව බොහොමයක් ගැමියන් ගමෙන් බැහැරව රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, මෙන්ම රාජ්‍ය නොවන අංශයේද විවිධ වෘත්තීන්හි නියැලී සිටිති. සමාජ ආර්ථික ස්ථරයන්ගේ ස්වභාවය අනුව පවුල් වර්ගීකරණය මේ අයුරින් දැක්විය හැකිය.

වගු අංක 03 - පවුල් වර්ගීකරණය - වැල්හේන්ගොඩ.

| | |
|---|---|
| ඉතා ඉහළ | 34 |
| ඉහළ | 49 |
| මධ්‍යම | 31 |
| දුප්පත් | 29 |
| ඉතා දුප්පත් | 82 |
| එකතුව | 225 |

ග්‍රාමසංවර්ධන සමිතිය, යෞවන සමාජය, යෙලෝ බර්ඩ් සංවිධානය, ඇග්‍රොමාට් සංවිධානය. ස.ණ.ස. සමිතිය, සමෘද්ධි සමිතිය, ඉසුරු සමිතිය, සර්වෝදය සමිතිය, විපර්යකාරක ග්‍රාමීය සංවිධානය වශයෙන් ප්‍රජා සංවිධන 9 ක් වේ. විපර්යකාරක ග්‍රාමීය සංවිධානය හැරෙන්නට අනෙකුත් සියළුම ප්‍රජා සංවිධාන දේශපාලනීකරණය තුළ රැඳී පවතී. එනිසාම සෑම සමිතියකින්ම උත්සාහ ගන්නේ ප්‍රජාවට කිසියම් ආධාරයක් ලබාදීමටය. මෙම තරඟකාරී බව නිසාම කිසිදු සමිතියක් අර්ථවත් පැවැත්මකින් හෝ ක්‍රියාකාරීත්වයකින් දක්නට නොහැක. ඉතා දුප්පත් පවුල් 82 අතරින් පවුල් කළමනාකරණ වැඩසටහන සඳහා පවුල් 20 ක් හඳුනාගෙන ඇත.




වැලිහේන්ගොඩ වසම - සිතියම

## පියදිගම නැගෙනහිර

ගාල්ල - මාතර මහා මාර්ගයේ අහංගම කඩපොල ආවරණය වන පරිදි පියදිගම නැගෙනහිර ගම්මානය පිහිටා ඇත. මහා මාර්ගය දෙපස රාජ්‍ය මැදිහත්වීම මත බිහිවුණු මහජන සේවා සැපයුම් ආයතන ගණනාවක් දක්නට ලැබෙන අතර, ඉන් ඔබ්බට ගම්මානය විහිද පවතී.


ගැමියන්ගේ මූලික ආර්ථිකය හුණුගල් ව්‍යාපාරය හා වෙළඳාම මත සැකසී පවතින අතර, අනු ක්‍රමයෙන් හුණුගල් ව්‍යාපාරික අවස්ථා නිම වෙමින් පවතී. එනිසාම ගැමියන් බහුතරය වෙළඳාම මූලික ආර්ථික ක්‍රියාදාමය වශයෙන් සළකා කටයුතු කෙරෙති. රාජ්‍ය ආයතන ගණනාවක් මෙන්ම, වෙළඳ ව්‍යාපාර රැසක්ද පැවතීම ගැමියන්ගේ ආර්ථික ක්‍රියාදාමය පහසු කරවන්නක් විය. එනිසාම බහුතරයක් දෙනා ගම තුළම ජීවනෝපාය කර ගනිමින් රැඳී සිටිති.

පියදිගම හා හිරිගල වත්ත යනුවෙන් ගම්මානය ගොඩමණ්ඩි දෙකකින් යුක්ත වේ. ගම්මානයේ මුළු පවුල් සංඛ්‍යාව 222 ක් වන අතර, ජන සංඛ්‍යාව 932 කි. සමාජ ආර්ථික ස්ථරයන්ගේ අනුව ගමේ මුළු පවුල් සංඛ්‍යාව මේ අයුරින් වර්ග කළහැකිය.

වගු අංක 04 - පවුල් වර්ගීකරණය - පියදිගම නැගෙනහිර

| | |
|---|---|
| ඉතා ඉහළ | 04 |
| ඉහළ | 18 |
| මධ්‍යම | 62 |
| දුප්පත් | 138 |
| | 222 |

විපර්යඝාරක ග්‍රාමීය සංවිධනයද ඇතුළුව ගම තුළ ප්‍රජා සංවිධාන හතරක් පවතී. කිසිදු සමිතියක් දිළිඳු ප්‍රජාවගේ ජීවන ගැටළු වලට පිළිතුරු සපයන සංවර්ධන ක්‍රියාදාමයක නිරත නොවන අතර, ඒ නිසාම අක්‍රියාකාරීව පවතී. විපර්යඝාරක ග්‍රාමීය සංවිධානය දුප්පතුන් නියෝජනය කරන ඔවුන්ගේ සෘජු ජීවන ගැටළු වලට පිළිතුරු සපයන ග්‍රාමීය ප්‍රජා සංවිධානයක් වන බැවින්, ක්‍රියාකාරීව පවතී. ඊට සම්බන්ධ පවුල් අතුරින් පවුල් 20 ක් ගෘහ කළමනාකරණ වැඩසටහනට තෝරාගෙන ඇත..




160 - රයිදිගම නැගෙනහිර වසම - සිතියම

මීපේ

හබරාදුව නගරයේ සට දිකුඹුර මාර්ගයේ සැතපුම් 1/4 දුර ගොස් කටුකුරුන්ද හන්දියෙන් වම් පසට වැටී ඇති පාරේ සැතපුම් 3 ක් පමණ දුර ගියවිට මීපේ ගම්මානය හමුවේ. විශාල කුඹුරු යාය ගම්මානය පුරාම විහිද පවතී. කළු ගැට ගණනාවක්ද ගම පුරා පවතින අතර, පැහැදිලි කෘෂි පරිසරයක් ගම තුළ රැඳී පවතී. ගැමියන්ගේ මූලික ජීවනෝපාය කෘෂි ආර්ථිකය පදනම් කරගෙන ක්‍රියාත්මක වේ. මෙම ගම්මානය ඌරුමල්ගොඩ, ගමගොඩ, තෝරපිටිගොඩ, හෙට්ටිගේ වත්ත යනුවෙන් ගොඩමණ්ඩි හතරකින් යුක්ත වේ. ගමේ මුළු පවුල් සංඛ්‍යාව 333 ක් වන අතර, ජනගහනය 1344 කි. සමාජ ආර්ථික සංවර්ධනයන්ගේ ස්වභාවය අනුව මෙම පවුල් 333 පහත සඳහන් පරිදි වර්ගීකරණය වේ.


වගු අංක 05 පවුල් වර්ගීකරණය - මීපේ

| | |
|---|---|
| ඉතා ඉහළ | 28 |
| ඉහළ | 62 |
| මධ්‍යම | 101 |
| පහල (දුප්පත්) | 142 |
| | 333 |

ගම්මානයේ ප්‍රජා සංවිධාන 10 ක් වේ. මෙයින් ස.ණ.ස., මරණාධාර සමිතිය, විපර්යකාරක ග්‍රාමීය සංවිධානය, ගොවි සංවිධානය ක්‍රියාකාරිව පවතී.

- ගොවියාපතන ග්‍රාමනිලධාරී වසම
- වැල්අද්දරගොඩ ග්‍රාමනිලධාරී වසම
- වැල්හේන්ගොඩ ග්‍රාමනිලධාරී වසම
- පියදිගම නැගෙනහිර ග්‍රාමනිලධාරී වසම
- මීපේ ග්‍රාමනිලධාරී වසම

දුප්පත් පවුල් 86 අතුරින් පවුල් 20 ක් ගෘහ කළමනාකරණ වැඩසටහන සඳහා තෝරාගෙන ඇත.



හඳුනාගත් පවුල් සියය පිළිබඳ මූලික ගෘහ තොරතුරු පිළිබඳ විග්‍රහය

හබරාදූව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගම්මාන පහක් මෙම ගවේෂණ ක්‍රියාවලිය සඳහා හඳුනාගන්නා ලදී. එයින් ගම්මාන 4 ක්ම මුහුදුබඩ තිරුවේ පිහිටි ගම්මානයන් වන අතර, එක් ගම්මානයක් පමණක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය අභ්‍යන්තරයේ පිහිටි කෘෂිකාර්මික ගම්මානයකි. මුහුදුබඩ තිරුවේ සෑම ගම්මානයකම පොදු ලක්ෂණය වූයේ හුණුගල් ව්‍යාපාරය නිම වෙමින් පැවතිමත් වෙළඳාම තුළින් මතුවූ ක්‍රියාකාරකම් ජිවනෝපාය බවට පත්කර ගැනීමට ගැමියන් උත්සාහ දරමින් සිටින වගත්ය. කලකට පෙර පැවති කොහු හා ආශ්‍රිත නිෂ්පාදනයන්ද විවිධ සමාජ ආර්ථික වෙනස්වීම් මත බිඳ වැටෙමින් පවති. මේ තත්ත්වය යටතේ පොදුවේ ගැමියන් බහුතරය පහල මට්ටමේ කිසියම් සේවා හෝ නිෂ්පාදන කාර්යයන් ජිවනෝපාය බවට පත්කර ගැනීමට වෙරදරමින් සිටිති. මූලික අවශ්‍යතා ප්‍රමාණවත් අන්දමින් සපුරා ගැනීමට නොහැකිවූ පිරිස (දුප්පතුන්) මෙම ක්‍රියාදාමය තුළ දැඩි වෙහෙසකර තත්ත්වයකට පත්ව සිටී.

රාජ්‍ය අංශයත් රාජ්‍ය නොවන සංවිධානත් විශේෂයෙන් දිළිඳු ප්‍රජාවගේ සංවර්ධනය උදෙසා විවිධ සංවර්ධන උත්සාහයන් දරා ඇත. දරමින්ද සිටී. එහෙත් ඊට සමානුපාතිකව හෝ යොදවන ලද සම්පත් වලට ප්‍රමාණවත් වනසේ දිළිඳු ප්‍රජාවට තමන්ගේ ජිවිත ගැටළු විසඳා ගැනීමට හැකියාවක් ලද වගක් මෙම ගම්මානවල දිළිඳුබවට පත්වී ඇති කාලය දුප්පතුන්ගේ ප්‍රමාණය, මෙන්ම ඔවුන්ගේ ස්වභාවයන්, මත ප්‍රකාශ කළ නොහැක. අදාල ගම්මානවල මුළු පවුල් සංඛ්‍යාව හා දුප්පතුන් හෝ අන්ත දුප්පතුන් වශයෙන් හඳුනාගන්නා ලද පවුල් සංඛ්‍යාවත් එහි ප්‍රතිශතයත් පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වේ.

වගු අංක 06 - දුප්පතුන් පිළිබඳ ප්‍රතිශතය

| | ගම්මානය | මුළු පවුල් සංඛ්‍යාව | දුප්පත් පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය දුප්පත් පවුල්වල ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 1 | ගොවියාපාන | 208 | 115 | 55.28% |
| 2 | වැල්අද්දරගොඩ | 219 | 146 | 66.66% |
| 3 | වැලිහේන්ගොඩ | 225 | 111 | 49.33% |
| 4 | පියදිගම නැගෙනහිර | 222 | 138 | 62.16% |
| 5 | මීපෙ | 333 | 142 | 42.64% |

ඉහත වගුව අනුව 42.64% සිට 66.66% දක්වා වූ ප්‍රතිශතයකින් අදාල ගම්මානවල දුප්පතුන් හඳුනාගෙන සිටී. විශේෂයෙන් දුප්පත් පවුල් අතුරින් මෙම ගවේෂණ ක්‍රියාවලිය සඳහා හඳුනාගන්නා ලද පවුල් සියය (20 x 5 =100) ගවේෂණ ක්‍රියාවලියට පාත්‍ර වන්නන් පමණක් නොව සුවිශේෂවූ පවුල මුල්කරගත් නව සංවර්ධන වැඩපිළිවෙලක් තුළින් තම පවුලේ සංවර්ධන ක්‍රියාදාමය අරඹන පිරිසක් වශයෙන්ද සඳහන් කළයුතුව ඇත.

හඳුනාගන්නා ලද පවුල් සියයෙන් පවුල් 13 ක් විස්තෘත පවුල් වන අතර, ඉතිරි 87 න්‍යෂ්ඨික පවුල් වේ.

මෙම පවුල් සියයේ සාමාජිකයන් ස්ත්‍රී - පුරුෂ වශයෙන් හා වයස් ප්‍රමාණයන් අනුව පහත සඳහන් පරිදි වර්ග කළහැකියි.

**වයස්කාණ්ඩ අනුව හා ස්ත්‍රී පුරුෂ වශයෙන් පවුල් සියයේ ජනගහනය**

වගු අංක 07

| වයස් කාණ්ඩය | 5 අඩු | | 06-08 | | 19-26 | | 27-60 | | 61 ට වැඩි | | එකතුව | | ස්ත්‍රී පුරුෂ මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී පුරුෂභාවය | ස්ත්‍රී | පු | ස්ත්‍රී | පු | ස්ත්‍රී | පු | ස්ත්‍රී | පු | ස්ත්‍රී | පු | ස්ත්‍රී | පු | |
| ගම්මානයේ නම | | | | | | | | | | | | | |
| 1 ගොවියාපතන | 06 | 01 | 16 | 20 | 12 | 13 | 10 | 09 | - | 02 | 44 | 45 | 89 |
| 2 වැල්අද්දරගොඩ | 02 | 07 | 17 | 17 | 16 | 16 | 11 | 11 | 02 | - | 48 | 51 | 99 |
| 3 වැල්හේන්ගොඩ | 02 | 05 | 13 | 13 | 12 | 14 | 11 | 09 | 03 | 02 | 41 | 43 | 84 |
| 4 පියදිගම(නැ) | 06 | 03 | 17 | 14 | 14 | 13 | 10 | 10 | 04 | 02 | 51 | 42 | 93 |
| 5 මීපෙ | 03 | 07 | 27 | 15 | 14 | 14 | 09 | 09 | 01 | 01 | 54 | 46 | 100 |
| එකතුව | 19 | 23 | 90 | 79 | 68 | 70 | 51 | 48 | 10 | 07 | 238 | 227 | 465 |
| | *42* | | *169* | | *138* | | *99* | | *17* | | *465* | | |

මේ අනුව පවුල් සියයට අයත් මුළු ජන සංඛ්‍යාව 465 කි. මෙයින් 238 ක් ස්ත්‍රීන්ද, 227 ක් පුරුෂයන්ද වේ. විස්තෘත පවුල් 13 ද සැලකිල්ලට ගෙන බලනවිට පවුලක සාමාන්‍ය සාමාජිකා සංඛ්‍යාව 4 ක් පමණ වෙතැයි සැලකිය හැක. පවුල් සියයේ සමස්ත ජනගහනය වයස් කාණ්ඩ අනුව පහත සඳහන් පරිදි ගොණු කර දැක්විය හැකිය.

**වයස් කාණ්ඩ අනුව පවුල් සියයේ ජනගහන ප්‍රතිශතය**

වගු අංක 08

| වයස් කාණ්ඩය | ජනගහන | ප්‍රතිශතය |
|---|---|---|
| 05 අඩු | 42 | 9.03 |
| 06 - 18 | 169 | 36.34 |
| 19 - 26 | 138 | 29.68 |
| 27 - 60 | 99 | 21.30 |
| 61 ට වැඩි | 17 | 3.65 |
| එකතුව | 465 | 99.99% |

ඉහත වගුවට අනුව වයස අවුරුදු 19 සිට 60 දක්වාවූ පුද්ගල සංඛ්‍යාව 237 කි. එනම් පවුල් සියයේ මුළු ජන සංඛ්‍යාවෙන් 50.96% කි. උසස් අධ්‍යාපනය සඳහා යොමුවන් කිසිවෙකු නොවන නිසා මෙම ප්‍රතිශතය ශ්‍රම බලකාය ලෙස සැළකේ. එහෙත් වඩාත් යෝග්‍ය හා ප්‍රමාණවත් ඉපයීමක් සහිත සේවා හෝ නිෂ්පාදන කාර්යයක නියැලීම හෝ ඒ තුළින් පවුලේ මූලික අවශ්‍යතා සපුරාගත හැකි පරිදි ආදායම් ලබන වයක් මෙම පවුල්වල මූලික තොරතුරු විග්‍රහයේදී දක්නට නොහැකි විය.

## නිවාස පිළිබඳ තොරතුරු විග්‍රහය

මෙම ගවේෂණ ක්‍රියාවලියට දායකවූ පවුල් සියයේ නිවාස අයිතිය පිළිබඳ මූලික තොරතුරු පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වේ.

නිවාස අයිතිය.

වගු අංක 09

| | ගම්මානය | සැමියා | බිරිඳ | දෙමාපියන් | ඥාතීන් | කුලී/බදු | පවුල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 10 | - | 06 | 02 | 01 | 01 | 20 |
| 2 | වැල්අද්දරගෙඩ | 10 | 03 | - | 02 | 01 | 04 | 20 |
| 3 | වැලිහේන්ගොඩ | 05 | 02 | 08 | 01 | 02 | 02 | 20 |
| 4 | පියදිගම(නැ) | 08 | - | 08 | - | - | 04 | 20 |
| 5 | මීපෙ | 09 | 04 | 05 | - | - | 02 | 20 |
| | එකතුව | 42 | 09 | 27 | 05 | 04 | 13 | 100 |

නිවසේ සංවර්ධනයත් ඒ හා බද්ධවූ පවුලේ සංවර්ධනයත් ඇතිවීම පිණිස නිවාස පිළිබඳ පවත්නා අයිතියේ බලපෑම මතුපිටින් දැක්ම හා අවබෝධ කරගැනීම ඉතා අපහසු කාර්යයකි. අයිතිය පිළිබඳ තමන් සෑහීමකට පත්නොවන නිසා ඇතිවන මානසික ස්වභාවය මෙහි පවත්නා මූලික මනෝ විද්‍යාත්මක ස්වභාවයයි. ඒ නිසාම පුද්ගලයා අකර්මණ්‍ය අයෙකු බවට පත්ව ඇත. පවුල පිළිබඳ නිර්මාණය වියයුතු කිසිදු සංවර්ධනාත්මක සිතුවිල්ලකට හෝ අදහසකට, සාකච්ඡාවකට පවුල තුළ වාතාවරණයක් නිර්මාණය වීමේ සියළු අවස්ථා මේ තුළින් වැසී පවතී.

සැමියා හා බිරිඳ වශයෙන් නිවාස අයිතිය පවතින්නේ 51% ට පමණි. 49% ක්ම නිවාස අයිතිය නොලැබූවන්ය. විස්තතා පවුල් 13 ක් වුවද පවුල් 38 ක්ම (දෙමාපිය 27 පවුල් 11) දෙමාපිය අයිතිය හා පවුල් අයිතිය තුළ රැඳී සිටී. දෙමාපියන්ට විවාහක ඥ දරුවන්ට ඉඩම් අයිතිය පැවරීමට ඉඩකඩ ඇතත්, විවිධ හේතු මත පවරා නොසිටීම, ඇතැම් විට පරම්පරා

අයිතිය නිසා නිත්‍යානුකූලවූ බෙදා වෙන්කර ගැනීමට විශාල වියදමක් දැරීමට සිදුවීම කිසිවෙකුට ඒ සඳහා කටයුතු කිරීමේ ආර්ථික හැකියාවක් නොමැතිකම (විවාහයෙන් පසු එකම ඉඩමේ තැනින් තැන නිවාස ඉදිකර ගැනීම) දූවාදරුවන්ගේ නොමනා ක්‍රියාකාරකම් හිතුවක්කාර ආවාහ විවාහ වැනි විවිධ හේතූන් මත මෙම නිත්‍යානුකූල හිමිකම් ලැබීමේ අවස්ථා ගිලිහී ගොස් ඇත. මෙබඳු තත්ත්වයක් යටතේ වුවද ඇතැමෙක් තම අයිතිය තහවුරු කර ගැනීම සඳහා විවිධ උත්සාහයන්හි යෙදී සිටී. ඒ තුළද ගැටුම් අඩ දබර කලකෝලාහල සිදුවෙමින් පවතී. තවත් සමහරෙක් එය ඉටුකර ගත නොහැකිවූවක් සේ සළකා එය අතහැරදමා එදිනෙදා යැපෙන මට්ටම තුළ රැඳී සිටී. පවුලේ සංවර්ධනය, දුවාදරුවන්ගේ කටයුතු තමන්ගේ සමාජ වගකීම් ආදී සියල්ල මෙම සිද්ධිය හරහා අතහැර දමා ඇත.

කාන්තාවට දායාද වශයෙන් පරිත්‍යාග කිරීමට එකඟව සැමියාගේ නොමනා පැවැත්ම නිසාත්, දෙමාපියන්ට සැලකීම සිදු නොවන නිසාත්, අකීකරු බව නිසාත් අයිතිය නොපැවරීමද මේ තුළ දක්නට ලැබුණි. මෙම මූලික ගැටළුව ඉහත සඳහන් පවුලේ සංවර්ධනය ඇණ හිටීම පමණක් නොව ඇතැම් තැනක කාන්තාව ගෘහ ප්‍රචණ්ඩත්වයට ලක්වන අවස්ථාවන්ට පසුබිම ගොඩනඟා තිබුණි. නිවාස අයිතිය 9% ක් කාන්තාව සතුව පැවැතුනි. විශේෂයෙන් දෙමාපියන්ගෙන් හිමිවීම මත එය සිදුවී ඇති අතර, එබඳු පවුල් තුල පුරුෂයා හා සමානව මෙන්ම ඊටත් වැඩියෙන් පවුලේ සංවර්ධනය පිළිබඳ දායකත්වයක් කාන්තාව ලබා තිබුණි.
ඉහත නිවාසවල තත්ත්වය පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වේ.

නිවාස තත්ත්වය

වගු අංක 10

| | ගම්මානය | තාවකාලික | අර්ධ ස්ථිර | ස්ථිර | එකතුව |
|---|---|---|---|---|---|
| 01 | ගොවියාපාන | 02 | 16 | 02 | 20 |
| 02 | වැල්අද්දරගොඩ | 05 | 12 | 03 | 20 |
| 03 | වැල්හේන්ගොඩ | 07 | 11 | 02 | 20 |
| 04 | පියදිගම නැ : | 04 | 12 | 04 | 20 |
| 05 | මීපෙ | 04 | 13 | 03 | 20 |
| | එකතුව | 22 | 64 | 14 | 100 |

අයිතිය පිළිබඳ සැලකීමේදී අයිතිය කුමන ආකාරයකින් පැවතියද ඒවා සියල්ල මෙම අංශ තුනට අයත් වේ. විශේෂයෙන් තාවකාලික නිවාස, තාරශීට්, තහඩු හා පොල් අතු, සෙවිලිකොට ලෑලි, කටුමැටි බිත්ති වලින් යුතු බිමට මැටි යෙදූ ගෙවල් වේ.

අර්ධ ස්ථිර ගෙවල් බහුතරය වහලයට උළු සෙවිලි කොට පැවති අතර, බිත්ති කපරාරු නොකර . බිමද සකස් කර නොතිබුනි. එමෙන්ම අත්තිවාරම මුළුමනින්ම ආවරණය වන පරිදි ඉදිකිරීම් කටයුතු නිමවී නොතිබීමද මෙහි දක්නට ලැබුණි. මෙම නිවාස ලාභීන් 64 න් 36 දෙනෙකුම නිවාස ණය ලබාගෙන එමඟින් හැකි පමණ ඉදිකිරීම් කටයුතු නිම කොට දැනට තමන් උපයන මුදලින් අදාල ණය වාරික ගෙවමින් සිටී. ණය වාරික ගෙවීමේ අපහසුතාවය මත නව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළනොහැකි පිරිසක්ද මේ අතර වේ.

ලබාඇති උපරිම ණය මුදල රුපියල් 20,000/= ක් වනඅතර, අවමය රුපියල් 5000/= කි. ණයලාභීන් 7 දෙනෙකු ගෙවා ගැනීමේ අපහසුතාවයටද පත්ව සිටී. ස්ථිර නිවාස 14 න් දෙකක හැරෙන්නට අනෙකුත් නිවාස 12 හේද, අර්ධ ස්ථිර නිවාසවලද උපරිම කාමර සංඛ්‍යාව දෙකකි. තාවකාලික ඇතැම් නිවාසවල කාමර, සාලය, ආලින්දය ආදි වෙන්කිරීමක් දක්නට නොලැබුණු අතර, තාවකාලික නිවාස 11 ක මුළුතැන්ගෙයද ඒ තුළම විය.

නිවාස සියයෙන් 59 ක් විදුලිය ලබා ඇති අතර, තාවකාලික නිවාස 22 ක් අර්ධන ස්ථිර නිවාස 19 කුත් (41) විදුලිය ලබා නොමැත. මෙම ගවේෂණ ක්‍රියාවලියට අයත් නිවාස සියයේ මුළුතැන් ගෙවල් පහත සඳහන් අයුරින් වර්ගකර දැක්විය හැකිය.

### මුළුතැන්ගෙයි ස්වභාවය.

වගු අංක 11

| ගම්මානය | තාවකාලික | ස්ථිර | නැති | එකතුව |
|---|---|---|---|---|
| ගොවියාපාන | 14 | 04 | 02 | 20 |
| වැල්අද්දරගොඩ | 16 | 03 | 01 | 20 |
| වැලිහේන්ගොඩ | 12 | 04 | 04 | 20 |
| පියදිගම නැ: | 15 | 02 | 03 | 20 |
| මීපෙ | 18 | 01 | 01 | 20 |
| එකතුව | 75 | 14 | 11 | 100 |

මෙම වගුවෙන් දැක්වෙන පරිදි නිවාස 75 කම ඇත්තේ ඉතා තාවකාලික මුළුතැන් ගෙවල්ය. තාවකාලික මුළුතැන් ගෙයක් වීම නිසාම මුළුතැන් ගෙයකට අවශ්‍ය දෑ ක්‍රමවත්ව නැතුවාක් මෙන්ම එහි සිදුවන ක්‍රියාවලියද ක්‍රමවත් නොවිනි. එමෙන්ම ඒ අවට පරිසරයද ඉතා අපවිත්‍ර තත්ත්වයේ පවතී. ප්‍රශ්නාවලියෙන් දැක්වෙන පරිදි පහත සඳහන් දත්ත සාරාංශ වගුවද මෙම මුළුතැන් ගෙවල්වල යථා ස්වභාවය හෙලිදරව් කරනු ලබයි.

මුළුතැන්ගෙයි ස්වභාවය 11

වගු අංක 12

| ග්‍රාමීය මුළුතැන්ගෙයක මූලිකව පැවතියයුතු 22 | තාවකාලික (75) | ස්ථිර 14 | නැති 11 | එකතුව 100 |
|---|---|---|---|---|
| හොඳින් බඳින ලද ලිප | X | ✓ 7 | X | - |
| දුම්කවුළුව | X | ✓ 7 | X | - |
| දුම් මැස්ස | X | X | X | - |
| දර මැස්ස | X | X | X | - |
| දිය මැස්ස | X | X | X | - |
| අපිරිසිදු ජලය බැසයාම | X | X | X | - |
| අවට පිරිසිදු බව | X | X | X | - |
| බිමට උණුවතුර භාජනය | X | X | X | - |
| දෑත් පිරිසිදුව සඳහා සබන් හා වතුර තැබීම | X | X | X | - |

X නැත

✓ ඇත.

මෙම වගුවෙන් ප්‍රකාශ කොරන්නේ ස්ථිරව පවත්නා මුළුතැන් ගෙවල් හතක බඳින ලද ලිප හා දුම්කවුළු හැරෙන්නට පවුල් 93 කට කිසිදු මුළුතැන්ගෙයක ග්‍රාමීය මුළුතැන්ගෙයක පැවතියයුතු මූලික දෑ නොපවතින වගයි. මුළුතැන් ගෙය තුළ පවත්නා මෙම අක්‍රමවත් බව හා අපිරිසිදු බව ගෘහමූලිකයන්ගේ මෙන්ම ගෘහයේ වසන සියළුම දෙනාගේ සෞඛ්‍යම පවුලසෑ පිළිබඳ පවත්නා අනවබෝධය තහවුරු කරන්නක් විය.

මෙම පවුල් සියය සතුව පවත්නා වැසිකිලිවල ස්වභාවය පහත සඳහන් අයුරින් ප්‍රකාශ වේ.

වැසිකිලිවල ස්වභාවය.

වගු අංක 13

| | ගම්මානය | ජල මුද්‍රිත | වල | තාවකාලික | අබලන් | නැති | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 15 | - | - | - | 5 | 20 |
| 2 | වැල්අද්දරගොඩ | 05 | 03 | 07 | 4 | 1 | 20 |
| 3 | වැල්හේන්ගොඩ | 8 | 03 | 01 | 8 | - | 20 |
| 4 | පියදිගම | 11 | - | - | - | 9 | 20 |
| 5 | මීපෙ | 09 | - | 02 | 9 | - | 20 |
| | එකතුව | 48 | 06 | 10 | 21 | 15 | 100 |

ස්ථිර හා අර්ධ ස්ථිර නිවාස වල මෙම ජල මුද්‍රිත වැසිකිළි 48% ක් පැවති අතර, වැසිකිළි 52% ක්ම අයහපත් තත්ත්වයේ පවතී. ජල මුද්‍රිත වැසිකිළි 48 ක් තිබූ පමණින් එම පවුල්වල සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා වැසිකිළි භාවිතය හේතුවූවායි සැලකිය නොහැකිය.

වැසිකිළි භාවිතය පිළිබඳ ක්‍රියාවලිය හා එහි නඩත්තු ක්‍රියාවලියද සනීපාරක්ෂක පහසුකමක් වශයෙන් වැසිකිළිය හා බද්ධව පවත්නා අත්‍යාවශ්‍ය සාධකයන්ය. වැසිකිළි භාවිතය හා නඩත්තුව පිළිබඳ පවුල් සියයේ පැවති තත්ත්වයන් පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වේ.

වැසිකිළි නඩත්තුව හා පරිහරණ ස්වභාවය

වගු අංක 14

| | වැසිකිළි නඩත්තුව හා පරිහරණ ස්වභාවය | අදාල පවුල් (වැසිකිළි) සංඛ්‍යාව |
|---|---|---|
| 1 | දිනපතා පිරිසිදු කිරීම | 22 |
| | සතිපතා පිරිසිදු කිරීම | 4 |
| | මාස්පතා පිරිසිදු කිරීම | - |
| | පිරිසිදු කිරීමේ විශේෂ වැඩපිළිවෙලක් නැත | 74 |
| 2 | වැසිකිළි භාවිතයෙන් පසු සබන් දමා අත් සේදීමේ වැඩපිළිවෙලක් ඇති | 08 |
| 3 | වැසිකිළියට ජලය ගෙනයාමට භාජනයක් වෙන්කර ඇති | 67 |
| 4 | කුඩා ළමුන්ගේ මළ වැසිකිළියට බැහැර කරන | 04 |
| 5 | කුඩා ළමුන්ට යාමට වැසිකිළියක් ඇති | - |
| 6 | කුඩා ළමුන්ගේ මල වලක් කපා බැහැරකරන | 08 |
| 7 | කුඩා ළමුන්ගේ මළ කසල ගොඩට දමන | 09 |

74% ක්ම වැසිකිළිය පිරිසිදුව තබා ගැනීම පිළිබඳ අවධානය යොමු නොකළ අය වේ. සනීපාරක්ෂාව පිළිබඳ එහි බලපෑම තේරුම් නොගත් පිරිස ලෙස මේ අය සැලකේ. වැසිකිළි යෑමෙන් පසු සබන් දමා අත සේදීම පිළිබඳ නිරතවූ පවුල් සංඛ්‍යාව 8% කි. ජලමුද්‍රිත වැසිකිළි ඇති බහුතරය පවා ඒ පිළිබඳ දන්වා ඇති අවධානය සතුටුදායක නොවේ.

වෙනම වැසිකිළියට වතුර ගෙනයාම සඳහා භාජනයක් වෙන්කර තැබූ සංඛ්‍යාව සතුටුදායකව පවතී. එය 67% කි. එසේ නොමැති ස්ථාන සංඛ්‍යාව 33% කි. විශේෂයෙන් දියනෑමට දිය ගෙන ඒමට හා වෙනත් ගෘහ කටයුතු සඳහා මෙම භාජනය යොදාගෙන තිබීම තවත් විශේෂත්වයකි.

කුඩා ළමුන්ගේ මළ බැහැරකිරීම පිළිබඳ තත්ත්වය කිසිසේත් සතුටුදායක නොවේ. ජල මුද්‍රිත වැසිකිළි හිමි පවුල් 4 ක් පමණක් කුඩා දරුවන්ගේ මළ වැසිකිළියට බැහැර කරනු ලැබූ අතර, ගෙවත්තෙ වලක් කපා කුඩා දරුවන්ගේ මළ බැහැර කළ පවුල් 08 ක්ද වේ. පවුල් 39 ක්ම කසලගොඩට මළ බැහැර කිරීමට පුරුදුව සිටියහ.

මෙම පවුල් සියයේ පානීය ජලය ලබාගැනීමේ ක්‍රම පහත සඳහන් වගුවෙන් දැක්වේ.

පානීය ජල සැපයුම

වගු අංක 15

| ජලය ලබාගන්නා ක්‍රමය | අදාල පවුල් සංඛ්‍යාව | |
|---|---|---|
| නිවසේ ආරක්‍ෂිත ළිඳ | 17 | - |
| නිවසේ අනාරක්‍ෂිත ළිඳ | 13 | 13 |
| නිවසට ලබාගත් නල ජලය | - | - |
| පොදු නල ජලය | 24 | - |
| ආරක්‍ෂිත පොදු ළිඳ | 12 | - |
| අනාරක්‍ෂිත පොදු ළිඳ | 18 | 18 |
| අසල්වැසි ආරක්‍ෂිත ළිඳ | 12 | - |
| අසල්වැසි අනාරක්‍ෂිත ළිඳ | - | - |
| ආලදොල ගංගා වෙනත් | 4 | 4 |

තමන්ගේම නිවසේ ළිඳකින් ජලය පාරිභෝජනය කරන පිරිස 30% කි. එහෙත් එයින් අනාරක්‍ෂිත ළිං වලින් ජල පාරිභෝජනයේ නියුතු සංඛ්‍යාව 13 කි.

ප්‍රාදේශිය සභාවෙන් සලසා ඇති පොදු ජල කරාම පහසුකම් භුක්ති විඳින පවුල් සංඛ්‍යාව 24% ක් වන අතර, ආරක්‍ෂිත පොදු ළිං වලින් ජල පරිභෝජනයේ නියුතු පවුල් සංඛ්‍යාව 12% කි. නිවසේ අනාරක්‍ෂිත 13%ද අනාරක්‍ෂිත පොදු 18ද, ඇලදොල 4%ද වශයෙන් සැලකුවිට 35% ක් සෞඛ්‍යාරක්‍ෂිත නොවන අන්දමින් ජල පරිභෝජනයේ නියුතු අයවලුන් වේ. මීට අමතරව ඇලදොල, අසල්වැසි, පොදු ජල පහසුකම් ආදිය සැලකිල්ලට ගත්විට දුර ප්‍රමාණය, ප්‍රමාණවත් ජලය ලබාගැනීමට නොහැකි බව ජලය ගෙන ඒම සඳහා කෙනෙකු විශේෂයෙන් නිරතවීම වැනි බාධක රැසකටද මුහුණපා තිබුණි. ජලය ලබාගැනීමේදී කාන්තාවට සහායවන ස්වාමිපුරුෂයා මෙන්ම නිවසේ සෙසු අයද සිටින නිවාසද 9 ක් දක්නට ලැබුණි.

## නිවාස පවිත්‍රතාවය

නිවාස අවට පවිත්‍රතාවය පිළිබඳවද මෙම ගෘහ තොරතුරු සමීක්ෂණයේදී කරුණු විමසුමට ලක්කරන ලදී. නිවාස සියයේ ඇතුලත මෙන්ම එහි වට පිටාවේ පරිසරය පිළිබඳවද පවිත්‍රතාවය පහත සඳහන් පරිදි දක්නට ලැබුණි.

නිවසේ පවිත්‍රතාවය

වගු අංක 16

| පිරිසිදු බව සහ අදාල කාර්ය | නිවාස සංඛ්‍යාව |
|---|---|
| කුණු වලක් පවත්වාගෙන යන නිවාස | 25 |
| පොලිතින්/ප්ලාස්ටික් වෙන්කර විනාශ කිරීමේ වැඩපිළිවෙලක් ඇත. නිවාස | 13 |
| කුඩා ළමුන්ගේ පිරිසිදුව තබන නිවාස සංඛ්‍යාව | 48 |
| නිවාස ඇතුලත පිරිසිදුවට හා ක්‍රමවත්බව සහිත නිවාස | 39 |
| ගෙවත්තේ පිරිසිදුබව හා ක්‍රමවත් බව | 30 |

නිසි පරිදි කුණුවලක් පවත්වාගෙන යන නිවාස සංඛ්‍යාව 25% කි. කුණුවලක් නොමැති නිසාම ගෙවත්ත පුරාමත් ගස්මුල් වලටත් කුණු එකතු කිරීම ගෙවත්තේ අපිරිසිදුබව සඳහාද හේතුවී තිබුණි. විශේෂයෙන් මේ හා බද්ධව පැවති ප්ලාස්ටික් හා පොලිතින් ගෙවත්ත පුරා විසිරීයාම අශෝභන බව, අපිරිසිදු බව, පමණක් නොව වර්ෂාව නිසාත්, කල්ගතවීම නිසාත්, ගෙවත්තේ පසට බරපතල හානියක් ඇතිකරන එකතුවක්ව තිබුණි. කෙසේ වෙතත් ප්ලාස්ටික් හා පොලිතින් වෙන් වශයෙන් එකතු කර විනාශ කිරීමේ නිරත නිවාස සංඛ්‍යාව 13% ක් පමණි. නිවාස තුළ හා බාහිර වටපිටාව කුමන අපිරිසිදු බවක පැවතියත් ළමුන් පිරිසිදුව තැබීම පිළිබඳ දෙමාපිය අවධානය තරමක් සතුටුදායකව පවති එය 48% ක් පැවතුනි.

නිවස ස්ථිර, තාවකාලික, අර්ධ ස්ථිර කුමන මට්ටමක පැවතියත් ඉතා ක්‍රමවත්ව හා පිරිසිදුව තිබූ නිවාස සංඛ්‍යාව 39% කි. මෙහි ඉතා වැදගත්ම අවස්ථාව වූයේ ස්ථිර නිවාස සියල්ලම පිරිසිදුව නොතිබීම හා තාවකාලික නිවාස සියල්ල අපිරිසිදුව නොපැවතිමයි.

ගෙවත්ත තරමක් දුරට හෝ ක්‍රමවත්ව පැවති නිවාස සංඛ්‍යාව 30% කි. විශේෂයෙන් කුණු වලක් භාවිතා නොකිරීම ගෙවත්තේ අපිරිසිදු බව සඳහා ප්‍රබල හේතුවක්ව පැවතුනි.

රෝගාබාධ

මෙම පවුල් සියයේ රෝගාබාධ පහත සඳහන් අයුරින් වර්ගකර දැක්විය හැක.

රෝග හා ආබාධ තත්ත්වයන්

වගු අංක 17

| රෝගාබාධය | පවුල් සංඛ්‍යාව |
|---|---|
| නිදන්ගත රෝග | 19 |
| ආබාධිත | 14 |
| නිතර රෝගාබාධාවලට ලක්වන | 70 |

දියවැඩියාව, හෘදයාබාධ, ඇදුම, පීනස, සෙම්රෝග, මානසික ආබාධ වශයෙන් රෝගීන් 19 ක් වූ අතර, උපතින්ම ආබාධිතවූ 13 දෙනෙකු සහ ආරක්ෂක අංශයේ සේවය කිරීමෙන් පසු ආබාධිත වූ එක් අයෙකුද වශයෙන් ආබාධිතයන් දහහතර දෙනෙකු වූහ. අන්පා අහිමිවීම, විකෘති වීම, ඇස් අන්ධවීම්, කන්නෑසීම්, කථා කළ නොහැකිවීම්, ඇවිදීමට නොහැකිවීම් වශයෙන් ආබාධ අවස්ථා පැවතුනි.

නිතර රෝගාබාධ වලට ලක්වන අය නිවාස 70 කම දක්නට ලැබුණි. උණ, සෙම්ප්‍රතිශ්‍යාව, උදරාබාධ, විශේෂයෙන් පාචනය, වමනය, යන රෝග මෙම නිවෙස්වල සාමා□කයන්ට නිතර වැළඳෙන රෝග විය.

## ආදායම් උත්පාදනය පිළිබඳ තොරතුරු විග්‍රහය

ගෘහ තොරතුරු සමීක්ෂණයෙන් හෙළිදරව්වූ පරිදි මෙම පවුල් සියයේ මූලික ආදායම් මාර්ග පහත සඳහන් පරිදි හඳුනාගෙන ඇත.

### පවුලේ ප්‍රධාන ආදායම් මාර්ග

වගු අංක 18

| | ආදායම් මාර්ගය | පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සුළු වෙළඳාම | 20 |
| 2 | සුළු කාර්මික | 07 |
| 3 | වෙළඳ සහායක | 04 |
| 4 | කුලිවැඩ (අනියම්) | 20 |
| 5 | ඇහලුම් | 05 |
| 6 | පෙදරේරු | 05 |
| 7 | වඩු | 02 |
| 8 | ධීවර (කම්කරු) | 10 |
| 9 | කුලී රියදුරු | 09 |
| 10 | මුරකරු | 04 |
| 11 | යුදහමුදා | 03 |
| 12 | රිය සහායක | 03 |
| 13 | අරක්කැමි | 01 |
| 14 | නේවාසි පහසුකම් සැලසීම | 03 |
| 15 | පින්තාරු වැඩ | 03 |
| 16 | පුවත්පත් වාර්තාකරු | 01 |
| | එකතුව | 100 |

ඉහත සඳහන් වූ පවුලේ මූලික ආදායම් මාර්ගයට අමතරව අතුරු ආදායම් මාර්ග අටක නිරත පවුල් සංඛ්‍යාව 66 කි. එම අතුරු ආදායම් මාර්ග පහත සඳහන් වේ.

අතුරු ආදායම් මාර්ග

වගු අංක 19

| | අතුරු ආදායම් මාර්ගය | නිරත පවුල් ගණන |
|---|---|---|
| 1 | කොහුලණු නිෂ්පාදනය | 07 |
| 2 | රසකැවිලි නිෂ්පාදනය | 09 |
| 3 | ගෙවතු වගාව | 17 |
| 4 | ඇඳුම් මැසීම් | 14 |
| 5 | සුළු වෙළඳාම | 07 |
| 6 | සුළු කාර්මික | 03 |
| 7 | කුලී වැඩ (අනියම්) | 05 |
| 8 | ධීවර | 04 |
| | එකතුව | 66 |

ගෘහමූලිකයා ලෙස නීත්‍යානුකූලව පිළිගැණුනු පියා නැතහොත් සැමියා පවුල නඩත්තු කිරීම සඳහා වන මූලික ඉපයීම් මාර්ගයෙහි නිරතවීම සම්මතයක් ලෙස පිළිගැනුනද, මෙම පවුල් සියයට අදාළ තොරතුරු තුළ එබන්ඳක් දක්නට නොහැකි විය. ප්‍රධාන හා අතුරු ආදායම් මාර්ගවල නිරත පුද්ගල වර්ගීකරණය පහත සඳහන් පරිදි හඳුනාගැනීමට හැකි විය.

ආදායම් මාර්ග නිතරවීම් - පුද්ගල

වගු අංක 20 -

| ආදායම් මාර්ගය | සැමියා පියා | බිරිඳ | පුතා | දුව | එකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රධාන ආදායම් මාර්ගය | 84 | 10 | 4 | 2 | 100 |
| අතුරු ආදායම් මාර්ගය | 12 | 42 | 8 | 4 | 66 |

කාන්තාවන් දස දෙනෙකුම පවුලේ මූලික ඉපයීම් ක්‍රියාවලියෙහි නිරතව සිටියහ. මීට අමතරව වැඩිමහලු අවිවාහක පුතුන් හතර දෙනෙකුද, දුවරුන් දෙදෙනෙකුද, පවුලේ මූලික ඉපයීම් ක්‍රියාවලියෙහි නිරතව සිටියහ.

අතුරු ආදායම් වලදී 42 ක්වූ වැඩිම සංඛ්‍යාව කාන්තාවන් වූ අතර, ගෘහ මූලිකයන් දොලොස් දෙනෙකු අතුරු ආදායම් මාර්ගවල නිරතවූහ. වැඩිමහල් පුතුන් අට දෙනෙකු හා දූවරුන් හතර දෙනෙකුද අතුරු ආදායම් මාර්ගවල නිරතව සිටියි. ප්‍රධාන ආදායම් මාර්ගවල නිරත ගෘහමූලික (පිරිමි) 84 හැරෙන්නට ඉතිරි 16 දෙනා පහත සඳහන් ආදායම් මාර්ගවල නිරතව සිටියහ.

ප්‍රධාන ආදායම් මාර්ග නිරතවීම් - ගෘහමූලික හැර

වගු අංක 21

| | ආදායම් මාර්ගය | බිරිඳ(මව) | පුතා | දුව | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | ධීවර | - | 2 | - | 2 |
| 2 | සුළු වෙළඳාම | 2 | 1 | 1 | 4 |
| 3 | වෙළඳ සහායක | - | 2 | - | 2 |
| 4 | රිය සහායක | - | 2 | - | 2 |
| 5 | කුලී වැඩ | 4 | 2 | - | 6 |
| | එකතුව | 6 | 9 | 1 | 16 |

අතුරු ආදායම් මාර්ගවල නිරත හැටහයදෙනාගෙන් දොළොස් දෙනෙකු ගෘහමූලිකයන් (පිරිමි) වන අතර, බිරින්දෑවරුන් 42 ක්ම වූහ. පුතුන් 8 දෙනෙකු හා දූවරුන් 4 දෙනෙකු අතුරු ආදායම් මාර්ගවල නිරතව සිටියහ. ගෘහ මූලික දොළොස් දෙනා හැරෙන්නට සෙසු අය පහත සඳහන් පරිදි අතුරු ආදායම් මාර්ගවල නිරතව සිටියහ.

අතුරු ආදායම් මාර්ග නිරතවීම් - ගෘහමූලික හැර

වගු අංක 22

| | අතුරු ආදායම් මාර්ගය | බිරිඳ (මව) | පුතා | දුව | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | කොහු ලණු | 07 | - | - | 07 |
| 2 | රස කැවිලි නිෂ්පාදනය | 09 | - | - | 09 |
| 3 | ගෙවතු වගාව | 13 | - | - | 13 |
| 4 | ඇඳුම් වගාව | 10 | - | 04 | 14 |
| 5 | සුළු වෙළඳාම | 02 | 04 | - | 06 |
| 6 | කුලී වැඩ (ආදායම්) | 01 | 01 | - | 02 |
| 7 | සුළු කාර්මික | - | 03 | - | 03 |
| | එකතුව | 42 | 08 | 04 | 54 |

ගෘහ තොරතුරු සමීක්ෂණයෙන් හෙළිදරව්වූ පරිදි වයස අවුරුදු 19 ත් 60 ත් අතර ශ්‍රම බලකායට එකතුවන පුද්ගල සංඛ්‍යාව 237 කි. ප්‍රධාන ආදායම් මාර්ගය තුළින් මෙන්ම අතුරු

ආදායම් මාර්ගවලින්ද 166 දෙනෙකු ඉපයීම් කාර්යයට දායකවී ඇත. මේ අනුව නිෂ්පාදන කාර්යයට දායක නොවන ශ්‍රමිකයන් සංඛ්‍යාව 71 කි.

එමෙන්ම හමුදා සේවයේ නියුතු තිදෙනාද ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු මුරකරුවෙකුද ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියැදුරෙකුද හැරෙන්නට අනෙකුත් සියළුම වෘත්තිකයන් පෞද්ගලික අංශයේ සහ / අනියම් / සේවකයෙකු ලෙස කිසියම් පුද්ගලයෙකු ළඟ හෝ ආයතනයක සේවය කරන්නන් වේ. හමුදා සේවයේ එක් අයෙකුද පාදයක් අහිමිව වෘත්තියෙන් සමුගත් අයෙකු වේ. මෙම පවුල් සියය ආදායම් කාණ්ඩ අනුව පහත සඳහන් පරිදි වර්ග කළහැකිය.

ආදායම් කාණ්ඩ අනුව පවුල් වර්ගීකරණය

වගු අංක 23

| | ගම්මානය / ආදායම් කාණ්ඩ | 2500 ත් 5000 ත් අතර | 5001 ත් 7500 ත් අතර | 7501 ත් 10000 ක් අතර | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 8 | 8 | 4 | 20 |
| 2 | වැල්අද්දරගොඩ | 14 | 3 | 3 | 20 |
| 3 | වැල්හේන්ගොඩ | 11 | 5 | 4 | 20 |
| 4 | පියදිගම(නැ) | 10 | 8 | 2 | 20 |
| 5 | මීපෙ | 12 | 4 | 4 | 20 |
| | එකතුව | 55 | 28 | 17 | 100 |

මේ අනුව බලනකල කිසිදු පවුලක් රුපියල් 2500/= කට අඩු ආදායම් තත්ත්වයක පසු නොවේ. මෙබඳු ආදායම් තත්ත්වයක් හෙළිදරව් කර ගැනීමට හැකිව ඇත්තේ හුදෙක් මෙය ගෘහ තොරතුරු සමීක්ෂණයක්ම නොව තමන්ගේ පවුල පිළිබඳ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පවුලේ පවත්නා යථා ස්වභාවය සොයා බැලීමක්ය යන්න මෙම පවුල්වල සැමියා මෙන්ම බිරිඳත් තේරුම් ගෙන සිටි බැවිනි.

මෙම 2500/= ත් 10000/= ත් අතර ආදායම් මට්ටමක පසුවන පවුල් සියයෙන් පවුල් 36 කට සමෘද්ධි සහනාධාරයද ලැබී ඇත. ඉහත සඳහන් ආදායම් ගණනය කරන ලද්දේ එම සහනාධාරයද ආදායමට ඇතුලත් කිරීමෙන් අනතුරුවයි. පහත සඳහන් පරිදි ගම්මානවල සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව දැක්වේ. ඔවුන්ගේ ආදායම් කාණ්ඩයද පහත වගුවේ දැක්වේ.

### ආදායම් කාණ්ඩ අනුව සමෘද්ධිලාභී වර්ගීකරණය

වගු අංක 24

| | ගම්මානයේ නම | සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව | ආදායම් කාණ්ඩය අනුව | | |
|---|---|---|---|---|---|
| | | | 2500 - 5000 | 5001 - 7500 | 7501 - 10000 |
| 1 | ගොඩියාපතන | 03 | 01 | 01 | 01 |
| 2 | වැල්අද්දරගොඩ | 11 | 8 | 2 | 01 |
| 3 | වැල්හේන්ගොඩ | 06 | 2 | 04 | - |
| 4 | පියදිගම නැගෙනහිර | 11 | 9 | 01 | 01 |
| 5 | මීපෙ | 05 | 2 | 1 | 2 |
| | එකතුව | 36 | 22 | 9 | 5 |

### ඉඩම් හා ගෙවත්ත

වගු අංක 09 හි සඳහන් පරිදි ඉඩම් අයිතියද නිවාස අයිතිය පිළිබඳ තත්ත්වයට සමානව පවතී. පවුල් සියයේ ඉඩම් අයිතිය මෙසේ පවතී.

### ඉඩම් අයිතිය (හිමිකම)

වගු අංක 25

| | |
|---|---|
| ඉඩම් අයිතිය සැමියා, සතු | 42 |
| ඉඩම් අයිතිය බිරිඳ සතු | 09 |
| ඉඩම් අයිතිය දෙමාපියන් සතු | 27 |
| කුලි ගෙවමින් සිටින | 04 |
| ඉඩම් අයිතිය ඥාතීන් සතු | 05 |
| හවුල් ඉඩම් අයිතිය | 13 |
| | 100 |

සැමියා හා බිරිඳ සතු ඉඩම් කැබලි 51 හැරුණුවිට ඉතිරි ඉඩම් කැබලි 49 ක අයිතිය පවුලෙන් බැහැරව පවතී. අයිතියේ ස්වභාවය මේ අයුරින් පැවතිම ඉඩම් සංවර්ධනය කිරීම, මෙන්ම ආදායම් උත්පාදක කාර්යයක් සඳහා යෙදවීම පිළිබඳ උදාසීන මානසික ස්වභාවයක් ජනිත කරවන්නක් වශයෙන් පවතී. එපමණක් නොව එම පවුල්වල ඉඩම් අයිතිය නිරවුල්කර ගැනිම

සඳහා ඥාතීන් අතර දෙමාපියන් හා දූ දරුවන් අතර අර්බුදකාරී ස්වභාවයක් පැවතීමද සුලභ ලක්‍ෂණයක්ව පැවතුනි. ඇතැම් දෙමාපියන් තමන් ජීවත්වන කාලය තුළ තමන්ට විසීම සඳහා එම ස්ථානයේ දූ, දරුවන් විසින් ඉඩකඩ ලබාදීම පිළිබඳ සැකය නිසා මෙම අර්බුදකාරී ස්වභාවය තුළ රැඳී සිටී. තවත් තැනක දරුවන්ගේ අකීකරුකම මත්පැන්පානය, වැනි හේතු මුල්කරගෙන ද ඉඩම් අයිතිය තහවුරු කර ගැනීමට නොහැකිව පසුවෙති.

කෙසේ වෙතත් ඉඩම පිළිබඳ පැහැදිලි නිරවුල් නිත්‍යානුකූල අයිතියක් නොපැවතීම එම සිදුවීමට පමණක් සීමාවී නොපවතී. පවුලේ සෙසු සංවර්ධන ක්‍රියාකාරකම් සඳහාද මෙහි බලපෑම විහිද පවතී.

මෙම පවුල් සියයට අයත් ඉඩම් වල ප්‍රමාණයද ඉතා සුළු වශයෙන් පවතී. එය පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වේ.

ඉඩම් ප්‍රමාණය.

වගු අංක 26

| ගම්මානය | පර් 20 අඩු | පර් 20 පර් 40 අතර | පර් 40 - 80 අතර | පර්චස් 80 වැඩි | එකතුව |
|---|---|---|---|---|---|
| ගොවියාපතන | 8 | 7 | 4 | 1 | 20 |
| වැල්අද්දරගොඩ | 11 | 5 | 1 | 3 | 20 |
| වැල්හේන්ගොඩ | 7 | 4 | 3 | 6 | 20 |
| පියදිගම(නැ) | 11 | 9 | - | - | 20 |
| මීපෙ | 9 | 6 | 5 | - | 20 |
| එකතුව | 46 | 31 | 13 | 10 | 100 |

මෙම වගුවට අනුව පවුල් 77 ක්ම (46 - 31) පර්චස් 40 අඩු ඉඩම් කැබලි හිමි අයවේ. භෞතික වශයෙන් ඉඩම මෙබඳු සුළු ප්‍රමාණයක් වීම. ඉඩකඩ පිළිබඳ හිඟය පමණක් නොව මානසික වශයෙන් සූක්‍ෂමව පවුලේ සංවර්ධනය පිළිබඳ සිතීමට කල්පනා කිරීමට ඇති ඉඩකඩද වසාදමා ඇත. මෙ අදහස මැනවින් ප්‍රකට වූයේ බොහෝ සුළු ඉඩම් ලාභින් වෙතින් ප්‍රකාශ වූයේ "වගා කරන්න අපිට ඉඩක් නෑ" යන්නයි. මෙම ඉඩම් කැබලිවල නිත්‍යානුකූල බවද පහත සඳහන් පරිදි වේ.

ඉඩම්වල නිත්‍යානුකූල බව

වගු අංක 27

| ගම්මානය | සින්නක්කර | බදු | රක්ෂිත අනවසර | එකතුව |
|---|---|---|---|---|
| ගොවියාපතන | 18 | 01 | - | 20 |
| වැල්අද්දරගොඩ | 11 | 01 | 08 | 20 |
| වැල්හේන්ගොඩ | 15 | 01 | 04 | 20 |
| පියදිගම | 18 | - | 02 | 20 |
| මීපෙ | 20 | - | - | 20 |
| එකතුව | 83 | 03 | 14 | 100 |

මේ අනුව පවුලේ සංවර්ධනයට අදාල මූලික සාධකයකසේ සැලකූ විට එහි නිත්‍යානුකූල අයිතිය සැමියා හා බිරිඳ සතුව නොපැවතිමත් ප්‍රමාණයෙන් ඉතා කුඩාව පැවතිමත් පවුලේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ භෞතික වශයෙන් මෙන්ම පවුල් මූලිකයන්ගේ මානසික බිඳවැටීම සඳහා බලපෑමක් සිදුකර ඇත. එහෙත් මූලික නිත්‍යානුකූල බව පවුල් 83 කටම හිමිව ඇත.

ඉඩම හා ගෙවත්ත ක්‍රමවත්ව පවත්වාගෙන යාම සහ සුළු වශයෙන් හෝ එමගින් ආදායමක් ලැබීමත් පිළිබඳ පවත්නා තත්ත්වයන් ඉහත අදහස සනාථ කරන්නක් විය. ක්‍රමවත්ව සැකසූ කිසියම් වගාවකට යොමුවූ ඉඩම් කැබලි සංඛ්‍යාව 17 කි. මෙම ඉඩම් ලාභි පවුල් මාසිකව තමන්ගේ වගා විලදාවෙන් රුපියල් 100 ත් 900 ත් අතර ආදායමක් ලබමින් සිටියහ. එමෙන්ම මෙම ඉඩම් කැබලි සියල්ල සැමියාගේ අයිතියට පත්වූ ඉඩම්හිමි පවුල් 42 කට අයත් වේ.

කෙසේ වෙතත් තවත් පැත්තකින් බලනවිට සැමියාට බිරිඳට අයිතිව පවතින ඉඩම් කැබලි 51 න් 34 ක්ම එබඳු විලදායි මෙන්ම ක්‍රමවත් බවකට යොමු නොවී පවතී. ඉඩමේ කුඩාබව සහ එම භෞතික තත්ත්වය තුළ ගොඩනැඟුණු පවුලේ මානසිකය ඒ පිළිබඳ එක් හේතු සාධකයක් වියහැක. එදිනෙදා ජීවත්වීම සඳහා ඉපයීම් කාර්යෙහි නිරතවීම තුළ එබන්දක් ගැන අවධානය යොමු නොවූ බවද තොරතුරු විග්‍රහයේදී ප්‍රකාශ කෙරුණි.

## අධ්‍යාපන තත්ත්වය

මෙම පවුල් සියයේ පාසැල් යායුතු වයසේ මුළු ළමුන් සංඛ්‍යාව 169 කි. මෙයින් ළමුන් 139 දෙනෙකුම දැනටමත් පාසැල් අධ්‍යාපන ක්‍රියාවලියේ නිරතව සිටි. උසස් පෙළෙන් එහා ඉහළ අධ්‍යාපනයට යොමු කිසිදු අයෙකු මෙම පවුල් සියය අතර නොවේ. අතරමඟ අධ්‍යාපනය

නතරවූ ළමුන් සංඛ්‍යාව 30 කි. මේ සඳහා වන හේතු විග්‍රහ කර ගන්නා ලද අතර, ඒවා පහත සඳහන් පරිදි වේ.

1. ආර්ථික වශයෙන් පවතින අපහසුතා
2. රැකියාවට යන නිසා කුඩා දරුවන් රැක බලා ගැනීමට ඇති පවුලේ අවශ්‍යතාව.
3. එම දරුවන්ගේම ඇති රෝගාබාධ තත්ත්වයන්
4. එක් පන්තියකදී අසමත්වීම නිසා ඇතිවන ලජ්ජාව හා උදාසීන බව ...
5. පාසැල් විනය නීති කඩා කිරීම හා දඬුවම් ලැබීම.
6. ප්‍රේම සබඳතා
7. බීමත්කම, සූදුව හා දෙමාපියන් අතර පවත්නා වෙනත් නොමනා තත්ත්වයන් නිසා පවතින ලැජ්ජාව.

මීට අමතරව මෙම පවුල් සියයේ කුඩා දරුවන් වශයෙන් වයස් අවුරුදු 5 ට අඩු ප්‍රමාණය වූ 42 අත්හලවිට ඉතිරි වැඩිහිටි සංඛ්‍යාව 254 කි. ඔවුන් සියළුමදෙනා වයස අවුරුදු 19 න් ඉහළ පාසැල් අධ්‍යාපනයෙන් පූර්ණ වශයෙන් සමුගෙන ඇතමුත් විවාහ දිවියට පත්ව, හෝ එසේ නැතුව හෝ ඉපයීම් කාර්යයෙහි නිරතවූවන් වේ. ඔවුන් නිමකළ අධ්‍යාපන තත්ත්වයන් පහත සඳහන් පරිදි දැක්වේ.

### වැඩිහිටියන්ගේ නිමවූ අධ්‍යාපන මට්ටම.

වගු අංක 2

| ගම්මානය | 2 ශ්‍රේණිය සිට 5 දක්වා | 6 - 8 දක්වා | සාමාන්‍ය පෙළ | උසස් පෙළ | එකතුව |
|---|---|---|---|---|---|
| ගොවියාපතන | 12 | 20 | 12 | 2 | 46 |
| වැල්අද්දරගොඩ | 19 | 28 | 6 | 3 | 56 |
| වැල්හේනගොඩ | 20 | 25 | 4 | 2 | 51 |
| පියදිගම නැ. | 20 | 27 | 4 | 2 | 53 |
| මීපෙ | 20 | 22 | 3 | 3 | 48 |
| එකතුව | 91 | 122 | 29 | 12 | 254 |

මෙම වගුවේ සඳහන් වන පරිදි 213 දෙනෙකුට ( 91 + 122) අටවන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූවන්ය. ලබා ඇති වෘත්තිය අවස්ථාවන් පිළිබඳ සලකා බැලූවිට ඒ සඳහා මූලික වශයෙන් අධ්‍යාපනික ඌණතාවයන් එක් හේතු සාධකයක් වශයෙන් බලපා ඇත. සමීක්ෂකයා හා කෙරුණු

සාකච්ඡා වලදී හෙළිදරව් වූ පරිදි මෙම වැඩිහිටියන්ගේ අධ්‍යාපනය අඩාලවීම සඳහාද පෙර සඳහන් කරන ලද හේතුම බලා ඇත. ඊට අමතරව රැකියා අවස්ථා, දෙමාපියන් මියයාම හා රෝගී වීම වැනි අතිරේක හේතූන්ද බලපා ඇත. වැඩිමනත් පිරිසකට බලපා ඇත්තේ විවාහ දිවියට ඇතුළුවීමයි.

මේ නයින් ඍජුවම පහල සමාජ ආර්ථික පරිසරය තුළ රැඳී සිටීම සඳහා අධ්‍යාපන ක්‍රියාවලිය දැඩි ලෙස බලා ඇතුවා පමණක් නොව වර්තමාන ළැවා දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාවලියේද ඊට වඩා සංවර්ධනාත්මක ස්වරූපයක් දක්නට නොමැත. පාසැල් හැරයන ළමුන් ප්‍රමාණය මෙන්ම අධ්‍යාපනික කටයුතුවල නිරතවූවන් පිළිබඳවද දෙමාපිය අවධානය විවිධ හේතු සාධක මත ප්‍රමාණවත් නොවීම නිසා උසස් පෙළින් එහාට යාම පිළිබඳ එතරම් විශ්වාසයක් තැබීම තරමක අපහසුවක්ව පවතී. විශේෂයෙන් පවුලේ ප්‍රධාන ආදායම් මාර්ගය, ප්‍රමාණවත් නොවීම ණය වීම හා වාරිග ගෙවීම්, නිවාස ඉදිකිරීම්, දිගුකාලීන අසනීප තත්ත්වයන් වැනි කරුණුද පදනම් වී මාපියන් හිමිකරගත් අධ්‍යාපන මට්ටමෙන් ඔබ්බට යාගත නොහැකි ස්වරූපයක මෙම දූවාදරුවන්ද පසුවේ.

## දහම් පාසැල් අධ්‍යාපනය හා නිවසේ ආගමික පරිසරය.

පාසැල් යන ළමුන් 169 දෙනාගෙන් 89 දෙනෙකුම දහම් පාසැල් අධ්‍යාපනය ලබමින් සිටිති. ඇතැම්විට එක් පවුලකින් තිදෙනා - දෙදෙනා හා එක් අයෙකු වශයෙන්ද මෙම 89 දෙනාගේ සංයුතිය ගොඩනැගී ඇත. නිවාස සියයෙන් 67 ක ළමුන් මේ අයුරින් දහම් පාසැල් අධ්‍යාපනය ලබමින් සිටිති.

නිවාස සියයෙන් 78 කම වැඳුම් පිදුම් සඳහා ස්ථානයක් පවත්වාගෙන යනු ලබති. එහෙත් බහුතරයක් ඉතාමත් අපිරිසිදුවටත් අක්‍රමවත් අන්දමින් හා නොසැලකිල්ලෙන් ඉටුකරන කාර්යයක් බවට පවත්ව ඇත. ඒ සඳහා යොදාගන්නා උපකරණ අපිරිසිදු තත්ත්වයේ පවතිනවාක් මෙන්ම ස්ථානයද එලෙසම අපිරිසිදුව පවතී. මෙම නිවාස 78 න් 43 කම මෙකී අසතුටුදායක තත්ත්වය පවතී. ඉතිරි 35 පැවැත්ම හා ක්‍රියාකාරීත්වය සතුටුදායකව පවතී.

## ඉතුරුම් හා ණය ක්‍රියාවලිය.

මෙම පවුල් සියය පහත සඳහස් පරිදි ඉතුරුම් හා ණය ක්‍රියාවලියේ දායකත්වය ලබා තිබුණි.

ඉතුරුම් හා ණය ක්‍රියාවලියේ පවුල් දායකත්වය

වගු අංක 29

| ගම්මානය | ඉතුරුම් දායකත්වය | ණය ක්‍රියාවලියේ දායකත්වය |
|---|---|---|
| ගොවියාපතන | 20 | 19 |
| වැල්අද්දරගොඩ | 18 | 16 |
| වැල්හේන්ගොඩ | 15 | 15 |
| පියදිගම | 16 | 18 |
| මීපේ | 20 | 15 |
| එකතුව | 89 | 83 |

ඉහත වගුවෙන් දැක්වෙන පරිදි පවුල් 89 ක් ඉතුරුම් ක්‍රියාවලියේ දායකත්වය ලබා තිබුණි. සැමියා, බිරිඳ, දරුවන්, වශයෙන් තිදෙනෙකු හෝ දෙදෙනෙකු හෝ නැත්නම් එක් අයෙකු ඉතුරුම් ක්‍රියාදාමයට දායක වී ඇත. මෙම ඉතුරුම් ගිණුම් ගමේ ප්‍රජා සංවිධානයක හෝ නගරයේ බැංකුවක පැවති අතර, වැඩිමනත් අවධානය යොමුව පැවතියේ ප්‍රජා සංවිධාන වෙත බව පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වේ.

පවුල් සාමාජික ඉතුරුම් ගිණුම්.

වගු අංක 30

| ඉතුරුම් ආයතනය | ගොවියාපතන | වැල්අද්දරගොඩ | වැල්හේන්ගොඩ | පියදිගම | මීපේ | එකතුව |
|---|---|---|---|---|---|---|
| මහජන බැංකුව | 1 | 1 | 1 | 6 | 1 | 10 |
| ලංකා බැංකුව | 1 | - | - | - | - | 1 |
| රුහුණු සංවර්ධන බැංකුව | - | 1 | - | - | - | 1 |
| ස.ණ.ස.සමිතිය | - | 2 | 2 | - | 5 | 9 |
| ධීවර සමිතිය | - | - | 3 | - | - | 3 |
| සමෘද්ධි සමිතිය | - | 6 | 4 | 4 | 6 | 20 |
| ඇග්‍රොමාට් පදනම | 1 | - | - | - | 1 | 2 |
| ගැමිකාන්තා සංවිධානය | - | - | - | - | 3 | 3 |
| සර්වෝදය සමිතිය | - | - | 1 | 1 | - | 2 |
| තේ ශක්ති සමිතිය | - | - | - | - | 1 | 1 |
| හබරාදුව සහභාගිත්ව සංවර්ධන පදනම | 19 | 11 | 12 | 14 | 9 | 65 |
| එකතුව | 22 | 18 | 21 | 23 | 23 | 117 |

පවුල් 89 සාමාජිකයන් 117 දෙනෙකුට අයත් මෙම ගිණුම් 117 න් 12 ක් පමණක් මහජන බැංකුව, ලංකා බැංකුව හා රුහුණු සංවර්ධන බැංකුව යන බැංකු තුනට අයත් වේ. ඉතිරි ගිණුම් 95 ක්ම ගමතුළ ප්‍රජා සංවිධාන වලට අයත් වේ. සාම්ප්‍රදායික බැංකු ක්‍රියාවලියෙන් දිළිඳු ප්‍රජාවගේ දුරස්ථබව තහවුරු කරන එක් අවස්ථාවක් ලෙස මෙය සඳහන් කළහැකිව ඇත.

සහභාගිත්ව දත්ත විග්‍රහයේදී ප්‍රකට වූ එක් සිද්ධියක්වූයේ බොහොමයක් ඉතුරුම් ගිණුම් කාන්තාවන් සතුව පවතින වගත් හුදෙක් ඒවා විවෘත කරනු ලැබූයේ ණය ක්‍රියාවලියට බද්ධවීම සඳහා අවශ්‍ය සාධකයක් වශයෙන් බවත්ය.

ඉතුරුම් ක්‍රියාවලියට පවුල් 89 ක් දායක වී සිටියද ණය ක්‍රියාවලියේ දායකත්වය පවුල් 83 කට සීමාවී තිබුණි. ඉතා පහල ආදායම් මට්ටමක පසුවූවද පවුල් 17 ක් ණය ක්‍රියාවලියෙන් මෑත්ව සිටියහ. තමන් ඉතා අපහසුවෙන් ගොඩනඟා ගන්නා ආර්ථිකය තුළ පවත්නා පවුලේ කටයුතු සඳහා ණය ගැනීම බාහිර බාධකයක් පවුලට ඇතුළුකර ගැනීමක් වශයෙන් සළකා සිටීමත් විශේෂයෙන් ණය ලබාගන්නා නව ආයෝජන අවස්ථාවන් පිළිබඳ මෙහෙයුමක් හෝ චින්තනයක් නොපැවතීමත් මේ පිළිබඳ හේතු සාධකයක් වශයෙන් හෙළිදරව් විය.

ණය ලබාගැනීමේදී ඉතුරුම් ගිණුම් ආරම්භකළ ආයතන වලට අමතරව පෞද්ගලික හිතවතුන් හා ඥාතීන්ගෙනුත්, පොලී මුදලාලි වෙතිනුත් ණය ලබාගෙන තිබුණි.

වගු අංක 30 දැක්වෙන පරිදි ප්‍රජා සංවිධාන අතුරින්ද ගිණුම් 65 ක සබඳතාවක් පවතින තබරාඳෑව සහභාගිත්ව සංවර්ධන පදනම මෙම ප්‍රජා කණ්ඩායම් සමඟ බද්ධවීම තුළ ඔවුනගේ ණය ක්‍රියාවලියේ පැවති ක්‍රමය වෙනසකට භාජනය වෙමින් පවතින වගට සාක්ෂි සටහන්ව පවතී. බැංකු වලින් මෙන්ම ප්‍රජා සංවිධාන වලින් ඉතා සුලභව ණය නිකුත් කරනු ලැබූයේ ඍජු ආදායම් වර්ධක කටයුතු සඳහා පමණි. මීට අමතරව නිවාස ඉදිකිරීම් හෝ ඊට අදාල කාර්යයයන්හිදී ඉතා සුළු ණය ප්‍රමාණයක් ලබා ගැනීමට සිදුවූ අතර ආදායම ප්‍රමාණවත් නොවීම ඊට බලපෑ ප්‍රධාන සාධකය විය. මේ නිසා හිතවතුන් හා පොලී මුදලාලි වෙත ගමන් කිරීම හැර වෙනත් විකල්පයක් නොවිනි. එහෙත් ඇතමුන් ප්‍රජා සංවිධාන වලත්, බැංකුවලත්, සබඳතා ඇතිව හිතවතුන්ගේ සහායෙන් වැඩි ණය මුදලක් ලබාගැනීමටද සමත්ව සිටියහ. එබඳු අවස්ථාවල ණය ලබාගැනීම කුමන මාතෘකාවක් සඳහා වුවද තමන්ට අවශ්‍ය පෞද්ගලික මූල්‍ය ක්‍රියාකරකම් වලට භාවිතා කිරීමටද පසුබට නොවූහ. මෙහිදී කිසිදු අපහසුතාවයක් කිසිවෙකුට සිදු නොවූයේ නියමිත ණය වාරිකය ඒ අයුරින්ම නියමිත වේලාවට අදාල ආයතනයට ලැබීම නිසාවෙනි. මෙම අවස්ථාව තුළ ප්‍රකට වූයේ ප්‍රජාවගේ පැහැදිලි ණය අවශ්‍යතා පසෙක තිබියදී ණය දෙන ආයතනවල අරමුණු ඉටුවන පරිදි ණය නිකුත්වූ වගයි. ආදායම් වර්ධනය සඳහා විශේෂයෙන්

දිළිඳු ප්‍රජාවගේ ආදායම් වර්ධනය සඳහා ඍජු අවස්ථා මෙන්ම වක්‍රව සැඟවුණු අවස්ථාවන්ද පවතී. ඒවා බොහෝවිට එක් එක් පවුලට පෞද්ගලික අවස්ථාවන් මෙන්ම සිද්ධීන්ද වශයෙන්ද පවතී. මේ නිසා ප්‍රජාමූලික ණය ක්‍රියාවලියකදී මූලික පදනම වියයුත්තේ සත්‍ය වශයෙන්ම දිළිඳු පවුල් ඉන් මුදවාගතහැකි ණය අවශ්‍යතා කවරේදැයි සොයාබලා ඒ සඳහා ණය මුදල් සම්පාදනය කිරීමයි. මේ සඳහා සෙවියයුතු බැලියයුතු අධ්‍යයනය කළයුතු අවස්ථා ගණනාවක් පවතින බව අමතක කළයුතු නොවේ. එසේ නොමැතිව ඕනෑම දෙයකට ණය යන සරල සිතුවිල්ල මෙම ක්‍රියාදාමය තුළ සනාථ නොවේ. මේ අනුව ඉහත පවුල් සියය අයත්වන ග්‍රාමීය ණය සංස්කෘතිය තුළ ඍජු ආදායම් වර්ධනය හා ඉඳිකිරීම් කටයුතු සඳහා සීමාවූ "ණය" ක්‍රියාවලිය පසුගිය දෙවසරක කාලය තුළ පුළුල්වීම තුළ පහත සඳහන් අංශ සඳහා ණය ලබාගැනීමට මෙම සාමාජිකත්වයට හැකියාව ලැබී තිබුණි.

- නිෂ්පාදන කටයුතු
- නිවාස ඉඳිකිරීම්
- පානීය ළිං, වැසිකිළි.
- විදුලිය ලබාගැනීම
- දරුවන්ගේ මංගල උත්සව
- අධ්‍යාපන කටයුතු
- අසනීප
- ණය බේරුම්කිරීම / උගස් නිදහස් කරවා ගැනීම්
- අවමංගල්‍ය උත්සව.

මෙම සැබෑ ප්‍රජා අවශ්‍යතාවයන් ණය ක්‍රියාවලිය සඳහා හඳුනාගැනීම ණය වාරික ආපසු අයකර ගැනීමේ පහසුව පමණක් නොව ණය මුදල් අර්ථවත් පරිදි පරිහරණය කරවීමේ අවස්ථාවද උදාකර තිබුණි. එමෙන්ම ක්‍රියාකාරීව ප්‍රජාවට ණයදෙන ආයතනය සමඟ අවංකවීමේ අවස්ථාවද උදාවී තිබුණි. මේ තත්ත්වය යටතේ ණය ක්‍රියාවලිය පවුලේ සංවර්ධනය පිළිබඳ උපකාරක අවස්ථාවක් ලෙස යොදාගත් නිසා දිළිඳුබව සඳහා මූලිකව බලපෑ ආර්ථික ක්‍රියාදාමයේ උන්නතිය පිළිබඳ ආරම්භයක්ද මෝදු වෙමින් පවතී.

මෙබඳු ආරම්භයක් නව ණය ක්‍රියාදාමය තුළ ජනිතවූවද සාම්ප්‍රදායිකව මෙම පිරිස අතර පැවති ණය ක්‍රියාවලියේ කල්ගතවූ අංග ලක්ෂණ තාමත් මෙම පිරිස තුළින් ඉවත්වී නොමැත. ඒ සඳහා වන එක් උදාහරණයක් වන්නේ මෙම පවුල් 83 ම එක් ස්ථානයකට වැඩි ස්ථාන සංඛ්‍යාවකින් විවිධ කාර්යයන් සඳහා ණය ලබා තිබීම හා ඒවා ගෙවමින් සිටීමයි. පහත සඳහන් වගුවෙන් පවුල් 83 ණය ලබාගත් ආයතන සංඛ්‍යාව ප්‍රකට කරනු ලබයි.

## ණය ලබාගත් ආයතන සංඛ්‍යාව (පවුල් )

වගු අංක 31

| | ගම්මානය | ආයතන - සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 01 | 02 | 03 | 04 | 05 | එකතුව |
| 1 | ගොවියාපතන | 02 | 04 | 04 | 05 | 04 | 19 |
| 2 | වැල්අද්දරගොඩ | 02 | 03 | 07 | 02 | 02 | 16 |
| 3 | වැල්හේන්ගොඩ | 01 | 03 | 03 | 04 | 04 | 15 |
| 4 | පියදිගම | 02 | 02 | 07 | 03 | 04 | 18 |
| 5 | මීපෙ | 02 | 01 | 03 | 05 | 04 | 15 |
| | එකතුව | 09 | 13 | 24 | 19 | 18 | 83 |

මේ තත්ත්වය යටතේ එක් පවුලක් විසින් මාසිකව ණය වාරික සඳහා ගෙවියයුතු මුදල පවුලේ පිරිවැය ලැයිස්තුවේ ඉහලින්ම පවතී. ඇතැම් පවුල්වල සම්පූර්ණ ආදායමෙන් අඩක් ණය වාරික සඳහාත් ඉතිරි අඩ ආහාරපාන සඳහාත් දැරීමෙන් පසු ඉතිරි කටයුතු සඳහා නැවත අතමාරු හා සුළු ණය පහසුකම් ලැබියයුතු තත්ත්වයට පත්ව ඇත. ගෘහ තොරතුරු විමසුමේදී හෙළිදරව්වූ පරිදි ණය ලබා සිටි පවුල් 83 මාසිකව ණය වාරික වශයෙන් ගෙවියයුතු මුදල් ප්‍රමාණයන් කාණ්ඩ වශයෙන් පහත සඳහන් පරිදි වගුගත කළහැකිය.

## ණය හා පොලි වාරික ගෙවීම් සඳහා පවුල්වල මාසික වෙන්කිරීම් ප්‍රමාණයන්.

වගු අංක 32

| | ගම්මානය | 1000 ට අඩු | 1001 සිට 2000 දක්වා | 2001 සිට 3000 දක්වා | 3001 සිට 4000 දක්වා | 4001 සිට 5000 දක්වා | 5000 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 4 | 6 | 2 | 4 | 2 | 1 | 19 |
| 2 | වැල්අද්දරගොඩ | 5 | 7 | 3 | 1 | - | - | 16 |
| 3 | වැල්හේන්ගොඩ | 4 | 6 | 2 | 1 | 1 | 1 | 15 |
| 4 | පියදිගම | 5 | 7 | 1 | 1 | 2 | 2 | 18 |
| 5 | මීපෙ | 4 | 3 | 4 | 2 | 1 | 1 | 15 |
| | එකතුව | 22 | 29 | 12 | 9 | 6 | 5 | 83 |

ඉහත වගුවෙන් දැක්වෙන මාසික වාරික ගෙවීම් සළකාබැලිය යුත්තේ මෙම පවුල්වල මූලික හා අමතර ආදායම් මාර්ග වලින් පවුලට ලැබෙන මුළු ආදායම් ප්‍රමාණය සැළකිල්ලට ගනිමිනි. ආදායම් කාණ්ඩ වශයෙන් වගු අංක. 23 දැක්වෙන්නේ මෙසේය (පවුල් සියයම)

| | |
|---|---|
| 2500 - 5000 | 54 |
| 5001 - 7500 | 27 |
| 7501 - 10000 | 19 |
| එකතුව | 100 |

මේ අයුරින් ස්ථාන ගණනාවකින් ලබාගත් ණය හා පොලී වාරික කිපයක් ගෙවීම් නිසා දැවැන්ත මූල්‍ය අර්බුදයකට මෙම පවුල් සියයේ බහුතරය මුහුණපා සිටී. මෙහි පවත්නා තත්ත්වය තවත් තිව්‍ර කරන්නක් වන්නේ ඔවුන් ඉදිරියට ගෙවියයුතු පවුලේ සියළුම ණයවල එකතුවද විශාලව පැවතිමයි.

ණයලාභි පවුල් ඉදිරියට ගෙවියයුතු ණය මුදල් ප්‍රමාණයන්
කාණ්ඩ වශයෙන්

වගු අංක 33

| | ගම්මානය | 3000 - 5000 | 5001 - 10000 | 10001 - 20000 | 20001 - 30000 | 30001 - 40000 | 40000 ත් එහා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 4 | 4 | 9 | 2 | - | - | 19 |
| 2 | වැල්අද්දරගොඩ | 3 | 3 | 4 | 4 | 2 | - | 16 |
| 3 | වැල්හේන්ගොඩ | 3 | 3 | 3 | 3 | 1 | 2 | 15 |
| 4 | පියදිගම | 2 | 4 | 6 | 6 | - | - | 18 |
| 5 | මීපෙ | 2 | 4 | 7 | 2 | - | - | 15 |
| | එකතුව | 14 | 18 | 29 | 17 | 3 | 2 | 83 |

ආයතන ගණනාවකින් මෙන්ම පොලී මුදලාලිගෙන්ද හිතවතුන්ගෙන්ද ලබාගෙන ඇති මුදල් සියල්ල මෙම කාණ්ඩ වලට ඇතුලත්ව ඇත. හිතවතුන්ගෙන් ලබාගත් ණය හැර අනෙකුත් සියළුම ණය සඳහා මාසිකව 3% - 10% ත් අතර පොලී ප5මාණයක්ද මෙම ණයලාභින් ගෙවමින් සිටී. ණය ක්‍රියාවලිය තුළ මෙබඳු අසීරුතත්ත්වයකට පත්වූවද එමෙන්ම එම ක්‍රියාවලිය සඳහාම යෝග්‍යතාවයක් ලෙස ඉතුරුම් ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබූවද, ඉතුරුම් ගිණුම්වල ශේෂ තත්ත්වයන් ඉතා සතුටුදායකව පවති. ඉතුරුම් මුදල් ප්‍රමාණයන් කාණ්ඩ වශයෙන් වර්ග කළවිට ජට දායකවී සිටින පවුල් 89 ඉතුරුම් තත්ත්වයන් පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වේ.

ඉතුරුම් ක්‍රියාවලියට දායකවූ පවුල් 84 ඉතුරුම් තත්ත්වයන්.

වගු අංක 34

| | ගම්මානය | 1000 සිට 5000 සිට | 5001 - 10000 | 10001 - 20000 | 20001 - 30000 | 30001 - 40000 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 2 | 12 | 4 | 1 | 1 | 20 |
| 2 | වැල්අද්දරගොඩ | 3 | 4 | 7 | 4 | - | 18 |
| 3 | වැල්හේන්ගොඩ | 1 | 6 | 7 | 1 | - | 15 |
| 4 | පියදිගම | 2 | 8 | 3 | 3 | - | 16 |
| 5 | මීපෙ | 2 | 5 | 8 | 4 | 1 | 20 |
| | එකතුව | 10 | 35 | 29 | 13 | 2 | 89 |

මෙම පවුල් 89 සතු ඉතුරුම් ගිණුම් 107 සැමියා, බිරිඳ හෝ දරුවන් යන කවරෙකුගේ හෝ නමින් පවතී. පහත සඳහන් වගුව තුළ ඉතුරුම් ගිණුම් හිමියන් කවුරුන්ද යන්න ප්‍රකාශ වේ.

ඉතුරුම් ගිණුම් හිමියන් වර්ගීකරණය.

වගු අංක 35

| | ගම්මානය | සැමියා | බිරිඳ | දරුවන් | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 2 | 18 | 2 | 22 |
| 2 | වැල්අද්දරගොඩ | 2 | 14 | 2 | 18 |
| 3 | වැල්හේන්ගොඩ | 2 | 13 | 6 | 21 |
| 4 | පියදිගම | 3 | 17 | 3 | 23 |
| 5 | මීපෙ | 1 | 19 | 3 | 23 |
| | එකතුව | 10 | 81 | 16 | 107 |

ඉතුරුම් ගිණුම් සංඛ්‍යාවෙන් වැඩිම සංඛ්‍යාව වූ 81 ක හිමිකරුවන් බවට පත්ව ඇත්තේ කාන්තාවන්ය. විශේෂයෙන් මෙම ගිණුම් බහුතරය ප්‍රජා සංවිධානවල මූල්‍ය ක්‍රියාදාමයේ පවතින ගිණුම් වේ. දිළිඳුබව අවම කර ගැනීමේ වැඩසටහන්වල පවත්නා කාන්තා දායකත්වයේ වැඩි නැඹුරුව මෙම ගිණුම් සංඛ්‍යාව ඉහළ ප්‍රතිශතයක පැවතීමට හේතුවී ඇත. එමෙන්ම බහුතරයක් ගිණුම් විවෘත කරනු ලැබ ඇත්තේ ණය ක්‍රියාවලියේ මූලාරම්භය වශයෙනි. මෙයින් ගම්‍යවන එක් වැදගත් කරුණක් වන්නේ කාන්තාව පවුලේ සංවර්ධනය පිළිබඳ වැඩි වගකීමක් දරමින් කටයුතු කරන අයෙකු බවට පත්ව ඇති බවයි.

කාන්තා හා පුරුෂ වර්ගීකරණයේ සමබරතාවය පවුලේ සංවර්ධනය පිළිබඳ දැඩිසේ බලපාන්නක් බැවින්, ඒ පිළිබඳ අවධානය යොමුකිරීම් සඳහාද මෙම ඉතුරුම් හා ණය ක්‍රියාවලිය කිසියම් ඇඟවීමක් කරනු ලබයි.

## වියදම් රටාව හා පාරිභෝජන ක්‍රියාවලිය

පවුලේ ආදායම් වියදම් ක්‍රමවත් ලෙස සටහන් තැබීමක් මෙන්ම ඒවා නිසිලෙස නඩත්තු කරගෙන යාමත්, බහුලව මුහුණපා සිටින ආදායම් ප්‍රමාණවාත් නොවීම මෙන්ම වියදම් ඉහළ ගොස් තිබීම පිළිබඳ කළයුතු ක්‍රියාකාරකම් හඳුනාගැනීම සඳහා අවශ්‍ය කරන ආදායම් වියදම් විග්‍රහකර බැලීමක්, සැසඳීමක් කිසිදු පවුලක දක්නට නොලැබුණි.

සෑම පවුලකම වියදම් තීරුවේ ඉතා ඉහළම වියදම "ආහාරපාන" සඳහා විය. ඇතැම්විට ලැබෙන ආදායම් සම්පූර්ණයෙන් ඉන් අඩක් ඉන් හතරෙන් පංගුවක් තුනෙන් පංගුවක් ආදි වශයෙන් වර්ග කළහැකි පරිදි ආහාරපාන සඳහා වන වියදම් දක්නට ලැබුණි. පවුල් සියය පිළිබඳ සළකා බැලුවිට ආහාරපාන සඳහා වන වියදම මුදල් කාණ්ඩ වශයෙන් පහත සඳහන් පරිදි වගුගත කළහැකිය.

ආහාරපාන සඳහා වියදම කාණ්ඩ වශයෙන්

වගු අංක 36

| | ගම්මානය | 2500 - 35000 | 3501 - 4500 | 4501- 5500 | 5501 - 6000 | 6001 - 7000 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 6 | 6 | 3 | 4 | 1 | 20 |
| 2 | වැල්අද්දරගොඩ | 8 | 4 | 4 | 4 | - | 20 |
| 3 | වැල්හේන්ගොඩ | 5 | 6 | 5 | 3 | 1 | 20 |
| 4 | පියදිගම | 10 | 4 | 3 | 3 | - | 20 |
| 5 | මීපෙ | 6 | 7 | 4 | 3 | - | 20 |
| | එකතුව | 35 | 27 | 19 | 17 | 2 | 100 |

සාම්ප්‍රදායික සමීක්ෂණ ක්‍රියාවලියකින් බැහැරව සහභාගිත්ව මූලධර්ම අනුගමනය කරමින් කරන ලද (ඇමුණුම් අංක ) විමසුම් ක්‍රියාවලියකින් මෙම දත්ත රැස්කර ගැනීමට කටයුතු කළ නිසා පවුල්වල ආහාරපාන පිළිබඳ සිදුවන සත්‍ය වියදම් තත්ත්වයම අනාවරණය වී ඇත.

වියදම් ක්‍රියාවලියේ දෙවන අංකයට හෝ ඇතැම් පවුල්වල සමාන මට්ටමකින් පැවතියේ ණය වාරික හා පොලී වාරික ගෙවීමේ කාර්යයයි. මීට අමතරව අධ්‍යාපන, අසනීප සඳහා දරණ වියදම් සමාන මට්ටමකින් පැවති අතර, විදුලිය හෝ ආගමික කටයුතු සඳහා දරණ සුළු වියදම් ඊළඟ අවස්ථාව වශයෙන් දැක්වේ. ආදායම් වියදම් තුළනය පිළිබඳ මෙබඳු අර්බුදකාරී තත්ත්වයක් පැවතියද බුලත්විට, දුම්පානය හා මත්පැන් සඳහා ඔරොත්තු නොදෙන වියදමක් දැරීම පවුල් බහුතරයකගේ වියදම් හුරුවක් බවට පත්ව තිබුණි. එම වියදම් පහත සඳහන් අයුරින් වගුගත කළහැකිය.

මත්පැන් දුම්වැටි හා බුලත්විට සඳහා වියදම් කාණ්ඩ - පවුල් වශයෙන්
වගු අංක 37

| | ගම්මානය | 100 ට අඩු | 101 - 500 | 501 - 1000 | 1001 - 1500 | 1501 - 2000 | 2000 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 02 | 07 | 01 | - | - | - | 10 |
| 2 | වැල්අද්දරගොඩ | 02 | 05 | 04 | 01 | 02 | 02 | 16 |
| 3 | වැල්හේන්ගොඩ | 01 | 03 | 05 | - | - | - | 09 |
| 4 | පියදිගම | 03 | 04 | 01 | 02 | - | - | 10 |
| 5 | මීපෙ | 02 | 03 | 05 | 02 | 01 | - | 13 |
| | එකතුව | 10 | 22 | 16 | 05 | 03 | 02 | 58 |

මේ අනුව පවුල් 58 ක් තම පවුලේ වියදම් රටාව තුළින් මත්පැන්, දුම්වැටි හා බුලත් විට සඳහාද හුරුපුරුදු වියදම් තිරුවක් ගොඩනඟාගෙන ඇත.

පෙර සඳහන් කළ පරිදි වියදම් රටාවේ ඉහළම ප්‍රතිශතය පාරිභෝජන ද්‍රව්‍ය ලබාගැනීම සතුව පවතී. මෙම පාරිභෝගික ද්‍රව්‍ය ලබාගැනීමේ කාලසීමාව හා ලබාගන්නා ස්ථානයද මෙම වියදම් රටාවේ අවාසිදායක තත්ත්වය හඳුනාගැනීම සඳහා වැදගත් සාධකයෝ වෙති. ගෘහ තොරතුරු විමසුමේදී හඳුනාගන්නා ලද පරිදි මෙම පවුල් සියය දිනපතා, සතිපතා, මාස්පතා වශයෙන් තමන්ගේ පාරිභෝගික ද්‍රව්‍ය ලබාගනී. ඒ පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වේ.

පාරිභෝගික ද්‍රව්‍ය ලබාගැනීම කාලවකවානු.

වගු අංක 38

| | ගම්මානය | දිනපතා | සතිපතා | මාස්පතා | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | 8 | 6 | 6 | 20 |
| 2 | වැල්අද්දරගොඩ | 20 | - | - | 20 |
| 3 | වැල්හේන්ගොඩ | 10 | 7 | 3 | 20 |
| 4 | පියදිගම | 14 | 3 | 3 | 20 |
| 5 | මීපෙ | 15 | 4 | 1 | 20 |
| | එකතුව | 67 | 20 | 13 | 100 |

මේ අයුරින් පාරිභෝගික ද්‍රව්‍ය ලබාගන්නා කාලසීමාවන් මෙන්ම මීට බද්ධව ඇති අනෙකුත් අවස්ථාව වන්නේ ලබාගන්නා ස්ථානයයි. පාරිභෝගික ද්‍රව්‍ය ලබාගන්නා ස්ථාන පිළිබඳ තොරතුරු පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ කෙරේ.

පාරිභෝගික ද්‍රව්‍ය ලබාගන්නා ස්ථාන.

වගු අංක 39

| | ගම්මානය | ස.තො.ස. හෝ සමුපකාරය | ගමේ පිහිටි අසල්වැසි වෙළඳසැල | ළඟම නගරය | එකතුව |
|---|---|---|---|---|---|
| 1 | ගොවියාපතන | - | 9 | 11 | 20 |
| 2 | වැල්අද්දරගොඩ | - | 20 | - | 20 |
| 3 | වැල්හේන්ගොඩ | - | 12 | 8 | 20 |
| 4 | පියදිගම | - | 11 | 9 | 20 |
| 5 | මීපෙ | - | 18 | 2 | 20 |
| | එකතුව | - | 70 | 30 | 100 |

සමුපකාර හා සතොස වලින් පාරිභෝගික ද්‍රව්‍ය සියල්ල ලබානොගත්තද, සමෘද්ධිලාභී පවුල් 36 ක් එම කාඩ්පතට හිමි පාරිභෝගික ද්‍රව්‍ය පමණක් ගමේ සමුපකාර ප්‍රාදේශිකයෙන් ලබාගනී. වගු අංක 38 දැක්වෙන පරිදි පවුල් 67 ක්ම දිනපතා තමන්ගේ පාරිභෝගික ද්‍රව්‍ය ලබාගනී. මෙම සංඛ්‍යාව අනිවාර්යෙන්ම අංක 39 වගුවේ "ගමේ පිහිටි අසල්වැසි වෙළඳසැලෙන්" තීරුවේ 70 ට ඇතුලත් වේ. තවත් සතිපතා ලබාගන්නා පවුල් තුනක්ද මීට ඇතුලත් වේ.

නගරයෙන් ලබාගන්නා පවුල් සංඛ්‍යාව 30 ක් වුවද මාස්පතා ලබාගන්නා පවුල් සංඛ්‍යාව 13 කි. විශේෂයෙන් මෙම ගම්මාන වලින් මීපෙ හැරෙන්නට අනෙකුත් ගම්මාන අභංගම නගරයට නුදුරින් නිසා සතිපතා, මාස්පතා, ලබාගන්නා බොහෝ දෙනෙක්ද මෙම ආසන්න නගරයෙන් පාරිභෝගික ද්‍රව්‍ය ලබාගනී.

කෙසේ වෙතත් දිනපතා ලබාගැනීම හා ආසන්නම වෙළඳසැලෙන් ලබාගැනීම සඳහා යොමුවීමේ මූලික හේතු සාධකය අතමිට මුදල් හිඟකම වුවත්, මේ නිසා තමන් සතුව ඇති මුදලේ නියම වටිනාකම පාරිභෝජන ක්‍රියාවලිය හරහා ලබා ගැනීමට මෙම පවුල් 70 අසමත්ව සිටිති. තමන් ලබාගන්නා පාරිභෝගික ද්‍රව්‍ය පිළිබඳ ගම සහ නගරය අතුරින් සිල්ලර හා තොග වශයෙනුත් පවත්නා වෙනස්කම් පිළිබඳ සොයා බැලීමකට හෝ සළකා බැලීමකට, කථාබහකට අවස්ථාවක් මෙම පිරිස තුළ තාමත් ගොඩනැඟී නැත. එමෙන්ම ණයට / පොතට බඩු ලබාගන්නා නිසාද අසල්වැසි දන්නා හඳුනන වෙළඳසැල සමඟ පමණක් ගනුදෙනු කිරීමටද මෙම පිරිසට සිදුව ඇත. එම සබඳතාවයෙන් අත්මිදීමේ හැකියාවක් මෙන්ම ඊට වෙනස් මඟක් දැකීමේ හැකියාවක්ද මෙම පිරිසට නොවේ. ආර්ථික වශයෙන් පවත්නා බරපතල ඌණතාවය මඟින් එබඳු අවස්ථා මතුවීමට ඇති සියළු ඉඩකඩ අහුරා දමා ඇත. එම නිසා මෙම පාරිභෝජන ක්‍රියාවලිය තුළින් ගම්‍යවන එක් වැදගත් සිද්ධියක් වන්නේ දිළිඳු ප්‍රජාව තවදුරටත් ඒ තුළ රඳවා තැබීමට නැතහොත් ඔවුන්ගේ හිමිකම් නොලැබී යාමට, ආදායම අවම කිරීමට මෙම පාරිභෝජන ක්‍රියාවලිය තුළ ප්‍රබල ඉඩකඩක් පවතින වගයි.

## ගෘහ භාණ්ඩ අයිතිය පිළිබඳ තත්ත්වයන්

ගෘහ තොරතුරු විමසුමේදී හෙළිදරව්වූ පරිදි මෙම නිවාස සියයේ ගෘහභාණ්ඩ අයිතිය පිළිබඳ අංශ කිපයකට සාරාංශ කර කරුණු සළකා බලන ලදි. මූලික වශයෙන් නිවැසියන් සතු රන්භාණ්ඩ (මාල - මුදු - කරාබු හා වෙනත්) ගෘහ භාණ්ඩ (මේස, පුටු අල්මාරි, ඇඳන්, කබඩ්, දැව ලෝහ, ප්ලාස්ටික් වලින් නිමවූ) යතුරු පැදි හා පාපැදි රූපවාහිනිය හා රේඩියෝව යන මූලික ගෘහ භාණ්ඩ වල අයිතිය පමණක් මෙහිදී විමසුමට ලක්කරන ලදි.

පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ වන්නේ ඒ ඒ භාණ්ඩ කාණ්ඩවල අයිතිය හිමිවූ නිවැසියන් කවුරුන්ද යන්නයි. මෙහිදී ඇතැම් භාණ්ඩවල අයිතිය මෙම කාණ්ඩ තුනටම තිබිය හැක. විශේෂයෙන් රන්බඩු හා ලීබඩුවලදී මෙම තත්ත්වය පවතී. ඇතැම් විට මෙම අයිතින් නොමැති නිවාසද පවතී.

ගෘහභාණ්ඩ අයිතිය

වගු අංක 40

| භාණ්ඩ වර්ගය | බිරිඳ | සැමියා | දරුවන් හෝ වෙනත් |
|---|---|---|---|
| රන්බඩු | 63 | 3 | 11 |
| ලීබඩු | 67 | 35 | 05 |
| යතුරුපැදි/පාපැදි | 03 | 20 | 02 |
| රූපවාහිනිය | 13 | 22 | 02 |
| රේඩියෝව | 09 | 12 | 02 |

රන්බඩුවලදී ඒවා බහුලව කාන්තා ආභරණ නිසා කාන්තාවන් 63 දෙනෙකු සතුව පවතී. එහෙත් පිරිමි තිදෙනෙකුටද ළමුන් හා විස්තෘත පවුල්වල සාමාජිකයන් 11 දෙනෙකුටද ඒවා අයිතිව පවතී. විශේෂයෙන් මෙයින් පවුල් 32 ක්ම තමන් සතු රන් භාණ්ඩ බැංකුවක හෝ වෙනත් අයෙකු ළඟ උගස්කර මුදල් ලබාගෙන තිබීම සැලකිය යුතු අවස්ථාවකි. කෙසේ වෙතත් පවුලේ ආර්ථික කටයුතු වලදී වැඩි වගකීමක් දරණ මෙම කාන්තාවන්ට තමන් සතු රන්භාණ්ඩ තිබීම ප්‍රබල ආර්ථික අස්වැසිල්ලක් වී ඇති බව ඔවුන් ඒවා පරිහරණය කර ඇති ස්වරූපය තුලින් හෙළිදරව් වේ.

ගෘහයේ භාවිතයට අවශ්‍ය ලී වලින් ලෝහ වලින් හෝ ප්ලාස්ටික් වලින් නිමවූ භාණ්ඩ පිළිබඳ සළකා බැලීමේදී ඉතා ඉහළ අයිතියක් කාන්තාවන් සතුව පවතී. මේ පිළිබඳ විමසුම් ක්‍රියාවලියේදී හෙළිදරව් වූයේ පවුලේ ආර්ථිකය හැසිරවීමේ වගකීම ඇය දරණ නිසා මෙම භාණ්ඩ ඇය විසින්ම ලබාගෙන ඇති වගයි. සාම්ප්‍රදායිකව ස්වාමි පුරුෂයා සතුව පැවති මෙම භාණ්ඩ අයිතිය පිළිබඳ වෙනස් ස්වරූපයක් මෙහි දක්නට හැකි අතර, එය ආර්ථිකය හා බැඳුණු ක්‍රියාදාමයකි.

යතුරුපැදි භාවිතා කිරීමේ ස්වරූපය මත පිරිමි පක්ෂය වෙත ඒවායේ අයිතිය පැවතියද කාන්තාවන් තිදෙනෙකුද යතුරුපැදිවල අයිතිකරුවන් වී සිටී. ආදායම් උත්පාදන කටයුතු සඳහා ණය ලබා එයින් මෙම යතුරුපැදි මිළදී ගෙන තිබීම ඒ සඳහා හේතු වී ඇත.

රූපවාහිනි සහ රේඩියෝ වලද අයිතිය පිරිමි පක්ෂයට අමතරව කාන්තාවන් සතුව පවතින්නේ පවුලේ ආර්ථික ක්‍රියාවලිය හා එහි පවත්නා ඒකාබද්ධ තාවය මතයි.

## ප්‍රජාසංවිධානවල දායකත්වය

මෙම පවුල් සියයේ සැමියා බිරිඳ මෙන්ද ඇතැම්විට දරුවන්ද ගමේ පිහිටි ප්‍රජා සංවිධාන ගණනාවක සාමාජිකත්වය දරණ අතර, ඇතැම් අවස්ථාවල ප්‍රධාන නිල තනතුරු වලටද කාරක සභික තනතුරු වලටද පත්ව සිටිති. ඒ පිළිබඳ තොරතුරු පහත සඳහන් වගුවෙන් ප්‍රකාශ කෙරේ.

ප්‍රජා සංවිධාන දායකත්වය

වගු අංක 41

| | ප්‍රජා සංවිධානය | ප්‍රධාන තනතුරු | | | කාරක සභික | | | සාමාජිකත්වය | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සැමියා | බිරිඳ | දරුවන් | සැමියා | බිරිඳ | දරුවන් | සැමියා | බිරිඳ | දරුවන් | |
| 1 | හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම | - | 7 | - | - | 3 | - | - | 90 | - | 100 |
| 2 | සමෘද්ධි සමිතිය | - | 3 | - | - | - | - | 2 | 28 | - | 33 |
| 3 | මරණාධාර/ශුභසාධක සමිති | 4 | - | - | - | - | - | 7 | 9 | - | 20 |
| 4 | ස.ණ.ස.සමිතිය | - | - | - | - | - | - | - | 12 | - | 12 |
| 5 | ඇග්‍රොමාට් සමිතිය | - | 2 | - | - | - | - | - | 7 | - | 9 |
| 6 | ගැමි කාන්තා සංවිධානය | - | 3 | - | - | - | - | - | 6 | - | 9 |
| 7 | ග්‍රාමසංවර්ධන සමිතිය | - | 2 | - | - | - | - | - | 3 | - | 5 |
| 8 | කාන්තා කාර්ය සමිතිය | - | - | - | - | - | - | - | 6 | - | 6 |
| 9 | සර්වෝදය සමිතිය | - | 1 | - | - | - | - | - | 2 | - | 3 |
| 10 | ධීවර සමිතිය | 1 | - | - | - | - | - | - | - | - | 1 |
| 11 | පාසැල් සංවර්ධන සමිතිය | - | 1 | - | - | - | - | - | 1 | - | 2 |
| 12 | ජේ ශක්ති සමිතිය | - | - | - | - | - | - | - | 1 | - | 1 |
| 13 | ඉසුරු සමිතිය | - | 1 | - | - | - | - | - | 3 | - | 4 |
| 14 | දායක සභාව | - | - | - | - | 1 | - | - | - | - | 1 |
| | එකතුව | 05 | 20 | - | - | 4 | - | 9 | 168 | - | 206 |

ප්‍රජාසංවිධාන වල සාම්ප්‍රදායික සුබසාධක ආකෘතිය වෙනසකට පරිවර්තනය වෙමින් කාලීන සමාජ ගැටළු වලට විසඳුම් සෙවීම් වස් දිළිඳුබව අවම කරලීමේ කි5යාදාමයට දායකවී සිටින නිසා මෙම පවුල් සියයේද ප්‍රජා සංවිධාන දායකත්වය සතුටුදායක මුහුණුවරකින් පවතින බව ඉහත වගුවෙන් ප්‍රකට වේ.

ප්‍රජා සංවිධාන 14 ක දත්තයන් මෙහිදී විමසුමට ලක්වී ඇත. එම සංවිධාන 14 ප්‍රධාන නිල වලින් තනතුරු 25 ක් මෙම ප්‍රජා කණ්ඩායමට අයත්ව ඇත. මෙයින්ද 20 කාන්තාවන් වීම තවත් විශේෂත්වයකි. තමන්ගේ දිළිඳු ප්‍රජා කණ්ඩායම වෙනුවෙන්ද වගකීම් දැරීමට ඇය යොමුව සිටී. වගකීම් දැරීම හා දරා ගැනීමේ ශක්තිය පිළිබඳව පුරුෂයාට වඩා ඉදිරියෙන් සිටීමේ ප්‍රායෝගික හැකියාවක් ඇය සතුව පවත්නා වග මෙයින් හෙළිදරව් වේ.

සාමාජිකත්වය ඇතුළු අනෙකුත් නිල සබඳතා සියල්ල 206 කි. මෙයින් 192 ක්ම කාන්තාවන් වේ. පවත්නා සංවිධාන සියල්ල කාන්තාවන් සඳහා වෙන්වූ සංවිධානද නොවේ. සංවිධාන තුනක් හැරුණුවිට අනෙක් සෑම සංවිධානයකම ස්ත්‍රී පුරුෂ භේදයක් නොපවතී. එහෙත් මෙම ප්‍රජා සංවිධානවල දායකත්වය පිළිබඳ වැඩි වගකීම කාන්තාවන් අත්පත් කර ගෙන සිටී.

## සැමියා හා බිරිඳ සඳහාවූ පළමු පුහුණු වැඩමුළුව

### පෙරසුදානම

දිළිඳු පවුල් සඳහා මෙම ගෘහ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී දිළිඳු ප්‍රජාව වෙනුවෙන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ප්‍රජා සංවිධානයක් හෝ වෙනත් ඕනෑම සංවර්ධන ආයතනයක් මූලික වශයෙන් හඳුනාගත යුතුවේ. එසේ හඳුනාගත් ආයතනයේ දිළිඳු පවුල් සඳහා වන සංවර්ධන ක්‍රියාවලිය් වඩාත් ඵලදායි යථාර්ථවාදී ක්‍රියාදාමයක් බවට පත්කරලීම සඳහා මෙම පවුල් කළමනාකරණ වැඩසටහන යොදා ගැනේ. ඒ අනුව මෙම නියාමක, ගවේෂණ ක්‍රියාවලියේ ක්‍රියාකාරී හා අනුග්‍රාහක ආයතනය ලෙස ගාල්ල දිස්ත්5ක්කයේ හබරාඳූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි හබරාදූව සහභාගිත්ව සංවර්ධන පදනම හඳුනා ගැනුනි. එම ආයතනයේ ගම්මානවල කටයුතු කරනු ක්ෂේත්‍ර සහායිකාවන්ගේ සහායෙන් මූලික වශයෙන් ගම්මාන පහක් හඳුනා ගන්නා ලදී. ගොවියාපන - වැල්අද්දරගොඩ - වැල්හේන්ගොඩ - පියදිගම (නැ) මීපෙ යනුවෙන් හැඳින්වෙන මෙම ගම්මාන පහ තුළ වෙසෙන දිළිඳු පවුල් සියයක් (එක් ගමකින් පවල් 20) මෙම ගවේෂණ ක්‍රියාදාමය සඳහා තෝරාගන්නා ලදී. අදාල ක්ෂේත්‍ර සහායිකාව මේ වනවිටත් ග්‍රාමීය සංවිධානය තුළින් හඳුනාගෙන සිටී. දිළිඳු පවුල් මේ සඳහා සහභාගි කරවාගන්නා ලදී. පුහුණු වැඩමුළුවට සහභාගි වීමට පෙර එම පවුල් පෞද්ගලිකව හමුවූ ක්ෂේත්‍ර සහායිකාව පුහුණු වැඩමුළුවේ ස්වභාවය පිළිබඳ ඔවුන් හා සාකච්ඡා කරන ලදී. විශේෂයෙන් සැමියා හා බිරිඳ එක්ව පුහුණු වැඩමුළුවේ අසුන්ගතයුතු බවත් විවාහයෙන් ඇරඹෙන පවුලේ කථා පුවත ප්‍රකාශ කළයුතු වගත්, පවුලේ පවත්නා ගැටළු විශේෂයෙන් සැමියා හා බිරිඳ අතර පවත්නා ස්වභාවයන් මෙන්ම ජීවත්වීම සඳහා ගන්නා උත්සාහයන්ද වැඩමුළුව තුළදී ප්‍රකාශ කළයුතු බව මෙම සාකච්ඡාවේදී අනාවරණය කර ගැනුනි.

මේ තත්ත්වය යටතේ කිසිදාක නොපැවති භෞතික සූදානමකින් මෙන්ම, මානසික සූදානමකින්ද යුතුව සැමියා හා බිරිඳ එක්ව පුහුණු වැඩමුළුව තුළ එකිනෙකා ළඟ අසුන් ගැනීම පුහුණු වැඩමුළුවේ පැවති සුවිශේෂත්වයක් විය.

## පුහුණු වැඩමුළුවේ සමස්ත අරමුණු

පවුලේ මූලික වගකීම දරණ සැමියා හා බිරිඳ තමන්ට සහාය වන සංවර්ධන වැඩකරුවන් ඉදිරියේ පවුලේ යථා ස්වභාවය විග්‍රහ කරගෙන වඩාත් යෝග්‍ය ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාවලියක් නිර්මාණය කර ගැනීම.

## පුහුණු වැඩමුළුවේ නිශ්චිත අරමුණු

- සැමියා හා බිරිඳ එක්ව විවාහයෙන් ඇරඹෙන පවුලේ කථා පුවත ප්‍රකාශ කිරීම හා ඒ පිළිබඳ විග්‍රහය.
- සැමියාගේ වඩාත් යහපත් තත්ත්වයන්, දුබලතා මෙන්ම බිරිඳගේත් වඩාත් යහපත් තත්ත්වයන් හා දුබලතා හඳුනාගැනීම.
- පවුල පිළිබඳ කෙරෙන ප්‍රකාශයන් පොදු සාකච්ඡාවකට භාජනය කිරීම.
- වඩා යහපත් ගෘහ කළමනාකරණ හා පවුල් සංවර්ධන ක්‍රියාවලියක පැවතියයුතු අංග හඳුනාගැනීම - ඒ මත ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගැනීම.
- පවුලේ මූලිකයන් දෙපල පවුල පිළිබඳ ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සඳහා යොමු කරවීම තුළ ගෘහයේ නව කළමනාකරණ හා සංවර්ධන ක්‍රියාදාමය ගොඩනඟා ගැනීම සඳහා වන පසුබිම් නිර්මාණය කර ගැනීම.

## ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධන පිළිබඳ නිර්වචනය

"පවුලේ එක්ව වෙසෙනා සියළුමදෙනාට වඩාත් යහපත් අන්දමින් සුවදායකව සැනසිල්ලේ ආරක්ෂාකාරීව විසියහැකි අයුරින් පවත්නා සම්පත් භාවිතා කරමින් භාහිර සම්පත් ගලපාගනිමින් ඉටුකරන ක්‍රියාදාමය ගෘහ කළමනාකරණය හා පවුල් සංවර්ධනය ලෙස හඳුන්වනු ලැබේ."

පුහුණු වැඩමුළුවේ විෂය අන්තර්ගතය.

01. විවාහයෙන් ඇරඹෙන පවුලේ සමස්ත කථා පුවත (පසුබිම් පුවත්ද ඇතුළුව)

02. සැමියාගේත් බිරිඳගේත් වඩාත් යහපත් චර්යාවන් මෙන්ම දුබලතාවයන් අන්‍යොන්‍ය වශයෙන් විවේචනාත්මකව විග්‍රහ කර ගැනිම හා ඒ තුළින් වඩා යහපත් ඉදිරි ගමන් මඟ සඳහා ක්‍රියාකාරකම් හඳුනාගැනිම.

03. ගෘහ කටයුතු පිළිබඳ වගකීම් පැවරුම් සාකච්ඡා කිරීම් හා තිරණ ගැනිම්.

- ගෘහයේ සියළු කටයුතු පිළිබඳ සතියකට වරක්වත් ගෘහයේ සියළුමදෙනා යෝග්‍ය වඅස්ථාවක කථාබහක යෙදීම හා අවශ්‍ය පරිදි තීන්දු ගැනිම.
- මවට / බිරිඳට / ගෘහණියට අයත් ගෘහ කටයුතු නැවත විමසිල්ලට භාජනය කර බැලිම.
- ගෘහයේ සියළුමදෙනාට තාරාතිරම අනුව වගකීම් පැවරීම මෙන්ම වගකීම් සඳහා හුරු කරවීම.
- එකිනෙකාට කාලය විඩංගු කළහැකි අන්දම සැලකිල්ලට ගෙන කාර්යයන් පැවරීම.
- පවුලේ මූලික හා අතුරු ආර්ථික ක්‍රියාවලිය පිළිබඳ මෙන්ම එදිනෙදා සිදු කෙරෙන නිවාස, ගෙමිදුල පිරිසිදු කිරීම්, ඇඳුම් සේදීම, ආහාර පිසීම, ජල පහසුකම්, දර සැපයුම් ගෘහයට අවශ්‍ය දෑ මිලදී ගැනීම් ආදී කටයුතු කෙරෙහි අවධානය යොමු කළයුතුවේ.
- විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය නිමවී ඇතිවිට පවුලේ ආර්ථික ක්‍රියාවලියට දායකවීම පිළිබඳ විශේෂයෙන් විමසිලිමත්වීම.

## 04. පවුලේ ආදායම් - වියදම් හා ණය පිළිබඳ

- ආදායම් වියදම් හා ණය පිළිබඳ විධිමත් සටහන් තබා ගැනීම.
- ආදායම් වියදම් තුලනය කර බැලීම හා ඉන් මතුවන තත්ත්වයන් විමසිල්ලට භාජනය කිරීම.
- මූලික හා අතුරු ආදායම් මාර්ග නැවත විමසීමට ලක් කිරීම ඒවා තවදුරටත් වැඩි දියුණු කළහැකි අංශ හඳුනාගැනීම.
- නව ආදායම් මාර්ග හඳුනාගැනීම.
- වියදම් දරණ කාර්යයන් හා ප්‍රමාණයන් විමසා බැලීම.
- අත්‍යාවශ්‍ය, අවශ්‍ය, සාමාන්‍ය, අනවශ්‍ය වශයෙන් වියදම් වර්ග කර හඳුනාගැනීම හා ඒවායේ වෙනස්කම් කළහැකිදැයි සළකා බැලීම.
- දැනට පවුලවෙතින් ගිලිහියන ආදායම් තත්ත්වයන් හඳුනාගැනීම හා ඒවා රඳවා ගැනීමේ ක්‍රමෝපායන් භාවිතා කිරීම.
- ණය භාවිතය ණයබර අත්මිදීමේ ක්‍රමෝපායන් හඳුනාගැනීම හා ඒ පිළිබඳ සාමුහිකව කටයුතු කිරීම.
- නිරන්තරයෙන් ආහාර සඳහාත්, අත් බෙහෙත් සඳහාත් අවශ්‍යවන ඉඟුරු - කහ - දෙහි වදකහ - බුලත් හා කරපිංචා, රම්පෙ, සේර, ගම්මිරිස්, කරාබු නැටි, ආදි වගාවන් සුළු වශයෙන් අඛණ්ඩව ගෙවත්ත තුළ තිබෙන බවට වගබලා ගැනීම. ඒ සඳහා දරණ වියදම් රඳවා ගැනීම.

## 06. ආහාර සම්පාදනය හා පවුලේ පෝෂණය.

- කුමක්හෝ ආහාරයට ගන්නවාට වඩා පවුලේ පෝෂණය පිළිබඳ සැලකිලිමත්වී ආහාර සම්පාදනය කිරීම.
- අඩු වියදමින් මෙන්ම ආහාරවල පෝෂණ ගුණය ආරක්‍ෂාවන පරිදි ආහාර සම්පාදනය කිරීම.
- රෝගී අය - වැඩිමහල් අය - දරුවන් යන අයට උචිත පරිදි ආහාර සම්පාදනය කිරීම.
- බැහැරින් ලබාගන්නවාට වඩා තමන් සතු තමන් දන්නා තමන්ගේ නිෂ්පාදන වැඩි වශයෙන් හා හැකි පමණ ආහාර සම්පාදනයට යොදා ගැනීම.
- ආහාර සඳහා දරණ වියදම් වලදී අරපිරිස්මැස්ම සැකසුරුවම වඩා ඵලදායි බව ආරක්‍ෂා වන පිරිදි කටයුතු කිරීම.

07. **මුළුතැන්ගෙය හා එහි කටයුතු.**

- කුමන මට්ටමක (ස්ථිර, තාවකාලික, අර්ධ ස්ථිර) මුළුතැන්ගෙය පැවතියද, පිරිසිදුවත් ක්‍රමවත් ලෙසින් නඩත්තු කර පවත්වාගෙන යාම.
- මුළුතැන්ගෙයට ප්‍රමාණවත් ආලෝකය වාතාශ්‍රය පැවතීම.
- පහසුවෙන් භාවිතා කළහැකි පරිදි ලිප පිළියෙල කිරීම
- විවිධ කාර්යයන් සඳහා අවශ්‍ය උපකරණ භාණ්ඩ සුදුසු ස්ථානවල තැබීම - අඩුවේලාවකින් අඩු වෙහෙසකින් භාවිතයට ගැනීමට හැකිවන පරිදි ඒවා තැබීම භාවිතයෙන් පසු තැබූ ස්ථානවලම ඒවා තැබීමට හුරුවීම.
- මුළුතැන්ගෙයි අපවිත්‍ර ජලය ගලායාමේ ක්‍රමයක් යෙදීම හා අනෙකුත් අපද්‍රව්‍ය බැහැර කරලීමේ ක්‍රම සංවිධානය.
- ආහාර ද්‍රව්‍ය ඉක්මනින් හඳුනාගැනීම සඳහා ලේබල් යෙදීම හා එම බඳුන් පිරිසිදුව තැබීම.
- මුළුතැන්ගෙය හා එහි ඇති දෑ කෘමි සතුන්ගෙන් ආරක්‍ෂාවන පරිදි තැබීම.

08. **නිවස ඇතුලත හා පිටත ක්‍රමවත්ව හා අලංකාරව තබා ගැනීම.**

- කුමන ආකාරයක කුමන මට්ටමක නිවසක් වුවද (තාවකාලික, අර්ධ ස්ථිර, ස්ථිර) පෙනෙන නොපෙනෙන සෑම තැනක්ම දිනපතා පිරිසිදු කිරීම.
- පිරිසිදු වාතාශ්‍රය - හිරු එළිය ලැබෙන පරිදි දොර ජනෙල් යොදා ගැනීම හා වෙනත් විවරයන් තැබීම.
- විවිධ ගෘහ උපකරණ භාණ්ඩ පිරිසිදුව සිත් ගන්නා අයුරින් නවතාවයෙන් යුතුව යෝග්‍ය ස්ථානයන්හි තැබීම.
- රෙදිපිළි තැබීම වැනීම පිළිබඳ සැලකිලිමත් වීම ඒ සඳහා යෝග්‍ය ප්‍රදේශ තෝරා ගැනීම.
- නිවසට, ගෙවත්තට ඇතුලුවන ස්ථාන ගෙමිදුල සුදුසු ස්වභාවික ක්‍රම යොදා සිත්ගන්නා සුළු අයුරින් පවත්වගෙන යාම.
- ගෙමිදුලේ ගෙවත්තේ ජලය බැසයාමේ ක්‍රමයක් සැකසීම හා ඒ සඳහා පාංශු සංරක්‍ෂණ වැඩපිළිවෙලක් යෙදීම.
- නිවස ඉදිරිපස පමණක් නොව පිටුපසද ඉතා පිරිසිදුවට පවත්වාගෙනයාම.

> නිවසේ ජීවත්වන ඕනෑම අයෙකු නිවසින් පිටත කිසියම් කාර්යයක රැඳී සිටිනවිට හැකි ඉක්මනින් ආපසු නිවසට යායුතුය යන හැඟීම ඔහු / ඇය තුළ ඇතිවන පරිදි නිවස පවත්වාගෙන යාම.

## 09. පවුලේ සෞඛ්‍ය කටයුතු.

- ඕනෑම වේලාවක පානය කිරීම සඳහා අවශ්‍ය පිරිසිදු ජලය (නිවාස උනුකරගත් ) සුදුසු බඳුන්වල දමා වසා තැබීම.
- වැසිකිළියක් පාවිච්චි කිරීම. ඒ සඳහා ප්‍රමාණවත් ජලය සපයා තිබීම. වැසිකිළි භාවිතයෙන් පසු සබන් දමා අතසේදීමට ක්‍රමයක් යොදා තැබීම. වැසිකිළිය නිරන්තරයෙන් පිරිසිදු කිරීම.
- ආහාරපාන සූදානම් කිරීමට පෙර සබන් දමා හොඳින් අතපය, මුහුණ සෝදා ගැනීම ඒ සඳහා සුදුසු ඇඳුමක් භාවිතා කිරීම.
- රෝගී අයෙකු නිවස තුළ සිටින විට වෙන්කර තැබීම, රෝගියා පරිහරණය කරන දෑ වෙන්කර තැබීම.
- රෝගීන්ට, ළමුන්ට වැඩිහිටියන්ට සුදුසු ආහාරපාන සැපයීම.
- ප්‍රථමාධාර පෙට්ටියක් අත්‍යාවශ්‍ය බෙහෙත් සහිත නිවසේ තබා ගැනීම.
- නිවස තුළ මෙන්ම, වගා කිරීමෙන් අත්‍යාවශ්‍ය අත් බෙහෙත් ලබාගැනීමට කටයුතු යෙදීම.


## 10. පවුලේ අධ්‍යාපන කටයුතු

- විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියේ නියුතු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සොයා බැලීම, වැඩිහිටි දායකත්වය මඟපෙන්වීම් අවශ්‍ය තැන් හඳුනාගැනීම.
- සහාය වියයුතු අවස්ථාවන්හිදී සහායවීම හා මඟ පෙන්වීම.
- නිවස තුළ අධ්‍යාපන ක්‍රියාවලියට පරිසරය ගොඩනැඟීම.
- විශේෂයෙන් උපකාරක පංතිවල නිරත කරවීම් පිළිබඳ සොයාබැලීම - දරුවන් හා දෙමාපියන් අවබෝධයෙන් යුතුව ඒ තුළ රැඳී සිටීම. ගුරු භවතුන් හමුවීම ළමුන් පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීම.
- නිවසේ වැඩිහිටියන් සඳහා පුවත්පත් පොත් සම්පාදනය කර ගැනීම හා කියවීමේ රුචිය ඇතිවන පරිදි කටයුතු කිරීම.
- නිවස තුළ පොත්පත් රැස්කර තැබීම අසල්වැසියන් හා පොත්පත් ගනුදෙනු කර ගැනීම.

11. යහපත් පුරුදු, සිරිත් විරිත්, ආගමික පරිසරය.

- බිළිඳු අවධියේ පටන් කරන පුරු කිරීම්, සිරිත් විරිත්, යොමු කිරීම්, යහපත් පුරුදු ඇවතුම්, පැවතුම් (සමාජානු යෝජනය) ඒ අයුරින් දිගින් දිගටම පවත්වාගෙන යාම (දරුවා සමාජයට පවරනතුරු)
- විශේෂයෙන් නිවෙස තුළ විසීමේදි, නිවෙසින් පිටතදි, මහමඟදි, බැහැර ජනයා අතර, ඥාතින්, හිතවතුන් අතර, විසීමේදි හැසිරිය යුතු අන්දම පවුලේ සියළුම සාමාජිකයන් වෙත තහවුරු කරගැනිම.
- සමාජ යථාර්ථය කිසිවෙකු කිසිවෙකු වෙතින් සොයැඟ වියයුතුය. විශේෂයෙන් වැඩිවියට පා තබන දරුවන් සමාජ යථාර්ථය සඳහා මඟගැන්විය යුතුය.
- ආගම දහම ඇදහිම සඳහා හුරුකිරීම යොමු කරවීම ඒ සඳහා ස්ථානයක් පවිත්‍රව අලංකාරව පවත්වාගෙන යාම.
- විශේෂයෙන් දරුවන් අවශ්‍ය පරිදි නිදහස ලබාදීමත් අනවශ්‍ය පරිදි නිදහස භුක්ති විඳිමට ඉඩකඩ නොතැබීමත් සිදුවිය යුතුය.

මෙම විෂය ධාරාව තුලින් අවසානයේ සිදුවන දේ



## පුහුණු ක්‍රමවේද ගැලපුම

මූලික වශයෙන් මෙම වැඩමුළුව සඳහා සහභාගිත්ව ක්‍රමවේදය ගලපා ගන්නා ලදී. මෙම මෙහෙයවීම සඳහා විශේෂයෙන් සම්පත් දායකත්වය ලබාදෙන පුහුණුකරුවන් තුළ සහභාගිත්ව පුහුණු ක්‍රමවේදය පිළිබඳ මනා පරිචයක් තිබියයුතු අතර, කිසිවෙකුටත් හෙළිදරව් නොකරන් ඇතැම්විට මෙතෙක් සමූහයක් ඉදිරියේ කථාබහ නොකල තම පවුලේ ජීවිතයේ යට ගියාවන් සැමියා හා බිරිඳ වෙතින් එකම තැනකදී ප්‍රසිද්ධියේ මතුකර ගැනීමත්, ඒවා ඉදිරිපත් කිරීමට තරම් සැමියා හා බිරිඳ පෙළඹවීමටත් සුවිශේෂ කුසලතාවයක් පුහුණුකරුවන් සතුව පැවතීම මෙම ක්‍රියාදාමයේ අර්ථවත් බවට නිරායාසයෙන්ම හේතු විය. තමා දන්නාදේ දිගින් දිගටම ප්‍රකාශකර සිටීමෙන් වැලකීමට සම්පත්දායක පුහුණුකරුවන් දැඩිසේ වගබලා ගන්නා ලදී. මැනැවින් සැමියා / බිරිඳ ප්‍රකාශිතදේ පිළිබඳ ඇහුම්කන්දී අදියරෙන් අදියර ඒ පිළිබඳ විග්‍රහයක යෙදීමත් සෙසු අයටද ප්‍රවේශමෙන් සාකච්ඡාවට ඇතුලුවීමට අවකාශ සැලසීමටත් සම්පත්දායකයන් වගබලා ගන්නා ලදී.

අඹුසැමි යුවල වෙත ඉදිරි නිවැරදි මඟගැන්වීමක් සඳහා වන පසුබිම් නිර්මාණයකද සම්පත් දායකයෝ නිරතවූහ. සමූහ සාකච්ඡාව තුළ සෙසු අඹුසැමියන්ට නිවැරදි අනුකරනයකට අවස්ථාව සලසා දීමටද සම්පත්දායකයන් වගබලා ගන්නා ලදී. කිසිදාක ප්‍රසිද්ධියේ ප්‍රකාශ නොකළ සිදුවීම් අවස්ථා ඉතා සංවේදීව පවුල් මූලිකයන් වෙතින් ප්‍රකාශ වීම නැතහොත් ඔවුන්ගේ විවෘතභාවය ක්‍රමවේද ගැලපුමේ සාර්ථකත්වය සනාථ කරන්නක් විය.

## පුහුණුවැඩමුළුව ක්‍රියාත්මක වීම.

මූලික වශයෙන් පුහුණු වැඩමුළුව අදියර තුනකින් ක්‍රියාත්මක විය.

1. විවාහයෙන් ඇරඹෙන පවුලේ සමස්ත කථා පුවත ප්‍රකාශ කිරීම හා ඒ පිළිබඳ විග්‍රහය.

2. සැමියාගේත් බිරිඳගේත් වඩාත් යහපත් චර්යාවන් හා දුබලතාවයන් දෙදෙනාගෙන් වෙන්ව ලබාගෙන ඒවා සමස්තයක් ලෙස ගොනුකිරීම හා විමසුමට ලක් කිරීම.

3. පවුලේ සංවර්ධනය මුල්කරගත් ගෘහ කළමනාකරණ ක්‍රියාවලියක ඇතුලත් වියයුතු අංශ හඳුනාගැනීම හා ඒවා විමසුමට ලක් කිරීම.

# පවුල් ප්‍රකාශිත - කථා පුවත්

පුහුණු වැඩමුළු පහ තුළදී පවුල් සියය ප්‍රකාශන කරන ලද විවාහයෙන් ඇරඹෙන කථා පුවත් විවිධ ස්වරූපයන්ගෙන් මෙන්ම සමානවූ කථා පුවත්ද පවතී. මෙයින් තෝරාගත් කථා පුවත් 25 ක් මෙහි ඇතුලත් කර ඇත. පවුලේ වර්තමාන කළමනාකරන හා සංවර්ධන ක්‍රියාවලිය සඳහා වන හේතුසාධක අවබෝධ කර ගැනීම සඳහාත් විසඳුම් ක්‍රියාකාරකම් නිර්මාණය සඳහාත් මෙම කථා පුවත් වැදගත් විය.

පවුල් ප්‍රකාශ අංක 01

"වැල්හේන්ගොඩ එක් ගොඩ මණ්ඩියක තමයි මම ඉන්නේ. මගේ නම සුරංගිකා. මම පුංචි කාලෙම ගෙදර අගහිගකම් නිසා අම්මා රට ගියා. අම්මා රට ගියාට පසු මම තාත්තලාගේ නංගිලාගේ ගෙදර නැවැත්වූවා. ඒ මගේ නැන්ද. නැන්ද මට හරි ආදරෙයි. මම එහේ හරි සතුටින් හැදුනා වැඩුනා. වැඩිවිය පැමිණුනෙත් එහිදී. පාසැල් ගමනත් හොඳින් කරගෙන ගියා. මට විභාගය සමත් වෙන්න බැරිවුණා. ඊට පස්සේ මම ගෙදර නැවතුනා."

"මේ අතරතුරදී නැන්දලයි ගෙදරට අල්ලපු ගෙදර පිරිමි ළමයෙක් හිටියා මගේ වයසේ. ඒ නිසා එහාට පිරිමි ළමයි නිතරම යනවා එනවා. එක් පිරිමි ළමයෙක් නිතරම එහි ආවා ගියා. ඒ අතර මා එක්කත් හිනාවෙලා කථාබහ කරනවා. මාත් එක්ක හරි හිතවත් වුනා. නිතර නිතර ඔහු අල්ලපු ගෙදරට යන්න එන්න ගත්තා. මමත් නොදැනීම ඔහුව බලාපොරොත්තු වුනා. මේ ඇසුර ටිකෙන් ටික ප්‍රේමයක් බවට පත්වුනා. ඔහු තමයි ජගත්. ඉන්පසු ජගත් නිතර නිතර මා හමුවෙන්න ආවා. ඔහු රැකියාව කලේ මිල්ටන් හෝටලයේ: ඔහු සමග මා කථාබහ කරන බව ඇසුරු කරන බවක් මගේ නැන්ද දැනගෙන හිටියේ නැහැ. දවසක් ජගත් කථාබහ කරද්දී නැන්දට හොරෙන් එයාලයි ගෙදර යන්න කථා කළා. මටත් එතකොට ජගත් නැතිවම බැරිවුණා. ඒ නිසා මමත් කැමති වුනා. මම ඊට පසුවද ජගත් සමග එයාලයි ගෙදර ගියා. ජගත්ලයි දෙමාපියන් මාව ජගත්ට විවාහ කර දුන්නා. එද ඉඳන් මම ජගත්ලයි ගෙදර හිටියා. ජගත්ලයි අම්මත් මට ආදරෙයි. එයාලත් එක්ක හොඳින් ඉන්න මමත් උත්සාහ ගත්තා. එයා මට නිතරම කිව්වේ දැන්ම දරුවන් හදගන්න එපා කියලා. අම්මලා ළග ඉන්න නිසා. ඒ අවවාදෙත් මට පිළිපදින්න සිද්ධවුනා. අවුරුදු හතරක් යනතුරු මම බබාලා හදගත්තේ නැහැ. අවුරුදු හතරකට පස්සේ මට පුතා ලැබුනේ. ජගත්ලයි අම්මලා මට දෙස් කිවෙත් නෑ. වෙනස්කම් කරන්නෙත් නෑ දරුවෙක් හිටියට. ඒත් මට හිතුනා අපි වෙන්වුනා නම් හොඳයි කියලා. ජගත්ටත්

මේ ගැන කිව්වා. ජගත් මුලදී අකමැති වුනත් පසුව තේරුම් කරල දුන්නම කැමති වුනා. ජගත්ලයි ඉඩමට අල්ලපු ඉඩමට අල්ලපු ඉඩම අම්මට අයිති එකක්. ඒකේ ගෙයක් හදගන්න අපිට ලැබුනා. එච්චර හොඳ ගෙවල් හදන්න අපිට සල්ලි නැහැ. ඒත් ගෙයක් හදගන්නත් ඕනනේ. මැටි ගහල පොල් අතු බැඳල පොඩි ගෙයක් හදගත්ත. අපි තුන්දෙනා මේ ගෙයි පදිංචි වුනා. දරුවට නම් හොඳමදි කියල හිතුනා. ඒත් අපි ආවා. හොඳින් බලා ගත්තා. අපි මේ ගෙදර සතුටින් හිටියා. ඒත් ගේ හොඳට හදගන්නවත් අතුටික බැඳගන්නවත් පිළිවෙලක් ගැන ජගත් හිතුවෙ නැහැ. හම්බ කරනදේ එදිනෙදට වියදම්. කිසිම ඉතුරුවක් නැහැ. අවුරුදු දෙකක් දෙහමාරක් විතර කල්ගත වුනා. වහිනකොට වහල තැනින් තැන තෙමෙන්න ගත්තා. ඒත් අතු ටිකක් බැඳගන්නවත් වත්කමක් අපිට තිබුනේ නැහැ. දරුව ගැන හිතලා අපි ජගත්ලයි ගෙදර පදිංචියට නැවත ගියා. එහේදී දරුවට ආරක්ෂාව ලැබෙන නිසා. වැස්සට ගේ ඔක්කොම කඩා වැටුනා. අපි මහ ගෙදර ඉඳගෙන මේ ගේ හදන්න පටන් ගත්තා. කලින් වගේම මැටි ගහලා වහලට තාරෂීට් ගහලා පුංචි ගෙයක් හදගත්තා. ඒක හදගෙන අපි ඒ ගෙයි පදිංචියට ගියා. ජගත්ට රස්සාව අහිමි වුනේ මේ දවස්වල. රස්සාවෙන් අයින් වෙලා ත්‍රී රෝද රථයක කුලියට වැඩකරා. ඒකෙන් ලැබුන මුදල ජීවත්වෙන්නවත් මදි. මේ කාලයේ හරිම අමාරුවෙන් තමයි අපි ජීවත් වුනේ අගහිගකම් එමටයි. ජගත්ගේ අම්මලාගේ උදව් උපකාර ලැබුනේ නැත්නම් අපිට හිගාකන්න තමයි වෙන්නේ.

මේ ආදායමෙන් ජීවත් වෙන්නේ කොහොමද කියලා හිතාගන්නවත් බැහැ. කන වේල් ගණන අඩුයි. නොකා ඉන්න වේල් ගණන වැඩියි. ඇඳුමක් පැළඳුමක් ගන්න නැහැ. කාගෙන්වත් ඉල්ලගෙන තමයි ගමන් බිමන් ගියේ. ජගත් වැඩකරන කාලය අඩුයි. වැඩ නැතිව ගත කරන කාලය වැඩියි. එයාට යාලුවෝ ගොඩාක් හිටියා. ගෙදර ගතකරන කාලයට වඩා ගත කරන්නේ යාලුවොත් එක්ක. අපි තුන්දෙනෙක් ජීවත් වෙන්නේ කොහොමද කියලා මම දහ අතේ කල්පනා කළා. ජගත්ට නම් ගානක්වත් නැහැ. බැරිම තැන මම දරුව ජගත්ලයි මහ ගෙදර නවත්තලා කොග්ගල නිදහස් වෙළඳ කලාපයේ රස්සාවකට ගියා. දරුවා දලා ගියාට හිතට නම් හරි නැහැ. දරුව ගැනමයි මතක් වෙන්නේ. උදේ වැඩට ගියාම හවස ගෙදර එනතුරු ඉවසුමක් නැහැ. ගාමන්ට් එකේ දවල් දවසෙම වැඩකරල රෑට ගෙදර ඇවිත් ගෙදර වැඩත් කරන්න ඕන. දරුවත් එක්ක ඉන්න තියෙන්නේ මේ රෑ ටික විතරයි. ආයිත් උදේ 5.00 ට නැගිටලා ජගත්ටත් උයා තියලා දවල්ට කෑමත් අරගෙන උදේ 7.00 ට වැඩට ඉන්න ඕන. මම වැඩට යනකොට දරුවා හොඳටම අඩනවා. මහන්සි වුනොත් කීයක් හරි අතට ලැබෙනවා. දුක් විඳගෙන හරි අපි ජීවත් වෙන්න ඕන. දරුවා ජීවත් කරවන්න ඕන. ජගතුත් මොනවා හරි කරල කීයක් හරි හොයනවා. ඒත් ඉතින් හැමදම නැහැනේ. මේ අතරෙදී මට වැල්හේන්ගොඩ විපර්යකාරක සමිතියට බැඳිලා මාස 06 - 07 ක් විතර වෙනවා. මම සමිතියට බැඳුනේ ණයක් අරගෙන ගෙයක් හදගන්න හිතාගෙනමයි. එහෙම නැතිව කවදාවත් සල්ලි එකතු කරල අපිට ගෙයක් හදන්න වෙන්නේ නැහැ.

එහෙම හිතල ජගත් එක්කත් කථාබහ කරල මේ සමිතියේ ණයක් ඉල්ලුවා. රු: 5000/- ක් අරගෙන ගේ හදන්න උවමනා ගල්වැලි ටික විතරක් ගෙනාවා. ඒත් ගේ හදන්න දැන්ම බැහැ. මේ ණය පුළුවන් විදියට ටික ටික ගෙවල තව ණයක් අරගෙන තමයි ගේ හදන්න වෙන්නේ. ඒ බලාපොරොත්තුව ඉටු කරගන්න අදහසින් අපි හොඳින් සමිතියේ ගනුදෙනු කරගෙන ඉන්නවා. සමිතිය තමයි අපේ ප්‍රශ්න වලට පිළිතුර.

පවුල් ප්‍රකාශ අංක 02

"මම දයා. උපන්නේ ගොඩකන්දේ. මගේ මහත්තයා මායාකඩුව. මගුල් කපුවෙකුගේ මාර්ගයෙන් ගෙන එන ලද මංගල යෝජනාවක් අනුව 1981 දී අපි විවාහ වුනා. විවාහ වෙලා මහත්තයාගේ ගෙදර පදිංචියට ගියා. මම විවාහ වෙලා මහත්තයාගේ ගෙදරට එනවිට ඒ ගෙදර ගොඩක් අය ජීවත් වුනා. මහත්තයාගේ අම්මා, තාත්තා, විවාහ නොවූ නංගි, මල්ලි, විවාහක මල්ලිගේ නෝනා සහ දරුවා, ආබාධිත මල්ලි කෙනෙක්, මහත්තයාගේ අක්කගේ අවුරුදු 12 ක පමණ පුතෙක්, අයියගේ අවුරුදු 05 ක පමණ පුතෙක් යන දහදෙනෙකුගෙන් යුත් පවුලක 11 වෙනි හවුල්කරුවා ලෙස මාද සම්බන්ධ වුනා. ඒත් අපි කවුරුත් එකට බත් හැලිය උයාගෙන කෑවේ. අවුරුදු 1 1/2 පමණ කිසිම ගැටුමක් ඇති වුනේ නැහැ. ටික කලකට පස්සේ එක් එක්කෙනා අතර පුංචි පුංචි ප්‍රශ්න මතුවෙන්න පටන් ගත්තා. තිබුණු හොඳ හිත ටික ටික නැතිවේගෙන ගියා. අපි හැමදම ගෙදර නතරවීම පිළිබඳ අම්මා නිතරම නෝක්කඩු කියන්න පටන් ගත්තා. මල්ලී ගෙදර ඉන්න ඕන. කවදාහරි මේවා අයිතිවෙන්නේ එයාට. අයියලා මල්ලිලා ඔක්කෝටම මේ ගෙයි ඉන්න බැහැ. මේ වගේ අයිතිය ගැනත් එක එකදේ කියවන්න වුනා. මල්ලිට කවද හෝ ගේ අයිතිවන නිසා අනිත් අය නිවසින් පිටවිය යුතු බව අම්මා නොකියා කියන්නට වුනා. ගෙදර ප්‍රශ්නයට විසඳුමක් විදියට අපි අවුරුදු 2 කට පස්සේ ඒ ගෙදරින් පිටවුනා. වෙන කරන්නට දෙයක් නොතිබුනෙන් මගේ සහෝදරයකුගේ ගෙදරක පදිංචියට ගියා. තාවකාලිකවයි එය ඉල්ලා ගත්තේ. මෙහිදී අපේ පවුලට තවත් සාමාජිකාවක් එකතු වුනා. ඒ අපේ වැඩිමහල් දියණියයි. අවුරුදු 2ක් විතර ගියාට පසු ඒ අයගේ අවශ්‍යතාවයකට මෙම නිවස විකිණීමට අවශ්‍ය බව සොහොයුරා පැවසුවා. ඒ නිසා අපි මෙම නිවසින් පිට වුනා. නැවතත් ටික දිනකට මහ ගෙදර නතර වුනා. ඉක්මණින් ගෙයක් සොයාගැනීමේ අදහසින් මහත්තයා ගෙවල් සෙවීම දිගටම කරගෙන ගියා. ඒ නිසාම අපට කුලියට ගෙයක් සොයා ගන්න හැකිවුනා. අපි ඒ ගෙදර පදිංචියට ගියා. ඒත් අවුරුදු 2 කට පමණයි. මමත් මහත්තයත් දරුවත් අවුරුද්දක් පමණ ඒ ගෙදර ජීවත් වුනා. ඊට පසුව ගේ අයිතිකරුවන් විසින් ඒ ගේ ඉල්ලා සිටියෙන් එය භාරදී අපිට යන්නට සිදුවුනා. අපි නැවත මහ ගෙදර පදිංචියට ගියා. මේ කාලය වන විට ගෙදර පිරිස තරමක් අඩුවී තිබුණා. අම්මා

තාත්තා, ආබාධිත මල්ලී, විජිතාගෙ මල්ලී නෝනා සහ දරුවා පමණයි. එහි සිටියේ. අපි ගෙදර අයටත් උදව් කරගෙන ලෙඩ ගානේ සිටිය මල්ලීත් බලාගෙන හොඳින් ජීවත්වුනා. මේ නිසා අපේ මහත්තයා අම්මගෙන් පර්චස් 10 ක් වත් ඉල්ලුවා. මහ ගෙදර ඉඩමෙ පර්චස් 49 ක් තිබුණා. ඒත් අම්මා ඒකට කැමති වුනේ නැහැ මහත්තයාගෙ හිත හුඟක් කළකිරුණා මේ නිසා. අපි මහත්තයලයි මහ ගෙදරින් පිටවුනා. යන්න එන්න තැනක් ඇතිව නොවේ අපි පිටවුනේ. හිතේ ඇතිවූ දුක සහ තරහටයි. ඒ නිසා අපේ මහගෙදරට ගියා. මෙහෙදි මගේ සොහොයුරෝ කුඩා ඉඩම් කැබැල්ලක් දි කටුමැටි ගැසූ ගෙයක්ද සකස් කර දුන්නා. ඒ ඉඩම් කැබැල්ල අපිට ලියල දුන්නා. අවුරුදු ගණනක් අතන මෙතන දුව ඇවිදිමින් සිටි යුගය හමාර වේවියැයි මට සිතුනා. පුංචි කටුමැටි ගෙයි අපි සතුටින් හිටියා. මේ වන විට අපිට ළමයින් තුන් දෙනෙක් හිටියා. දෙන්නෙක් පාසැල් යනවා. එක්කෙනෙක් චූටියි. අපිට හොඳ ගෙයක් හදගන්න තිබුණා. ඕනකම බොහොමයි. ඒත් ඉතින් මහත්තයා කරන රස්සාවෙන් තමයි ඔක්කොම කරන්න තියෙන්නේ. ජීවත් වෙන්නත් ළමයින්ට උගන්වන්නත් මේ හැම දෙයක්ම. මොනවා කරන්නද කියා හිතමින් දවස් ගතවුනා. මේ අඩුපාඩුකම් සපුරා ගන්න ක්‍රමයක් ගැන නිතර දෙවේලේ අපි හිතුවා. දරුවන් පුංචි නිසා මට රැකියාවකට යන්නත් බැහැ. මහත්තයාගේ පඩියෙන් ජීවත් වෙනවට වඩා වැඩි යමක් කරන්නත් බැහැ. ඒකට විසඳුමක් වශයෙන් රට රැකියාවකට යාමට මහත්තයා අදහස් කළා. ඒත් කෝ ඒකට සල්ලි? සල්ලි හොයන ක්‍රමයක් ගැන අපි වෙහෙස වුනා. ණයට ගන්නත් තැනක් නැහැ. ලොකු මුදලක් ඕනනේ. ගිනි පොලියට නම් ගන්න පුළුවන්. ඒත් පොලී ගෙවන්න වෙනවානේ. ඉල්ලගන්න නෑදෑයෙක් හිතවතෙක් ඇත්තෙත් නැහැ. දහ අතේ කල්පනා කළා. අන්තිමට තීරණය කලා අපිට අයිති එකම දේපල, පදිංචිවී ඉන්න පුංචි ඉඩම් කෑල්ල විකුණන්න. මම මේකට කැමති වුනේම නැහැ. ඒත් මහත්තයා ලොකු බලාපොරොත්තුවක් ඇතිවයි සිටියේ. "මෙච්චර කල් හිටිය විදියට මහ ගෙදර තව ටික කලක් ඉන්න. මං රට ගිහිල්ලා සල්ලි හම්බ කරලා හොඳ ගෙයක් ගනිමු.. මහත්තයා මෙහෙම කිව්වාට ඒකට එකඟ වෙන්න හයියක් මට තිබුනේ නැහැ. නමුත් මම පස්සේ ඒකට එකඟ වුනා. ඉඩම විකුණලා මුදල් ගත්තා. අපි ආයෙත් අපේ මහ ගෙදර පදිංචියට ගියා. ඒත් දුකක් දැනුනේ නැහැ. ලොකු බලාපොරොත්තුවක් තිබුණා කවදහරි අපේ අදහස් ඉටුවේවි කියලා. අපි කවුරුවත් නොසිතූ විදියට මහත්තයාගේ විදේශ ගමන අසාර්ථක වුනා. කබලෙන් ලිපට වැටුණ වගේ ඉන්න තැනත් නැති වුනා. තිබුණු එකම ඉඩම් කැබැල්ලත් නැති වුනා. රට යන්නත් බැරි වුනා. ආයිත් කුළී ගෙයක් හොයාගෙන අපි එහි පදිංචියට ගියා.

මේ කාලෙදී මහත්තයලයි මහ ගෙදර හිටි පිරිස ක්‍රම ක්‍රමයෙන් අඩුවී තිබුණා. නැන්දම්මා ලේලි අරගලය නිසා පොඩි මල්ලී සහ නැනාත් ඉඩමක් මිලදී ගෙන ගෙදරින් පිටවී ගිහින්. ගෙදර ඉන්න ආබාධිත මල්ලීගේ වැඩ කරන්නෙ නැති වුනාම අම්මා නැනාට දෙස් පවරනවා.

මේක තමයි ගැටුමට හේතුව. දැන් ගෙදර ඉන්නේ අම්මයි තාත්තයි, ආබාධිත මල්ලියි විතරයි. මම මහ ගෙදර හිටපු දවස්වල ආබාධිත මල්ලිගේ වැඩ කලේ මමමයි. අම්මට තනිවම මේ වැඩ කරගන්න බැරි නිසා අම්මා හරි කරදර වින්ද. අම්මා දන්නවා මම හිටියොත් මල්ලිගේ වැඩ ටික මම කරන බව. ඒ නිසා අපිට පණිවිඩයක් එවල තිබුණා ගෙදර එන්න කියලා. ඇත්තටම ඒ අය අපට මොනවා කිව්වත් කළත් අපේ දෙමව්පියෝ සහෝදරයෝ නේද කියල හිතුනා. අපි ආපහු මහ ගෙදර ගියා. අපේ මේ ගෙවල් මාරුව නිසා දරුවන්ගේ අධ්‍යාපනයට පාඩු සිදු වුනා. ඒත් කණගාටුවක් නම් දැනුනේ නැහැ. ළමයින්ට හොඳට ඉගෙන ගන්න පුළුවන් නිසා. කොච්චර ප්‍රශ්න තිබුනත් අපි දරුවන්ගේ ඉගෙනුම ගැන සොයලා බැලුවා. අපි ගෙවල් මාරු කරන විට පාසැලුත් මාරු කරන්න වුනා සමහර වෙලාවක.

අපි නැවතත් මහ ගෙදරට ගිහින් අම්මයි, තාත්තයි, ආබාධිත මල්ලියි හොඳින් බලා ගත්තා. අසරණ වෙලාවට පිහිට වුනේ අපි නිසා අපිට පරාණ භුක්තිය තියාගෙන ඉඩමයි ගේයි මහත්තයාට ලියලා දුන්නා. ඒත් ඒ බව ආරංචි වෙලා අනිත් සහෝදරයෝ ඇවිත් අම්මට දෙස් කිව්වා. ඒ නිසා අම්මා නැවත ඉඩම ඉල්ලා ගත්තා. ඊට පස්සේ මිපෙ නිදහස් උයනේ පර්චස් 10 අපි මිලදී ගත්තා. කවදහරි ඉඩමක් ගන්න අදහසින් අපි කිය කිය හරි එකතු කරගත්තා. ඒක නිසා අපිට මේ ඉඩම් කෑල්ල මිලදී ගන්න පුළුවන් වුනා. ඒ ඉඩමෙ ලෑලි ගහගෙන ගෙයක් හදගත්තා. දරුවනුත් එක්ක අපි එහේ පදිංචි වුනා. මේ අතරතුරදී මහත්තයාගේ තාත්තා මිය ගියා. අම්මත්, ආබාධිත මල්ලිත් විතරක් ගෙදර තනි වුනා. මේ වෙලාවෙදීත් අම්මා ඉල්ලීමක් කරා අපිට ගෙදර ඇවිත් නවතින්න කියලා. අම්මා වෙන අයට මෙහෙම කියන්නේ නැහැ. කවුරුවත් එන්න කැමති නැහැ. හේතුව ආබාධිත මල්ලිගේ වැඩ කරන්න කවුරුවත් කැමති නැහැ. මේ නිසා අපි යලිත් වරක් මහ ගෙදර කරදරයක් නැතිව ජිවත් වුනා. ටික කලකට පසුව ආබාධිත මල්ලී මිය ගියා. ඊට පසුව අම්මාත් මල්ලිගේ ගෙදර එක්කරන් ගියා. මහ ගෙදර කවුරුවත් ඉතිරි වුනේ නැහැ. අයිතිය නැතත් අපි මහ ගෙදර ජිවත් වෙනවා. ඉතිරි කරගන්න බැරි වුනත්, ළමයින්ටත් උගන්වගෙන හොඳින් ජිවත් වෙනවා. මේ ගෙයි සිටියත් අපේ බලාපොරොත්තුව අපේ පුංචි ඉඩම කොහොම හරි ගෙයක් හද ගන්න. අපේ ප්‍රශ්න වලට විසඳුම් දෙන සමිතියක් අපේ ගමේ තියෙනවා. ඒකෙ පිහිටෙන් කවද හරි අපිත් ගෙයක් දෙරක් හදගෙන සතුටින් ඉන්නවා. ගෙයක් නැති කමින් දුක් වින්ද වාර ගණන බැට කාපු හැටි කවදවත් අමතක වෙන්නේ නැහැ. මේ අතිතය කවදා හරි හොඳ අනාගතයකට හේතුවක් වේවි.

පවුල් ප්‍රකාශ අංක 03

"මම දයාවතී. ඩග්ලස් සහ මම ඇවැස්ස නෑකමට විවාහවූයේ 1975.05.26 දින. රැකියාව වශයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ වඩු කාර්මිකයෙක්. 1980 දී දේශපාලනය වෙනස්වීමත් සමගම ඩග්ලස්ගේ රැකියාව අහිමි වුනා. එද සිට අදටත් හරිම දුක්බර ජීවිතයක් ගත කරන්නේ. . රැකියාව නැතිවෙන කොට මට දරු තුන්දෙනෙක් සිටියා. කිසිම සහනාධාරයක් ලැබුනේ නැහැ.

ඩග්ලස්ගේ මහ ගෙදර ජීවත් වුනේ. එක දවසක් වර්ෂාවේ අසල තිබුන කොස්ගසක් කඩාගෙන වැටුනා. නිවසට. එතරම් විශාල ගෙයක් නෙවි. ඩග්ලසුත් මමත් එකතුවෙලා කටුමැටි ගසා ඒ අසලම නිවසක් තනා ගත්තා. මෙහිදී තවත් දරුවෙක් පවුලට එකතු විය.

මේ ගෙදරදී ලැබුන දරුවා මාස 11 ක් පමණ යනවිට පොඩි ළමයින්ට සෑදෙන ලෙඩක් හැදිලා මිය ගියා. අපිට ගොඩාක් උදව් කලා මගේ අයියාත් අම්මා සහ නංගී.

නංගී වැඩි වශයෙන්ම සිටියේ මගේ ළමයි බලාගෙන. අපි සාද ගත්ත නිවසක් කඩා වැටුනා. ඊට පසුව තවත් කටුමැටි නිවසක් සාද ගත්තා. මේ පැත්තේ ලී එහෙම කපාගන්න පුළුවන්නේ. ඒ නිවසේදීත් පිරිමි දරුවෙක් පවුලට එකතු වුනා. දැන් පවුලේ සංඛ්‍යාව හය දෙනෙක්.

ඩග්ලස් එදිනෙද වඩුවැඩ කරමින් ගමේ ජීවත් වුනේ. අධික වර්ෂාවක් සමග නැවත සාද ගත්ත නිවස කඩා වැටුනා. මේ කාලයේදී අපිට ජීවත්වෙන්න කිසිම මාර්ගයක් තිබුනේ නැහැ. ගෙදර තිබුන පරණ බඩු සියල්ලම එකින් එක විකිණුවා. ඒකෙන් ජීවත් වෙන ගමන් රු. 20,000/- මුදලක් එකතු කර ගත්තා.

මහ ගෙදර ඉඩමේ කුඩා නිවසකට අත්තිවාරම දගත්තා. දැන් ළමයි පස් දෙනෙක් ඉන්නවා. ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. ගෙදර බඩු ටිකත් නැහැ. අපි ළමයි පස් දෙනාම එකම ඇඳක තියාගෙන සිටියේ. මහත්තයා ගමෙන් ආවා දිවුලපිටියට. අඳුරන මහත්තයෙක් හමුවෙලා කොට්ටාවේ පොඩි වඩු මඩුවක් දගන්න දුන්නා.

වඩු මඩුව දගත්තට පස්සේ අපිට ටිකෙන් ටික ජීවත්වීමට මුදල් ලැබුනා. එවිට තුන්දෙනෙක් පාසැල් යනවා. පෙර වාසනාවකට වගේ මහත්තයාට රුපියල් ලක්ෂයක සංවර්ධන ලොතරැයියක් ඇදුනා. මේ මුදල චෙක් පතකින් ලැබුනේ. එයට බැංකුවෙන් මුදල් රැගෙන ගමට ඇවිත් දින 27 කින් නිවසේ වැඩ ටික අවසන් කරගත්තා. රුපියල් 50,000/- ක් වියදම් වුනා. මේ අවධියේ මට තවත් පුතෙක් ලැබුනා. ඔහුට ජයසංඛ කියා නමක් තැබුවා.

අළුත් නිවසට පදිංචියට ආවා. මේ කාලයේදී ජේ.වී.පී. කලබල ආවා. කොට්ටාවේ තිබුනු ලී මඩුවට ගිනි තිබ්බා. අයිතිකාරයන්ට රු. 20,000/- ක් මුදලක් ගෙවා ලී ටික අරගෙන දීලා ඉතිරි බඩු ටිකත් රැගෙන නැවත ගමට ආවා. ඒ ඉතිරි බඩු වලින් කුඩා තේ කඩයක් සාද ගත්තා.

ජේ.වී.පී. එකෙන් ඇවිත් 15,000/- මුදලක් රැගෙන ගියා. මගේ ළඟ හිටිය නංගිට විවාහයක් තීන්දුවෙලා ඉතිරි මුදලින් ජයටම උත්සවය ගත්තා.

දැන් ළමයි පස් දෙනාම හීනටිගල පාසලට යනවා. ලොකු දුවත් වැඩිවියට පැමිනිලා. ජයට උත්සවය ගත්තා. තේ කඩයත් දවසින් දවස දියුණුවට එනවා. ළමයින් පාසැල් යනවා. ලොකුදුව පාසලේ බාහිර තරග වලට යමින් හොඳින් අධ්‍යාපන කටයුතු කළා.

මේ අතරතුර එක් දවසක් දුව තරග සඳහා වෙනත් පාසලකට යන බව දන්වා උදේ ගෙදරින් පිට වුනා. ඒ ගිහින් සවස් වනතුරුම ළමයා ගෙදර ආවෙ නැහැ. සොයා බලනකොට ළමයා පිරිමි ළමයෙක් එක්ක පැනලා ගිහින්. ජීවිතයේ පළමු වරට මටත් ඩග්ලස්ටත් එපා වුනා.

ඩග්ලස් ළමයා පොලිසියට ගෙන්වා දුවට වැන්ද ගෙදර එන්න කියලා. ඒත් ඇය ගෙදර ආවෙ නැහැ. හොඳට කරුණාවන්ත මිනිහා. දැන් හරිම දරුණුයි. මේ සිද්ධියත් සමගම මටත් ළමයින්ටත් තහංචි දලා තියෙන්නේ. ලොකු දුවත් සමග කථා කිරීමටවත් ඉඩ දෙන්නේ නැහැ.

දෙවෙනි දුවත් විවාහ වුනා. උසස් පෙළ දක්වා ඉගෙනිම කර කොළඹ රැකියාවක් කරනවා. එයාගෙන් තමා උදව් තියෙන්නේ. ඩග්ලස් ගලේවෙල සහෝදරයෙක් ගෙදර ඉඩමක වගා කරනවා. මම මේ පුංචි තේ කඩය දගෙන එදිනෙද ජීවත්වෙන්න මුදල් හොයනවා. හරිම අමාරුවෙන් ළමයි සාදගෙන ජීවත් වෙනවා.

පවුල් ප්‍රකාශ අංක 04

"වැලිගම කප්පරතොට උපන්න මම දයාවති. කප්පරතොට උපන්නත් මම දැන් ඉන්නේ කතළුවෙ කබලානේ. මගුල් කපුවෙකුගේ මාර්ගයෙන් විවාහ යෝජනාවක් ආවා. ඒ මට ඉස්සෙල්ලාම ආපු යෝජනාව. කබලානෙ කරුණාපාල. අපේ ගෙදරින් මේ ගැන සොයා බැලුවා. නරකක් නම් දැනගන්නට ලැබුනේ නැහැ. කරුණාපාල රස්සාවට කලේ මුහුදු යාම. එයා සිගරට්, බීඩි, අරක්කු කිසිවක් පාවිච්චි කලේ නැහැ. ඒ නිසා මමත් කැමති වුනා. කාගේත් කැමැත්ත ආශිර්වාදය මැද 1970 දී කරුණාපාලත් මමත් විවාහ වුනා. විවාහ වෙලා අපි මහ ගෙදර පදිංචියට ගියා. එහෙ නැනල මස්සිනාල කවුරුත් හිටියා. අවුරුද්දක් විතර අපිත් එකට හිටියා. වෙනසක් නැතිව හොඳින් කල් ගෙවුනා. අපි කැවෙ බීවෙ එකට. ටිකක් කල් ගියාට පස්සෙ

මහත්තයාගේ අම්මා වෙනස් වුනා. උඹල වෙනම කාපල්ලා අම්මා කීවා. මහත්තයත් මමත් ඒ කීම පිළිගත්තා. පිළි අරගෙන එද ඉඳල වෙනම උයන්න පටන් ගත්තා. දැන් එකම වහළ යට බත් හැලි දෙකක් ඉදෙනවා. දිනෙන් දින ගෙවිලා ගියා. ගෙදර පුංචි පුංචි ප්‍රශ්න ඇති වෙන්න පටන් ගත්තා. දවසකට නැන්දම්මා නෝක්කාඩු කියනවා. දවසකට නෑනා දෙස් කියනවා. මේක හරිම හිසරදයක් වුනා. මේ වන විට මට පුතාලා දෙන්නෙක් හිටියා. ගෙදර වාතාවරණය එන්න එන්නම නරක අතට හැරුණා. කරන්න දෙයක් තිබුනෙත් නැහැ. අපේ ලොකු අම්මා කෙනෙක් හිටියා කොග්ගල. අපි එහේ ගියා. මමත්, මහත්තයාත්, දරු දෙදෙනාත් කොග්ගල ලොකු අම්මලයි ගෙදර නැවතුණා. මේ අතරේදි ආරංචියක් ලැබුණා. රජයේ ඉඩමක් බෙද දෙනවා කතලුවේ කියලා. අපිත් එයින් ඉඩම් කැල්ලක් ඉල්ලුවා. අපි බලාපොරොත්තු නොවූ පරිදි ඒ ඉඩමෙන් අපිටත් ලැබුණා. ඒක ඉන්න තැනක් නැතිව හිටි අපිට ලොකු දෙයක්. මේ ඉඩම් වල ධිවර නිවාස යෝජනා ක්‍රමයෙන් අත්තම් නිවාස හදලා දුන්නා. අපි කාටවත් වරදක් කරල නැහැ. ඒ නිසා දෙයියෝ අපේ මූණ බැලුවා. මමත් මහත්තයත් දරු දෙදෙනාත් මේ ගෙදර පදිංචියට ආවා. මහත්තයා මුහුදු රස්සාව කළා කුලියට. ඒකෙන් ලැබෙන දෙයින් අපි කොහොම හරි හොඳින් ජීවත් වුනා. මේ අතරේදි ගමේ අයත් එක්ක එකට එකතු වුනා. ගමේ අය දමන සීට්ටු වලට මමත් හවුල් වුනා. මුලදී රු. 50/- ක් සීට්ටුවට දැම්මා. ටික ටික සීට්ටු දැම්මට මමත් හුරු වුනා. රු. 100/- , රු. 250/-, 500/-, 1000/- ගණන් වලින් සීට්ටු දැම්මා. මහත්තයා අනවශ්‍ය වියදම් නැති නිසා හම්බ කරන මුදලින් කීයක් හරි ඉතුරු කරගන්න පුළුවන් වුනා. ගමේ සීට්ටු දමන අය අතරට මාත් වැටුනා. මමත් සීට්ටු අල්ලන්න පටන් ගත්තා. මම ඇල්ලුව සීට්ටු තුනකම සල්ලි නොලැබී ගියා. මුල් සීට්ටු ගත්ත අය තුන් දෙනෙක්ම සීට්ටු මුදල් නොදී මග ඇරියා. කොතෙක් ඉල්ලා සිටියත් ඒ මුදල් දුන්නේ නැහැ. නමුත් ඒ සීට්ටු මම බේරන්න ඕන. රු. 65000/- ක් විතර මුළු මුදල. ඒ සීට්ටු බේරන්න මම වෙනත් තැන්වල සීට්ටුවලට එකතු වුනා. ඒවා අඩු ගණනට වෙන්දේසිය් අරගෙන මේ සීට්ටු බේරුවා. මේ වන විට මගේ ළමයිනුත් හම්බ කරනවා. මහත්තයත් ළමයිනුත් ගෙදර වියදමට දෙන මුදල් වලින් මම සීට්ටු බේරුවා. මමත් කඩයප්පන් හදලා විකුණලා සල්ලි හම්බ කළා. ඒවායින් ගෙදර වියදම පිරිමහ ගත්තා. ඒ විදියට ලොකු මුදලක් උපයන්න බැහැ. සීට්ටු වලට ගෙවා ගන්න සල්ලි නැති වුනාම 20% පොලියටත් අරගත්තා. ඒවටත් දිගින් දිගටම පොලී ගෙවන්න සිදු වුනා. කෙළවරක් නැති වුනා. පස්සේ මගේ ගමට ගිහින් තොටුපළ ළග පුංචි කඩයක් දැම්මා. උදේට කඩයප්පන් කඩ කැම හදගෙන ගිහින් කඩේ තියන් විකුණනවා. ඒ කඩෙන් ලැබෙන මුදලුත් සීට්ටු වලට ගෙවන්න සිදු වුනා. කඩේ කරගෙන යන්න මුදල් නැති නිසා කඩේ වහන්න සිදුවුනා. සීට්ටුකාරයන් ගේළගට ඇවිත් බනිනවා. දරුවොත් මහත්තයත් මට දෙස් කියනවා. මේක ඒ අයට හරිම කරදරයක් වුනා. දුව ගාමන්ට් ගිහින් හම්බ කරගත් මුදල් වලින් තමයි එයාගේ රත්තරන් බඩු

ගත්තේ. අන්තිමේදී ඒ බඩු ටිකත් තියලා රු. 15000/- ක් අරගෙන සීට්ටු මුදල් දුන්නා. මගේ කණේ කරාබු දෙක පවා මට අහිමි වුනා. මගේ සීට්ටු නිසා ගෙදර අයටත් හරි කරදරේ. නිදහසේ ඉන්න නැහැ. හැමදම සීට්ටුකාරයන් ගේ දෙරකඩට ඇවිත් බැනලා යනවා. මට නම් ඒක දැන් හොඳට අහලා පුරුදුයි. ඒත් මගේ මහත්තයා හරිම තැන්පත්, කාටවත් කරදරයක් නැති මනුස්සයෙක්. මේ සීට්ටුකාරයෝ දවසක් ගේ මිදුලට ඇවිත් බැන්නා. ඒක අහගෙන හිටපු මහත්තයා ඒ හිතේ අමාරුවෙන්ම මිය ගියා. මගේ අසරණ මහත්තයා මැරුණොත් මගේ මේ සීට්ටු පලහිලව් නිසා. මට මැරෙන්නවත් නිදහසක් නැහැ මේ සීට්ටු නිසා. මම දැන් හොඳටම අසරණ වෙලා. වෙන්න තියෙන සේරම වුනා. මගේ දරුවනුත් ලජ්ජාවට පත්වුනා. තවමත් මම ණයයි. සමිතියෙන් ණයක් අරගෙන ඒ ණය ගෙවල දමන්නයි මගේ අදහස. නැත්නම් මට මගේ දරුවනුත් නැතිව යාවි."

පවුල් ප්‍රකාශ අංක 05

මම නිශාන්ත. මගේ පවුලේ සහෝදරයෝ දෙන්නයි. එක වැඩිමහල් සහෝදරියයි. මම පුංචි කාලේ කවදවත් ඉස්කෝලේ. ගිහින් නැහැ. මට ඉස්කෝලේ යන්න උප්පැන්නයක් තිබුනේ නැහැ අපේ අම්මා මම ඉපදිලා ගෙදර අරගෙන ඇවිත් තියෙන්නෙ. ලියාපදිංචි නොකර උප්පැන්නය. ලියාපදිංචි කරන්න තාත්තා ඉස්පිරිතාලෙට ගිහිල්ලත් නැහැ. ඒක නිසා මට උප්පැන්නයක් තිබුනේ නැහැ. ඒ නිසාම මම කවදවත් ඉස්කෝලේ ගිහින් නැහැ. මගේ අම්මටයි, තාත්තටයි මට අකුරු උගන්නන්න ඕනකමක් තිබුනේ නැහැ. ඒ වුනාට ළමයි ඉස්කෝලේ යන එනකොට මට හරි ආශාවෙනි හිටියේ. ඒත් මම ඉගෙන ගන්න ලැබුනේ නැහැ. මට අවුරුදු 10-12 වන විට ගෙවල්වල වැඩට ගියා. ඒ යන අතරතුරදී ළමයින්ට උගන්වන පංති පවත්වන ගෙවල්වල වැඩ කරන්න මට ලැබුනා. ඒ තැන්වලදී පස්සේ ඒ අයගෙන් ඉඩකඩ ලැබෙන විදියට අකුරු ඉගෙන ගත්තා. දහම් පාසැල් වලට යන්න උප්පැන්න ඕන නැහැනේ. ඒ නිසා මම දහම් පාසැල්ගියේ හරිම ආසාවෙන්. එහිදී පන්සලේ හාමුදුරුවෝ මට අකුරු ඉගැන්නුවා. එහෙමයි මම අකුරු ඉගෙන ගත්තේ. දැන් මට අකුරු කියවන්නත් පුළුවන්. ලියන්නත් පුළුවන්.

මගේ තාත්තා සමුපකාර මුරකරුවෙකු විදියටයි රුකියාව කළේ. ඒ රැකියාව නැතිවුනාට පස්සේ තාත්තා කොළඹ ගියා. කොළඹදී යාළුවන්ට එකතු වෙලා මහ මැරයෙක් වගේ කටයුතු කළේ. එක එක දේවල් කළා. පස්සෙ ලොතරැයි ටිකට් විකුණන්න පටන් ගත්තා. ඒකෙන් තමයි අපි ජීවත් වුනේ. තාත්තාගේ ටිකට් වෙළඳම නිසා මමත් ඉබේම කොළඹට හුරුවුනා. මාත් තාත්තගේ ටිකට් විකුණපු මුදලාලි ළග නතර වුනා. මගේ ජිවිතේ ගොඩාක් වෙනස්කම් එහිදී

ඇතිවුනා. මගේ යාළුවෙක් හිටියා වැලිගම. එයත් එක්ක එයාගෙ නංගිගෙ උත්සවයට එහි ගියා. එහිදී නංගිත් එක්ක පිංතූර ගත්තා. එයාගේ නම ප්‍රියදර්ශණී. කථාබහ කළා. මගේ ලිපිනයත් එයාට දුන්නා. එයා මට ලියුවා. මමත් එයාට ලියුවා. මේ අයුරින් අපේ සම්බන්ධය දිගින් දිගටම පැවතුනා. ගෙදරවල් වලිනුත් අපේ සම්බන්ධයට එතරම් කැමැත්තක් දැක්වූවේ නැහැ. නමුත් අපි නිතර නිතර හමුවුනා. කාලයක් ඇසුරු කළාට පස්සේ මම ප්‍රියදර්ශණී කසාද බැන්ද. කසාද බැඳල අපේ ගෙදර එක්ක ගියා. එහේ ටික කලක් හිටියට පස්සේ අපේ ගේ ළඟ මැටිගහල ගෙයක් හදලා දුන්නා. අපි හරි අමාරුවෙන් කියක් හරි එකතු කර ගත්තා. මම ටිකට් විකිණීම දිගටම කරගෙන ගියා. මේ දවස්වල ප්‍රියදර්ශණීට දරුවෙක් ලැබෙන්න හිටියා. වෙන කිසිම ආදයම් මාර්ගයක් අපිට නැහැ. මම හම්බ කරන මුදලින් තමයි අපි ජීවත් වෙන්නෙත් තාත්තලා ජීවත් කරන්නෙත්. ඒ නිසා අපිට මාසයකට ලොකු ගණනක් වියදම් වෙනවා. ඒ නිසා මම හම්බ කරන්න ගොඩාක් මහන්සි වෙනවා. උදේට පාන් කෑල්ලක් කාලා වතුර බීලා බයිසිකලය පැදල හවස හතරට විතර පිටකොටුවට ඇවිත් බත් කාලා හවසට ගිහින් ටිකට් විකුණනවා. මහන්සි වුන තරමට නේ කියක් හරි අතට එන්නේ. සතියකට දෙකකට වරක් මම ගමේ යනවා. එතකොට කියක් හරි අරන් යන්න ඕනනේ. ඒ නිසා රෑට ඔය මොනවා හරි ඩිංගක් කාලා නිදගන්නවා.

අපි වැඩකර ගන්නෙ හරිම අමාරුවෙන්. ඒ වුනත් අපටම කියල ගෙයක් නැතිඑක හරිම අඩුවක්. මේ ගැන අපි හැම තිස්සෙම කථා කළා. පස්සෙ තිරණය කලා ණයක් හරි අරගෙන ගෙයක් හදගන්න. මම උපයන මුදලින් කොහොමහරි වාරිකය ගෙවා ගන්න පුළුවන්නේ. ඒ වුනත් අපි කළේ රත්රන් බඩු ටික සේරම බැංකුවට තිබ්බා. තියලා රු. 5000/- ක සහ රු. 15000/- ක ණය ගත්තා. ගෙයි බැම්ම උස්සලා කොහොම හරි වහල හද ගත්තා. මේ වන විට ප්‍රියදර්ශණීට තව දරුවෙක් ලැබුණා. දරුවො දෙන්නයි, අම්මයි, තාත්තයි, බිරිඳයි සියලු දෙනාම නඩත්තු කළේ මම. ප්‍රියදර්ශණී තමයි විපර්යකාරක සමිතියට බැඳිල තිබුනේ. එතන ගනුදෙනුවක් හොඳින් කරගෙන ගිය නිසා ණය ගැනීමේදී හරි පහසුවක් ඇතිවුනා. අපිට වැසිකිළියක් තිබුනේ නැහැ. වැසිකිළියක් හොඳටම ඕනවුනත් ගෙයි වැඩය කරගන්න ඕන නිසා ගේ හදගන්න උනන්දු වුනේ. වහලය ගසා ගත්තට පස්සේ හිතට හරි සැනසිල්ලක් ලැබුණා.

ඊට පස්සේ සමිතියේ වැසිකිළි ව්‍යාපෘතිය යටතේ වැසිකිළියකුත් හද ගත්තා. වැසිකිළිය හරි ලස්සනට ප්‍රියදර්ශණී තියාගෙන ඉන්නවා. හරිම පිරිසිදුයි. අපිටම කියලා දේවල් අයිතිවෙනකොට හිතට හරි සතුටක් ඇතිවෙනවා. හම්බ කරන්නත් ආස හිතෙනවා. ලොකු දරුවා දැන් වැසිකිළියට පුරුදුයි. අපිට නොලැබුන දේවල් අපේ දරුවන්ටත් ලබා දෙන්න පුළුවන් වුන එක කොයිතරම් සතුටක්ද? පිනක්ද. ගෙයි වහල ගැහුවට තව ගොඩාක් වැඩ තියෙනවා. පුංචි ගෙයක් කුස්සියක් එක්කම. ගෙයි බිම සිමෙන්ති දමන්නත් ඕන. බිත්ති

කපරාරු කරන්න ඕන. ජනෙල් දෙරවල් ගහන්නත් ඕන. ගෙදර ඉඳගන්න පුටුවක්වත් නැහැ. නමුත් අපි හිතාගෙන හිටි විදියට රත්රන් බඩු ටික බේරගන්න නාම බැරිවුනා. ඒවා බැංකුවට යින්න වුනා. රත්රන් බඩු ටික නැතිවීම ගැන හරිම දුකයි. ඒත් අද අපිටම කියලා ගෙයක් දෙරක් තියෙනවානේ. ඒක ලොකු දෙයක්. ප්‍රියදර්ශණී මටත් නොකියා සිට්ටුවක් දමලා. ප්ලාස්ටික් පුටු හයක් අරන් තියෙනවා. එච්චරයි තියෙන්නෙ. අපිට තව කොච්චර දේවල් කරන්න තියෙනවද. මේ ගෙයි වැඩ ටික ඉවර කරගන්න කොච්චර කාලයක් යාවිද. සමිතියෙ පිහිට තමා අපිට තියෙන්නේ. ඒත් එක්කම තව පොඩි අදහසක් මගේ හිතේ තියෙනවා. මොකක් හරි වාහනයක් ගත්තොත් මට වැඩිපුර ටිකක් විකුණන්න පුළුවන්. කාලයත් ඉතුරුයි. වැඩෙත් පහසුයි. කවද කරගන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ. ඒ වුනත් ඒකත් අපේ ලොකු බලාපොරොත්තුවක්.

පවුල් ප්‍රකාශ අංක 06

"මගේ නම පද්මිණී. අහංගම පියදිගම දුප්පත් පවුලක මම උපන්නේ. අපිට ඉන්න තැනක්වත් නැහැ. අනුන්ගේ ඉඩමක අපේ තාත්තා පුංචි මඩුවක් හැදුවා. ඒ පුංචි පොල්අතු පැල තමයි පසුව අපේ ගේ වුනේ. ඒ ඉඩම අයිතිකාරයෝ තාත්තත් එක්ක යාලුයි. අපේ තාත්තා ඒ ගෙදර වැඩපළ කරල දෙනවා. ඒ හිතවත් කමට ඉඩමෙ ගෙයක් හදගන්න දුන්නේ. අපි ඒ ගෙයි අඟහිඟකම් ඇතිව ජීවත් වුනා. මේ අතරතුරදී අපේ තාත්තා නැතිවුනා. අපි මේ වෙලාවේ හරිම අසරණ වුනා. තාත්තාගේ හිතවතුන් නෑදැයින් ගොඩක් අවමඟුල් උත්සවයට ආවා. වැලිකොන්ද ගමෙන් ආපු තාත්තගේ හිතවතෙකුගේ පුතෙක් තමයි නන්දසිරි. නන්දසිරි අපි ගැන අනුකම්පා කලා. අපට උදව් පදව් කලා. එයා නිතර නිතර අපේ ගෙදර ආවා. අපේ අඩුපාඩුකම් ගැන සොයාබලන්න තරම් එයා කාරුණික වුනා. නන්දසිරි රස්සාව කලේ මහාමාර්ග දෙපාර්තමේන්තුවේ. කම්කරුවෙක් විදියට. නන්දසිරි අපේ අම්මත් එක්ක මං ගැන අහල කථබහ කරල තිබුණා. අපිට උදව් කරපු විදියට එයාට අකමැති වෙන්න අපේ අම්මට බැරි වුනා. අම්මගේ කැමැත්ත මත මමත් කැමති වුනා. තාත්තගේ තුන්මාසෙ දනෙ දුන්නට පස්සේ නන්දසිරි මාව විවාහ කරගත්තා. විවාහ වෙලා නන්දසිරිලයි ගෙදර පදිංචියට ගියා. නන්දසිරිලයි මහ ගෙදර අවුරුදු 4 ක් 5 ක් විතර කාලයක් හිටියා. ඒත් ප්‍රශ්ණ ගොඩක් මැදයි අපි හිටියේ. අම්මලාගේ අඩුපාඩු නන්දසිරිට කිව්වත් වැඩක් නැහැ. මම ඒවා හරි අමාරුවෙන් විඳ දරාගෙන හිටියා. මේ කාලෙදී මට පුතා ලැබුණා. පුතත් එක්ක පියදිගම අපේ ගෙදර ආවා. ඇවිත් සුළු සුළු වෙළදම් කලා. මගේ මවත් වෙළදම් කටයුතු වල නිරතව සිටි නිසා මටත් ඒක හුරු වුනා. මේ කාලෙදී මගේ මහත්තයාගේ රස්සාවත් නැති වුනා. ඊට පස්සෙ සැහෙන ප්‍රශ්න ගොඩකට මැදි වුනා. ඒ නිසා

නන්දසිරිත් සති පොලවල් වල ගියා. එයින් අපිට ආදයමක් ලැබුණා. ඒත් නන්දසිරි මත්පැන් වලට හුරුවෙච්ච නිසා එයින් ඉතිරි කරගන්න බැහැ. එයා දවස් දෙකයි රස්සාව කලේ. නමුත් හැමදම බිච්චා. මේ වන විටත් අපි ජීවත් වුනේ පොල්අතු සෙවිලි කරපු ලැලි ගෙයක. ඒත් නන්දසිරිට කිසිම උවමනාවක් නැහැ පිළිවෙලක් වෙන්න. මේ අතරෙදි තමයි අපිට ලොකුදුව ලැබුනේ. නමුත් අපේ ජීවිතවල කිසිම වෙනසක් වුනේ නැහැ. කාලය ගෙවිල ගියා. නන්දසිරි සතිපොලවල් වල යමින් වෙළදම් කරමින් කීයක් හරි උපයා ගත්තා. ඒත් අපි ගැන හිතනවාට වඩා එයා හිතුවෙ එයා ගැන. තවත් දරුවෙක් අපිට ලැබුණා. බාලදුව ලැබෙන විටත් නන්දසිරි සති පොලවල් වල වෙළදම් කරා. ඒත් ඉතිරියක් නැහැ. හරි හම්බ කරන දේ කෑමට බීමට වියදම් කරන්නත් මදි. ළමයින්ට උගන්වන්නත් ඕන. අඩුපාඩු කම දහසක් මැද ජීවත් වුනේ. නන්දසිරිට නම් කිසිම ඕන කමක් නැහැ. එයා රේස් දමන්නත් පටන් අරන්. සල්ලියක් අතට ආවම බොන්නයි රේස් දමන්නයි වියදම් කරල ඉතුරු වුනොත් තමයි ගෙදරට දෙන්නේ. ඕලෝන් දැම්මෙන් කලාතුරකින් රු. 1000/- ක් හමාරක් එනවා. ඒත් ඉතින් ඒක ආයිත් රේස් වලට ඉවරයි. දැන් ළමයින් ලොකුයි ලොකු පුතා පාසැල් ගමන නැවැත්තුවා. අගහිගකම් නිසා. එයාට හරියට යාලුවො. වෙලාවකට හරි හිතුවක්කාරයි. ඒත් එයත් තාත්තත් එක්ක සති පොලවල් වල වෙළදම් කරන්න යනවා. පොලවල්වල යන්න සල්ලි නැති වුනාම පොලියටත් සල්ලි අරගත්තා. 40% පොලියටයි ගත්තේ. ඒත් හැන්දෑවට පොලියයි මුදලුයි දුන්නාම අත ඉතිරියක් නැහැ. මේ රස්සාවෙන් කිසිම එලක් නැහැ. පුරුදු වෙච්චි රස්සාව නිසා කරනවා. වෙන දෙයක් කරන්න දන්නෙත් නැහැනේ. ටික කලකින් පුතා ගාල්ලේ මුදලාලි කෙනෙක්ගේ කඩයක වෙළදම් කරන්න පටන් ගත්තා. ඒ හම්බ කරන එකෙනුත් කලින් ගත් ණය ටික ටික බේරනවා. තාත්තා නම් දවස් දෙකක් අනිවාර්යයෙන්ම පොලේ යනවමයි. එයාගේ වියදමට හම්බ කරගන්නවා. මේ අතරෙදි ලොකු දුවත් විවාහ වුනා. පොඩි දුව පමණයි පාසැල් යන්නේ. මගේ දැන් ගෙදර වියදම් පියව ගන්න කැවුම් හදල විකුණනවා. මේ රසකැවිලි හැදීමෙන් මසකට රු. 1000/- ක් විතර හම්බ කරනවා. සමිතියට දමන මුදල් විතරයි ඉතිරි වෙන්නේ. ගමක් වශයෙන් එකතු වෙලා ඉන්න නිසා මට තැන්පත් නොද බැහැ. ඒ ක්‍රමය නිසා මමත් ඉතිරි කිරීමකට යොමු වෙලා. සමහරදට රසකැවිලි හදන්න බඩු ටික ගන්නේ කඩෙන් ණයට. පුතා ටිකක් උනන්දුවෙන් වැඩකරන බව පේනවා. ඒ දරුවටත් තාත්තගේ වැඩනිසා එපාවෙනවා. පුතා දැනට හැම මාසෙම කීයක් හරි මගේ අතට දෙනවා. ඒක ලොකු අස්වැසිල්ලක්. අනුන්ගේ ඉඩමෙ උනත් අපිට වැසිකිලියක් නැති නිසා වැසිකිලිය හද ගත්තා. ඒකත් සමිතියේ වැසිකිලි ව්‍යාපෘතිය නිසා. ඉඩම අයිතිකාරයො අකමැති වුනා. රන්ඩු කරා. ඒත් අපි වැසිකිලිය හැදුවා. හදල දැන් පාවිච්චි කරනවා. අපේ අත්ත මුත්ත පවා වැසිකිලියට භාවිතා කලේ මුහුද. අදත් මුහුදට යන අය ඉන්නවා. මගේ ලොකු බලාපොරොත්තුවක් තියෙනවා ණයක් හරි අරගෙන ගේ පොඩ්ඩක් හදගන්න. පුතාටත් කියලා ණයක් අරගෙන හරි ගෙයක් හදගන්නවා.

"වැල්හේන්ගොඩ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පුංචි ඉඩම් කෑබැල්ලක තමයි. අපි ජීවත් වෙලා ඉන්නේ. මගේ නම ලීලාවතී. කසාද බඳිනකොට අවුරුදු 20 යි. මහත්තයට අවුරුදු 27 යි. මහත්තයාගේ රස්සාව කුලියට බේකරියක වැඩකරන එක. ඒකෙන් අපි ජීවත් වුනා. මේ අතරෙදි තමයි මට ලොකුදුව ලැබුනේ. අපිට ලොකුදුව ලැබී අවුරුද්දකට විතර පස්සේ පුතෙකුත් ලැබුණා. ළමයි දෙන්නෙකුටයි අපි දෙන්නටයි හතර දෙනෙකුට ජීවත් වෙන්න මහත්තයාගේ රස්සාව මදි නිසා එයා බේකරි රස්සාවෙන් අස්වුනා. අම්බලන්තොට මහත්තයාගේ නෑදෑයෝ යාලුවෝ හිටියේ. අපි ඔක්කොම අම්බලන්තොට පදිංචියට ගියා. එහේ කුඹුරු වැඩ කරා. හැමදම වැඩනම් තියෙනවා. ඒ උනාට එහේ හරි පැවිල්ල. ඉන්න අමාරුයි. වතුර නම් හරිම අඩුයි. දුක් විඳගෙන අවුරුදු 2 ක් විතර එහේ හිටියා. දරුවො ගැන හිතලා අපි ආපහු අම්මලාගේ ගෙදර ආවා. ඒත් මහත්තයට රස්සාවක් නැහැ. ලැබෙන හැම වැඩක්ම කරා. මේ අතරෙදි මට තව දුවෙක් ලැබුණා. අම්මල තමයි අපිට කන්න බොන්න දුන්නේ. මහත්තයට රස්සාවක් නැති නිසා අපි හරි අමාරුවෙන් තමයි ජීවත් වුනේ. හුණු කොටුවලත් ටික කලක් වැඩ කරා. ළමයි පාසැල් යවන්නත් ඕන. අගහිගකම් තිබුනට දරුවො ඒකට පලි නැහැනේ. ළඟම තිබුන පාසැලට ළමයි යැව්වා. අපේ කෑමබීම අඩුවුනත් දරුවන්ට කන්න බොන්න දීලා පාසැල් ඇරියා. අම්මලා අපිට හැම වෙලාවෙම උදව් කරා. බාලදුව ලැබුනේ මේ කාලෙදි. දරුවනුත් හදගෙන අමාරුවෙන් අපි ජීවත් වුනේ. දැන් පවුලෙ සාමාජිකයන් වැඩිනිසා. අම්මලයි ගෙදර ඉන්නත් බැහැ. අම්මලයි ඉඩමට අල්ලපු ඉඩමක් තිබුණා. ආණ්ඩුවේ ඒක අයිති අධ්‍යාපන දෙපාර්තමේන්තුවට. වැල්හේන්ගොඩ ඉස්කෝලේ පිට්ටනියට අයිතිය තිබුනේ. නමුත් ඒක කවුරුවත් පරිහරනය කරන්නේ නැහැ. වෙන කරන්න දෙයක් නැති නිසාම අපි ආණ්ඩුවෙ කැල්ලෙ පොල්අතු අහුරල ගෙයක් හදගත්තා. දරුවොත් එක්ක අපි ඒකෙ පදිංචි වුනා. අපේ නැතිබැරි කමටයි මේක කලේ. ඒත් ගමේ අය මේකට විරුද්ධ වුනා. මහත්තයා අම්බලන්තොට යනවා ඉඳහිට. එහෙම ගියාම හාල් එළවලු අරගෙන එනවා යාලුවන්ගෙන්. දවසක් එහෙම මහත්තයා අම්බලන්තොට ගියපු වෙලාවක පොලිසියෙන් ඇවිත් ඉඩමෙන් අස්වෙන්නයි තර්ජනය කලා. ඒත් ඉතින් මට යන්න එන්න තැනක් තිබුනේ නැති නිසා මට අස්වෙන්න බැහැයිම කිව්වා. අස්වුනේ නැහැ. මන්ත්‍රීතුමා මුණගැසී තීරණයක් ගැනීමට ඒ අය නියෝග කලා. මම පහුවදම මන්ත්‍රීතුමා මුණගැසීමට ගියා. මගේ අසරණකම ගැන නැතිබැරිකම ගැන මන්ත්‍රීතුමාට කිව්වා. එතුමා අපිට ගෙයක් හරි ඉඩමක් හරි දෙන්න පොරොන්දු වුනා විතරක් නෙවි අගමැති තුමාටත් දන්වන්නම් කිව්වා. අගමැතිතුමා ලියුමක් එවල තිබුණා. ඉඩමෙන් යන්න එපා ගෙයක් හෝ

ඉඩමක් දෙන්නම් කියලා. නමුත් අදවන තුරු අපිට ගෙයක්වත් ඉඩමක්වත් ලැබුනේ නැහැ. අපි කොහේවත් ගියෙත් නැහැ. අපි මේ පොල්අතු පැලේම හිටියා. කලකට පසු පොල්අතු දිරලා. මේ ගේ කඩා වැටුනා. ඊට පස්සේ ඒ ගේ ඔක්කොම කඩල දලා එතැනට මැටි ගහලා තිබුන ගෙට වඩා ටිකක් ඉඩකඩ තියෙන ගෙයක් හදගත්තා. මේ කාලෙදී ලොකුදුව වැඩිවිය පැමිණුනා. නෑදෑයින්ටත් දන්වලා පුංචි උත්සවයක් ගත්තා. මේ උත්සවයට කොළඹින් ආපු මගේ නංගී අපි ගැන අනුකම්පා කරලා ලොකු දුව එක්කරන් ගියා. රස්සාවකුත් සොයලා දෙන්න එයාලා කැමති වුනා. දුව කොළඹ ගිහින් ගාමන්ට් එකක රස්සාවකට ගිහින් ගෙදරටත් මුදල් එවල තිබුණා. පුතාත් පාසැල් ගමන නතර කරල ගමේ කුලී වැඩ කරමින් කීයක් හරි හම්බ කරනවා. මේ අතරතුරදී මගේ හිතට ලොකු නිදහසක් ලබාදෙමින් ලොකුදුව විවාහ කරදීමේ වගකීම මගේ නංගී භාරගත්තා. ඒ අනුව ලොකු දුවගේ විවාහ කටයුතු ඉතා හොඳින් කෙරුනා. එහෙම නොවෙන්න කවදාවත් අපට හොඳ දෙයක් සොයල බලල කරදෙන්න ලැබෙන්නේ නැහැ. පුතාත් ගමේ ගැහැණු ළමයෙක් එක්ක යාලුවෙලා තිබුනේ. එයත් ඒ ළමයා කසාද බැන්දා. දැන් පවුලේ බරපතල කම ටිකක් අඩුයි. මමයි මහත්තයයි නොබැඳපු ළමයි දෙන්නත් එක්ක ලොකු දුවගේ ගෙදර නවතින්න ගියා. අපි ඒ නිසා දෙවැනි දුව ලොකු දුවලයි ගෙදර නතර කරලා. එයාටත් රස්සාවක් ලැබුණා. අපි ගෙදර ආවට මහත්තයට කරන්න රස්සාවක් තිබුනේ නැහැ. දෙවැනි දුව මට මහන මැෂිමක් අරන් දුන්නා. කොළඹින් රෙදි කැලිත් ගෙනත් දුන්නා. ගෙවල් හැදුවෙ නැතත් අපි තුන්දෙනෙක් ජීවත් වෙන්න ඕනනේ. මම රෙදි කැලිවලින් කොට්ට උර බෙඩ්ෂීට් මහලා විකුණුවා. මේ විදියට අපි ජීවත් වුනේ. දෙවැනි දුව අපිට සැලකුවා. එයා අපි ගැන සොයා බැලුවා. මේ අතරේදී එයාත් විවාහ වුනා. බැන්දට පස්සේ එයා හදිසියෙම අසනීප වුනා. පපුවෙ අමාරුවක් හැදිලා. ප්‍රතිකාර ගන්න රෝහල්ගත කලා. දොස්තරවරු කීවේ පෙනහැල්ලේ සිදුරක් ඇතිබවත් ළමයි ලැබෙන්න ගියොත් ජීවිතය නැතිවෙයි කියලත් කිව්වා. නමුත් මේ අය පිළිගන්න කැමති වුනේ නැහැ. ඒ ගැන නොසැලකූ නිසා දුව නැවත අසනීපව රෝහල්ගත කලා. දෙමාපියන්ට හා සැමියාට හොඳටම දොස්තරවරු දෙස් පැවරුවා. අවසානයේ ළමයා නැති කරලා දුව බේරා ගත්තා. ඒ වුනත් අසනීපය දිගටම පැවතුනා. මීට පස්සේ දුවගේ සැමියා සමග යාමට දුවත් අකමැති වුනා. අපි දුව ගෙදර එක්කරගෙන ආවා. සහෝදරයන්ගේ උදව්වෙන් ජීවත් වුනා. නමුත් දුව නිතර නිතර අසනීප වුනා. රෝහල්ගත වීමට සහ ප්‍රතිකාර ගැනීමට නිතරම සිදු වුනා. නමුත් ස්ථිර සුවයක් නැහැ. එයා සැමියාගෙන් වෙන් වුනා. අසනීපය සඳහා ප්‍රතිකාර කරමින් ගෙදර නතර වුනා. ලොකු දුවගේ ගෙදරදී අපට ක්‍රිස්තියානි පියනමක් මුණ ගැසුනා. එම ආගමේ ලෙඩ රෝග සුව කරන්න පුළුවන්කම තියෙන බව ඔහුගෙන් දැන ගැනීමට ලැබුණා. දෙවැනි දුවගේ අසනීපයට ප්‍රතිකාර ගැනීමට එහි යායුතුයැයි අපි අදහස් කලා. දවසක් දුවත් සමග ඒ දෙව් මැදුරට ගියා. පියනම විසින් බොන වතුර යාතිකා කලා. දුවට අසනීපය වැඩිවුනා. සිහි නැතිව ගියා. සිහිය එන විට අසනීපය හොඳටම සුවයි. එයින්

පස්සේ දුවට අසනීපය හොඳ වුනා. ඊට පසුව තවත් අසනීප වුනේ නැහැ. අපේ දුවගේ දුක් වින්ද අසනීපය සුව කරලා දුන්න නිසා අපි ක්‍රිස්තියානි ආගමට බැඳුණා. දුව දැන් රස්සාවක් කරනවා. එයා සංතෝෂයෙන් ඉන්නවා. ඒකෙන් තමයි අපි සියලු දෙනා ජීවත් වෙන්නේ. දුවගේ බලාපොරොත්තුවක් තියෙනවා ගෙයක් හදගන්න.

පවුල් ප්‍රකාශ අංක 08

"මම අම්තා මගේ මහත්තයා පියතිලක. අපි දෙන්නම එකම ගමේ. වැල්ලද්දරගොඩ. මහත්තයට මම කියන්නේ රත්නා කියලා. එකම ගමේ එක ලඟ අපේ ගෙවල් තිබුණා. නිතරම අපි මුණගැහෙනවා. කථාබහ කරනවා. අපි දෙන්නට දෙන්න නැතුවම බැරිව ගියා. අපි දෙන්නා අතරේ ප්‍රේම සම්බන්ධයක් ඇති උනා. නමුත් දෙපැත්තෙම දෙමව්පියන් මේකට විරුද්ධයි. ඒත් ඉතින් අපි තරහ උනේ නැහැ. නමුත් අපිට දෙමව්පිය ආශීර්වාදය මැද්දේ එකතු වෙන්න ලැබුණේ නැහැ. ඒ නිසා අපි දෙන්නා තීරණය කළා දෙමව්පියන්ට හොරෙන් අපි විවාහ වෙමු කියලා. ඒ තීරණය මත අපි කාටත් හොරනේ විවාහ වුනා. විවාහ වුනාට පසු මහත්තයාගේ ගෙදර අපි පදිංචි වුණා. අපි දෙන්නගේම දෙමව්පියන් අපේ විවාහට අකමැති වුණ නිසා ඒ ගෙදරට යන්න දරුවො තියන්න මට හිතුනෙම නැහැ. ඒ නිසා ඉක්මණින් වෙන් වෙන්නයි ඕන වුනේ. මහගෙදර පිටිපස්සෙ පුංචි අතු මඩුවක් හද ගත්තා. අපි ඒකේ පදිංචි වුනා. ඊට පස්සේ මහත්තයා මුහුදු රස්සාවට මඩකලපු ගියා. ඒත් මසකට වතාවක් ගෙදර එනවා. දවස් සති මාස ගණන් ගෙවිලා ගියා. මහත්තයා මඩකලපු ගියාම මම ගෙදර තනියම. මහත්තයා ගෙදර අයගේ ඕනෑ එපාකම් සඳහා වියදම් කරනවා. සොයනවා බලනවා. මහත්තයාගේ නංගි කෙනෙක් හිටියා. එයා නිතරම ලෙඩ වෙනවා. එයාගේ ලෙඩේටත් මහත්තයා වියදම් කරා. මහත්තයා මට එවපු සල්ලවලින් නංගිගේ අසනීපෙට වියදම් කරන්න මුදල් ඉල්ලුවා. එතකොට මට ලොකු දරුවා හම්බ වෙලා හිටියේ. මහත්තයා එවපු සල්ලිවලින් දරුවට කරාබු ජෝඩුවක් ගන්නයි හිතාගෙන හිටියේ. ඒ නිසා නංගිගේ අසනීපෙට මම සල්ලි දුන්නේ නැහැ. මේ නිසා ගෙදර අය මගෙත් එක්ක තරහ වුණා. රංඩු වුණා. අන්තිමට ගේත් කඩල දැම්මා. ඊට පස්සෙ අපි අපේ අම්මලාගේ ගෙදර ගියා. අවු. 2 ක් විතර අම්මලාගේ ගෙදර හිටියා. අපේ මහත්තයා මල්ලිත් එක්ක සුළු අමනාපයක් වෙලා අපිට එහේ ඉන්න බැරිව ගියා. ඒ තරහට මල්ලි මගේ රෙදියි අල්ලමාරියේ ඇඳුනුයි පාරට විසි කරා. එද අපි ඉස්සරහ ගෙදර ඉස්තෝප්පුවෙ ටිකකට නතර වුණා. මෙහෙම ඉන්දෙද්දී තමයි දැන් ඉන්න මේ ඉඩම ගැන ආරංචි වුණේ. මහත්තය

මේ ඉඩම බද්දට ගත්තා. කීප දෙනෙකුගෙන් අතමාරු ඉල්ලගෙන තමයි ඉඩම බද්දට ගත්තේ. අපිට පැලක්වත් හදගන්න වත්කමක් තිබුණේ නැහැ. අහල පහල ඉඩම්වලින් ඉල්ලගෙන අමු පොල් අතු ටිකකින් අතු මඩුවක් හදගත්තා. මේ අතු මඩුව මිසක් ලිඳක් කක්කුස්සියක්වත් අපිට නැහැ. අපිට හිටියේ දරුවො දෙන්නයි. පොල් අතු ගෙයි මම අවුරුදු 17 ක් හිටියා. ඊට පස්සේ රජයෙන් ගෙයකට රු. 5000/- ක් දෙන බව දැනගන්නට ලැබුණා. ධීවර නිවාස යෝජනා ක්‍රමය යටතේ ගෙයක් අඩිතාලම දමන්න රු. 5000/- ක් දුන්නා. ඒකෙන් පොඩි ගෙයක් අඩිතාලම් දගත්තා. අපේ මහත්තයා වැඩකළේ කුලියට බෝට්ටුවල. අපේම කියලා ඔරුවක් තිබුනනම් කීයක් හරි ඉතිරි කරගන්න තිබුණාබව මහත්තය හැමදම කියනවා. මේ දවස්වල අපේ ගමේ තිබුණ විපර්යකාරක සමිතියෙන් ණයක් අරගෙන ඔරුවක් ගත්තා. ඊට කලින් මගේ මහත්තයා අනුන්ගේ ඔරුවක තමයි වැඩ කළේ. ඒකෙන් තමයි අපි ජිවත් වුණේ. අනුන්ගේ ඔරුවේ වැඩ කළාම බාගයක් ඔරුව අයිති මුදලාලිට දෙන්න ඕන. තමන් හම්බ කරන කොටසින් භාගයක් ඔරුයන හවුල්කාරයට දෙන්න ඕන. එහෙම හම්බ කරලා සමහර දවසට ඉතිරවන් මුදල තුන් දෙනෙකුට තේ බොන්නත් මදි. ඔරුව ගන්න ඕන වුනේ ඒ නිසාමයි. දැන් ලැබෙන මුදල ඔක්කොම අපිට ඒ ගත් ණය හොඳින් ගෙව්වා. පසුව ආයතනයෙන් තව ණයක් ගත්තා. රු. 10000/- ක . ඒකෙන් බිත්ති බැඳ ගත්තා. ඊට පස්සේ ධීවර ණය දෙවන කොටස වන රු. 8000/- ක් ගත්තා. ඒවයින් වහල දක්වා බැම්මේ සියළු වැඩ ඉවර කළා. ඊලගට වහලය තමයි ගහන්න තියෙන්නේ. මේ වන විට වාරකන් කාලය ඇවිල්ලා. දැන් මුහුදු යන්න බැහැ. අපිට තිබුණ එකම ආදයම දැන් නැහැ. දරුවො පාසල් යවන්නවත් විදියක් නැහැ. ජිවත් වුනේ හරිම අමාරුවෙන්. මේ අතරෙදී අපි හිටපු පොල් අතු ගේ වහල දිරුවා. ගේ තෙමෙන්න ගත්තා. ඒත් පොල් අතුවලට වියදම් කරන්නවත් සල්ලි නැහැ. ආයිත් පොල් අතුවලට වියදම් කරන්නේ නැතුව අළුත් ගෙයි වහල හදගත්තොත් හොඳයි කියලා. මහත්තයාගේ යාළුවෙක් ඇපවෙලා කඩේකින් උළු අරන් දෙන්නම් කිව්වා. ඒක ලොකු දෙයක්. ඒ නිසා අපි ගෙදර තිබුණු ලී වලින් වහල ගැහුවා. ඒත් අපිට උළු ලැබුනේ නැහැ. කඩෙන් උළු ඉල්ලුවාට අපිට ණයට දෙන්න කැමති වෙලා නැහැ. වහල ගහපු නිසා උළු නොතියා බැහැ. උළු ගන්න සල්ලිත් නැහැ. කරන්නට දෙයක් නැති තැන ගමේ 20% පොළියට දෙන කෙනෙකුගෙන් රු. 10000 ක් ණයට ගත්තා. මේ ණයේ පොළිය මාස පහක් යනතුරු අපට ගෙවා ගන්න බැරි වුණා. මේ ණය පියවගන්න අපිට ක්‍රමයක් තිබුණේ නැහැ. පස්සෙ හබරාදුව සහභාගීත්ව සංවර්ධන පදනමෙන් ණයක් අරගෙන මම පොළියට ගත් මුදල ගෙව්වා. එක කරදරයක් ඉවර වෙන කොට තවත් කරදරයක්. විවාහ වෙලා හිටිය ලොකු දුව මහත්තයත් එක්ක ආරවුලක් හදගෙන තරහ වෙලා ගෙදර ආවේ මේ දවස්වල. තනියම නොවෙයි ළමයෙකුත් එක්ක. අපිට කොච්චර ප්‍රශ්ණ තිබුණත් දරුවා අසරණ වෙලා ආවට පිටුපාන්න බැහැ. ලොකු දුවක් දරුවත් අපේ ගෙදර

නවත්ත ගත්තා. අපේ දරුවන්ට අමතරව තව පොඩි දරුවෙකුත් එකතුවුණා. ලොකු දුව දරුව ගෙදර තියලා රස්සාවකට ගියා. එයා හම්බකරන එකෙන් ගෙදර වියදමට ටිකක් හරි පහසුවක් වුණා.

එයා ගාමන්ට් එකෙන් ණයක් අරගෙන ටී.වී. එකක් ගෙනාවා. මල්ලිල නංගිල පිට තැන්වල ටී.වී. බලන්න යන නිසාලු එයා ටී.වී. එකක් ගත්තේ. දැන් ඒකට මාසෙට රු. 2000/- ක් ගෙවන්න ඕන.

දැනට වුණත් මුහුදු නොයන හය මාසෙ හරි අමාරුවෙන් තමයි ජිවත් වෙන්නේ. සමහර දිනවල 20% පොළියටත් ණය ගන්න වෙනවා. මුහුදු නොගිහින් ඉන්න දවස්වලට කෑමට බීමට අපි දුකක් විඳිනවා. අදත් රු. 100/- ණයට ඉල්ලා ගත්තා. කන්න විදියක් නැතිව. හාල් කිලෝ 1 1/2, පරිප්පු ග්‍රෑම් 100, මාළු මිරිස් ග්‍රෑම් 100, ලූණු ග්‍රෑම් 100, මිරිස් කුඩු පැ. 1, කරවල ග්‍රෑම් 100, පොල් ගෙඩියයි, ලාම්පුතෙල් බෝ. 1 යි ගන්න කොට රු. 100/- ඉවරයි. ඒත් මේවයින් කිසි දෙයක් හෙට ඉතුරු වෙන්නේ නැහැ. හෙට කොහොම කන්නද කියලා දෙයියො තමයි දන්නේ.

පවුල් ප්‍රකාශ අංක 09

"මම අයිරාංගනී. පදිංචි වෙලා ඉන්නේ අහංගම. ඒ වුණාට මගේ ගම නුවර වේවැල්දෙණියේ. මට කථා කිරීමේ අපහසුතාවයක් තියෙනවා. ඒත් වැඩපල හොඳින් කරන්න පුළුවන්. ඒ අඩුපාඩුව තිබුණත් තරුණ කාලෙදී මම ඇහැට කනට පේන්න හිටිය කියලා අම්මලා කියනවා. වේවැල් දෙණියේ අක්කර 50 ක විතර තේ වත්තක් තිබුණා. මේ වත්තේ මුරකාරන කොළුවෙක් හිටියා. නම අජිත් ගාල්ලෙ අහංගම එයාගෙ ගම. අජිත් නිතරම මට මුණ ගැහුණා. කථා බහ කළා. අපි හොඳ යහළුවන් වුනා. මේ ඇසුර ආදරයක් බවට පත්වුනේ අපිත් නොදැනිම. මගේ කථාකිරීමේ අපහසුතාවය නිසා මම හිතුවෙ කවදවත් පිරිමියෙක් මට කැමති නැතිවෙයි කියලා. ඒ නිසා අජිත්ගේ ඇසුරට මම හරි කැමති වුණා. මට අජිත් නැතිව බැරිව ගියා. අජිත් මට එයාලයි ගෙදර එන්න කථා කරා. දෙමව්පියන්ගෙත් අකමැත්ත පිට මම අජිතුත් එක්ක පැනල ආවා. ඒත් ඉන්න තැනක් තිබුනේ නැහැ. අග හිඟකම් හරියට. අජිත්ගේ ලොකු අම්මගේ පුංචි කඩකාමරයක් තිබුණා. ඒකේ අපි පදිංචි වුණා. මම ගෙදර දල ආයිත් නුවර යන්න අජිත් කැමති වුණේ නැහැ. ඒ නිසාම අජිත් වේවැල්දෙණියේ රස්සාවෙන් අයින් වුණා. ඊට පස්සේ ගමේ තැන් තැන්වල කුලී වැඩ කරමින් අජිත් මුදල් හම්බ කළා. ඒකෙන් තමයි අපි ජිවත් වුණේ. ටික කලක් මෙහෙම හිටියා. ලොකු අම්මා කඩ කාමරය ආපසු ඉල්ලා ගත්තා. ඊට පස්සේ මාසයකට රු. 700/- ක් දීලා කඩ කාමරයක් කුලියට ගත්තා. අපි ඒකේ

පදිංචි වුණා. සමහර දිනවල අජිත් හුණුගල් වලේ වැඩටත් යනවා. අවුරුදු තුනක්ම යනතුරු මට දරුවො හිටියෙ නැහැ. හැමෝම මට එක එක කථා කියන්න පටන් ගත්තා. අජිතුත් ටිකෙන් ටික වෙනස් වුණා. අජිත් හැමදම මගෙත් එක්ක රංඩු වෙනවා. ගහනවා. මම හරි දුකක් වින්ද. අජිත් ඒ දවස්වල කවත්ගෑණු ආශ්‍රය කළා කියලා මටත් දැනගන්න ලැබුණා. තවමත් ඒ අයත් එක්ක ඇසුර පවත්වා ගෙන යන බවත් ආරංචියි. නමුත් ගෙදර ආවාම මට බනිනවා. ගහනවා. ජීවිතේ එපාවෙලා මට තිබුණේ. ඒත් ඉතින් ගෙදර යන්නත් බැහැනේ. අජිත්ගේ නෑදෑයෝ කිව්වා අජිත් අත්හැරල අපේ ගෙදර යන්න කියලා. ඒත් මම නම් හිතා ගත්තෙ මැරුණත් යන්නේ නැහැ කියලා. මේ මිනිහත් එක්ක ඉන්නව කියලා හිතා ගත්තා. මට ගැහුවට මම බැන්නේ නැහැ. මම හැම දෙයක්ම ඉවසුවා. මේ අතරතුරේදී තමයි අජිත්ගේ තාත්තගේ ඉඩම් කැබැල්ලක් අපිට ලැබුණේ. ඒ ඉඩමෙ පොල් අතුවලින් පැලක් හද ගත්තා. අජිත් ඒවා උනන්දුවෙන් කළා. මගේ ජීවිතයේ ලොකු වෙනස්කමක් මේ දිනවල ඇතිවුණා. එනම් ලොකු දරුවා ලැබෙන්න හිටිය එක ඒක දරාගන්න බැරි ලොකු සතුටක්. අජිත් කොච්චර වැරදි කළත් මේ ආරංචිය අහල හරියට සතුටු වුණා. වහලේ පොල් අතු ටික දිරුවට පස්සේ තාරශීට් ගෙනත් ගැහුවා. අජිත් හුණු කොටුවල වැඩට යන්නට පටන් ගත්තට පස්සෙ නිතර නිතර හතිය හැදුනා. දවසෙන් වැඩි කොටසක් වතුරෙ ඉන්න නිසා දවස් දෙකක් වැඩ කළොත් දවස් 4 ක් ගෙදර අසනීපෙන්. එයා අසනීප වෙනකොට අපි බඩගින්නේ. මේ නිසා අපි හරි අමාරුවක වැටුණා. ඒ නිසා අජිත් ඒ රස්සාවෙන් අස්වුණා. හතියට බෙහෙත් අරගත්තා. දිගටම බෙහෙත් අරගෙන හතිය හොඳ වුණාට පස්සෙ අජිත් වෙනත් රැකියාවක් හොයන්න පටන් ගත්තා. ටික දවසක් ගෙවිලා ගියා. අගහිග කමේ අමාරුකම් බොහොමයි. ඒත් ඉතින් ආපසු හුණු කොටුවල නම් රස්සාවට යන්න දුන්නේ නැහැ. ටික දවසකට පස්සේ වැල්ලේන්ගොඩ ලයිට් කණු හදන වැඩපලක රස්සාවට ගියා. වැඩ අමාරු වුණත් කරන්න දෙයක් නැති කමට ඒක කළා. හුණු කොටුවෙ වැඩ කළාම වගේ ලෙඩ වෙන්නේ නැහැනේ. ඒ නිසා හැමදම වැඩට යන්න පුළුවන් වුණා. අජිත් කොච්චර වැරදි කළත! අරක්කු සිගරට් බොන්නේ නැහැ. වැඩක් කරන්න ගත්තම තමන්ගේ වැඩක් වගේ කරනවා නැහිගෙන. වැඩට දක්ෂයි. කිසිම පංගු පේරුවක් නැහැ. මේ නිසාම එතැන වැඩපළේ මහත්තයා අජිත්ට හරි ආදරෙයි. අපේ පවුලේ විස්තර අහල ගොඩක් අනුකම්පා කර තිබුණා. අපිට ඉන්න ගෙයක් නැහැ කියල දැනගෙන ගල්, වැලි, ගඩොල්, සිමෙන්ති ටික අරගෙන දුන්නා. පඩියෙන් අඩු කරගන්න බලාගෙන. ඒ උදව්ව නොලැබෙන්න අපිට කවදවක් ගෙයක් හදගන්න ලැබෙන්නේ නැහැ. ඒ වන විට අපේ ලගත් සල්ලි ටිකක් එකතු කරගෙන තිබුණා. ඒ නිසා අපි ගෙයක් අඩිතාලම් දමා ගත්තා. ටික ටික බිත්ති බැඳ ගත්තා. වහල පොල් අතු සෙවිලි කරගත්තා. අපි හිටපු තැන මඩවලක් තිබුණේ. මේ විදියට ගෙයක් හදගන්න පුළුවන් වේවි කියල අපි කවදවත් හිතුවේ නැහැ. ගේ පිටිපස්සෙ මුහුද. ඒ වුණත් කාමර දෙකක් එක්ක හදගත්ත මේ ගේ අපිට මාලිගාවක්. ගෙයි තවම වැඩ ඉවර කරගන්න බැරි වුණා. ඒත් දැනට

අපේම කියල ගෙයක් තියෙන එක සතුටක්. අජිත් දැන් හරි උනන්දුවෙන් සතුටින් වැඩ කරන්නේ. ඉස්සර තිබුණු රංඩු සරුවල් දැන් නැහැ. මේ අතරෙදි අපිට පුතෙක් ලැබුණා. තවත් බලාපොරොත්තුවක් ඉටු වුණා. අජිත් මහන්සිවෙලා හම්බකරනවා. මටවත් පුතාටවත් අඩුපාඩුවක් දැනෙන්න තිබ්බෙ නැහැ. අපි සතුටින් ජිවත් වුණා. මේ දවස්වල පියදිගම නැගෙනහිර දුප්පතුන් සඳහා ගොඩනැගූ සංවිධානයක් ඇතිබව දැන ගන්න ලැබුණා. දවසක් ඒ නෝනා මුණ ගැසී මේ ගැන විමසුවා. එය අප වැනි දුප්පතුන්ගේ ප්‍රශ්ණ විසඳ ගැනිම සඳහා ඇති බව දැනගන්න ලැබුණා. අපිත් ඒ සමිතියට බැඳුනා. අපේ අඩුපාඩු හදගන්න තියෙන එකම මග මේකයි කියලා අපිට හිතුනා. අපි මේ ගැන කථා බහ කළා. ඉතිරි කරන්නත් පුළුවන්. ණය ගන්නත් පුළුවන්. අපි වගේම දුප්ත් අය තමයි එකතු වෙලා තිබුණේ. එකිනෙකාගේ ප්‍රශ්ණ ගැන මේ සමිතියෙ කථාබහ කරනවා. උදව් කරනවා.. මමත් කලකට පසු මේ සමිතියෙන් ණයක් ගත්තා. වහලයට උළු ගන්න ණය අරගෙන උළු ගත්තා. වහල හදගත්තම මුළු ගෙයම හදගත්ත වගේ. ගේ පිටිපස්සේ එලල හදගත්ත පුංචි කුස්සිය ඉටි රෙදි කාඩ්බෝඩ් ලැලි වලින් තමයි ආවරනය කරගෙන ඉන්නේ.

අපිට වැසිකිලියක් නැහැ. අපි ඒ උවමනාව සපුරා ගත්තේ වැල්ලට ගිහින්. වැසිකිළියක ඕනකම බොහොම තිබුණා. වැල්ල අපේ අඩුපාඩුව සම්පූර්ණ කළත් මේ වැඩේ හැමදම කරන්න බැරි නිසා මේ ප්‍රශ්ණය විසඳ ගන්නේ කොහොමද කියලා හිත හිතා හිටියා. සමිතියේ වැසිකිළි ව්‍යාපෘතියක් තිබුණා. වැසිකිළියට අවශ්‍ය බඩු තමයි දෙන්නේ. අපිත් මේ වැසිකිළි ව්‍යාපෘතියෙන් ණයක් අරගෙන වැසිකිළිය හද ගත්තා. එකින් එක අපේ අඩු පාඩු සම්පූර්ණ වෙනකොට අජිත්ටත් මටත් ජිවත් වෙන්න ආශා හිතුනා. අපේ බලාපොරොත්තුව සමිතියෙන් ණයක් අරගෙන කොහොම හරි ගෙයි ඉතිරි වැඩ ටික ඉවර කරගන්නයි. සමිතියේ ගණුදෙනු කලට වේලාවට කළාම ගෙව්වාම තව ණය ගන්නත් පුළුවන් බව සමිතියෙ නිලධාරි කිව්වා. අපිට කොච්චර අඩුපාඩු තිබුණත් මම සමිතියෙ මුදල් කලින්ම වෙන් කර ගන්නවා. ඒ නිසා අපි හැමදම කලට වේලාවට මුදල් ගෙවනවා. අපි සමිතියෙ හොඳ ගණුදෙනුකරුවො කියලා සමිතියෙ අයත් කිව්වා. සමිතියෙ ණය දෙන්නේ අපේ ප්‍රශ්ණ විසඳගන්න. ඒ විතරක් නෙවි ජිවත්වෙන හැටි කනබොන හැටි ගේ දෙර තියාගන්න හැටි, පිරිසිදුකම, අරපරෙස්සම, දරුවන් ගැන මේ හැම එකක්ම කියලා දෙනවා. දෙමව්පියන් ලග නැති අපට සමිතිය දෙමව්පියන් වගෙයි.

පවුල් ප්‍රකාශ අංක 10

"මම වැල්හේන්ගොඩ සුවිනිතා. මගේ මහත්තයා මාතර වල්ගම නම චන්ද්‍රසේන. අපේ තාත්තගේ රස්සාව හුණුගල් කැඩීම. හුණුගල් කඩවන්න ගමේ ඉඩම් මුදලට ගත්තා. අපේ තාත්තට උදව් කරන්නයි චන්ද්‍රසේන ආවේ. තාත්තට හරි හිතවත්ව වැඩ කළා. තාත්තගේ හිත දිනා ගන්න එයා සමත් වුණා. එයා නිතර නිතර අපේ ගෙදරට ආවා ගියා. මගේ දෙමව්පියන් මුණගැහිලා මං ගැන අහලා. විවාහයක් තීන්දු කර ගත්තට පස්සේ තමයි මම දැනගත්තේ. මහත්තයාලාගේ අම්මලා නම් අකමැති බව දැනගන්නට ලැබුණා. ඒත් 1984.08.20 අපේ විවාහය ලියාපදිංචි කළා. විවාහ වුණාට මම හිටියේ අපේ ගෙදරමයි. මේ අතරෙ මට දරුවෙක් ලැබෙන්නත් හිටියා. අපේ ප්‍රශ්ණ ගොඩාක් තිබුණා. ගෙයක් දොරක් නැහැ. බඩු මුට්ටුවක් නැහැ. ස්ථිර ආදයම් මාර්ගයක් නැහැ. මේ ප්‍රශ්ණවලට විසඳුම් සොයාගන්න චන්ද්‍රසේන පිටරට යවන්න අදහස් කළා. මේ වන කොටත් අපේ මුදල් ටිකක් ඉතුරු කරගෙන තිබුණා. ඒකෙන් චන්ද්‍රසේන මැදපෙරදිග රස්සාවකට ගියා. මගේ දූ ඉපදෙන කොටත් මහත්තයා පිටරට. චන්ද්‍රසේන රට ඉඳගෙන මට සල්ලි එව්වා. නමුත් අපේ පවුලේ මුළු බර පැටවී තිබුණේ මගේ කරපිට. එයා රට ඉඳලා එවූ මුදල්වලින් කියක්වත් ඉතුරුකරගන්න මට බැරි වුණා. අවුරුදු 2 කට පස්සේ මහත්තයා රට ඉඳලා ආවට එයා හම්බ කරලා එවපු මුදල් තිබුණේ නැහැ. ඒ නිසා එයා ආයිත් පිටරට ගියා. අපේ ගෙදර අය නෑදෑයෝ කවුරුත් අපෙන් උදව් බලාපොරොත්තුව හිටියෙ. නැහැ බැහැ කියන්නත් බැහැ මහත්තය රට ඉන්න නිසා. කාගේත් ප්‍රශ්ණවලට උත්තර සපයන්න අපිට සිද්ධ වුණා. අපි දුක් වින්දත් ඒකෙන් අපේ දියුණුව සලසගන්න අපිට ඉඩකඩ නැහැ. ඒ නිසා මේ සැරේ මහත්තය රට ඉඳල ආවාම අපි වෙන ගේකට යන්න තීරණය කළා. නැත්නම් හැමදම අපට අනුන්ගේ පවු ගෙවන්නයි සිදු වෙන්නේ. චන්ද්‍රසේන අවුරුදු 2 කට පස්සේ ආයිත් ලංකාවට ආවා. අපි බද්දට හරි ගෙයක් ගමු කියාලා අපි බදු ගේකට ගියා. ඒත් අපේ අම්මයි තාත්තයි මල්ලිලා දෙන්නටයි කන්න අඳින්න දෙන්න වුණත් අපට එහෙම නොකර වෙන කරන්න දෙයක් නැහැ. මේ අතරෙදී අයිමත් පුරුදු රස්සාව කරන්න චන්ද්‍රසේන සුදනම් වුණා. වෙන රස්සාවක් තිබුණෙත් නැති නිසා හුණුගල් භාරවන්න පටන් ගත්තා. මේ අතරතුරේදී ඉඩම් කෑල්ලක් ගන්නත් සොයා බැලුවා. බදු ගෙය කිට්ටුව පර්චස් 34 ක බිම් ප්‍රමාණයක් මුදලට ගත්ත නිසා ගෙයක් හදන්න මුදලක් අපේ අතේ ඉතිරි වුණේ නැහැ. කටු මැටි ගහල බිත්ති කපරාරු කරල ඒ ගෙදර පදිංචියට ගියා. වහලට තාරෂීට් ගැහුවා. ඊට පස්සේ ලයිට් ගත්තෙත් අතේ තිබුණු මුදල් වලින්. අතේ තිබුණු මුදල්වලින් ඉඩමක් අරගෙන ගෙයක් හැදූ නිසා අතේ මුදල් ඔක්කොම ඉවර වුණා. හුණුගල් කැඩවීම ව්‍යාපාරය දිගටම කරගෙන යන්න බැරි වුණා. කුලී කරුවන්ගේ කුලී ගෙවන්නත් මුදල් ගෙවන්නත් මුදල් නැතිව ගියා. මුදල් ණයට

ගන්නත් උනා. පොලියට රු. 1000/- ක් ගත්තා. සතියකින් රු. 1100/- ක් දෙන පොරෙන්දුව පිට. ව්‍යාපාරය නතර කරන්නත් බැහැ. ව්‍යාපාරය පවත්වාගෙන යන්න හැමදම ණය ගන්න සිදු වුණා. ව්‍යාපාරයෙත් ගෙදරත් වියදම පියවගන්න ණය වෙන්න සිද්ධ වුණා. බැරිම තැන පදිංචි වෙලා හිටපු ගෙදර ඔප්පුව පත්මන් අයියට උගස් තිබ්බා. රු. 10000/- ක් අරගත්තා. ඒක හුණුගල් හැරවීමට යෙදෙව්වා. කරගෙන ගිය ව්‍යාපාරය නැවතත් තිබ්බ විදියටම කරගෙන ගියා. ණය ගෙවීම අපහසු වුණා. ණයත් එක්ක පොලිය රු. 15000/- ක් වුණා. ඔප්පුව බේරගන්න බැරි වෙයි කියලා [illegible] ඇති වුණා. ඊට පස්සේ රු. 20,000/- ත් පදුමක්කගෙන් ගත්ත. ඒ සල්ලි අරගෙන ඔප්පුව බේර ගත්තා. ඔප්පුව පදුමක්ක ලග තිබ්බා. ඒ රු. 20000/- ගත්තතෙත් පොලියට. එයා පොලී මුදල් ඉල්ලලා කරදර කරා. මොනවා කරන්නද කියලා හිත හිතා හිටියා. [illegible] මම එයා මුණ ගැහෙන්න ගියා. ගිහින් විස්තර [illegible] පස්සේ එයාලෙ ඉඩමක ඔප්පුව දුන්න උගස් තියා [illegible] මුළු මුදලම ගෙව්වා. පොළියෙන් පොලිය රු. 12000/- [illegible] ඒ පොලී මුදල හිග නිසා පදුමක්කා ඉඩම නිදහස් [illegible] පසුසෙ රු. 33000/- ක් පොලී ගෙවල තමයි ඉඩම බේරගත්තෙ. [illegible] බාප්ප ඉල්ලන කොට බේරන්න ඕන. අපි කරගෙන ගිය [illegible] කන්න බොන්නවතක් මුදල් නැති වුණා. මේ අතරෙදි [illegible] ඇති වුණා. මාසික පඩිය රු. 35000/- ක් ලැබෙනවලු. [illegible] ඒත් මේ හැම ප්‍රශ්ණයකම උත්තර හොයන්නත් [illegible] ගෙදරටත් හොරා අපි ඉන්න ඉඩම [illegible] ගෙදර එන්නවත් දුන්නේ නැහැ. දරුවන් අඩ අඩා [illegible] ඉඩ දෙන්න. එලියේ ඉන්න ඉඩ දෙන්න උදේට [illegible] ඉඩ දෙන්න කියා. මේකට දුක හිතිලා අම්ම [illegible] රට ගියා. එයා රට ගියාට රටට ඇතුල්වෙන්න [illegible] සති දෙකකට පස්සේ කලින් ගෙවූ මුදලටම [illegible] ඔර කාත්තත් සහෝදරයනුත් කරට ගත්තා. [illegible] එයාට ස්ථිර රැකියාවක් ලැබිලා නැහැ. [illegible] ණය ගෙවනවා. විසා ඉවරවුණත් චන්ද්‍රසේන [illegible] හැංගි හැංගි එයා රට ඉදලා තියෙන්නේ මෙහෙට [illegible] තට්ටු ගණනක් උස ගොඩනැගිල්ලකින් බිමට [illegible] වගේ ලංකාවට ආවේ. සල්ලිත් [illegible] ජීවත් කළේ. චන්ද්‍රසේන ලෙඩ ඇදේ [illegible] මිය ගියා. අපි තවත් අසරණ වුණා.

ගෙදර ප්‍රශ්ණ හරියට මල්ලියි නංගියි බැඳලා ගෙදර පවුල් 3 ක් ජිවත් වෙනවා. කන්න බොන්න නැහැ. ළමයින්ට උගන්වන්න විදියකුත් නැහැ. මගේ මහත්තයාට බෙහෙත් කරන්න වුනෙත් ණය වෙලා. බෙහෙත්වලට අමතරව වෙන වැඩත් කරා. අපේ ගෙදරට කොඩිවින කරල කියලා සාස්තරේකට කිව්වා. මම ණය වෙලා ඒවත් කැපුවා. මේ හැම දෙයකින්ම අන්තිමට වුනේ තව තවත් ණය විම. චන්ද්‍රසේන තාත්තට මේ ගැන දැනගන්න ලැබිල අපි බලන්න ආවා. ඇවිත් අපිව එහේ එක්කගෙන ගියා. අපි එහේ ගිහින් තවත් අසරණ වුණා. අපිට ඉන්න ලැබුණේ ඒ ගෙදර ගරාජය. තාත්තලා වුනත් ඒ අය අපිව සැලකුවෙ අනාථයන්ට වගේ. අපිට එහේ ඉදිම එපා වුණා. තාත්තත් එක්ක අමනාපෙන් තමයි එහෙන් ආවේ. ආයිත් අපේ ගෙදර පදිංචියට ආවා. ඒ වන විට පවුල් දෙකක් අපේ ගෙදර හිටියා. අපිත් එක්ක පවුල් තුනක් එහෙ ඉන්න ඉඩ මදි නිසා අපි වෙන් වෙන්න හිතුවා. මම සමෘද්ධියෙන් රු. 5000/- ක් ගත්තා. ස්වයං රැකියා කියලා මොනවා කරන්නද? ඒ සල්ලි වලින් ඉඩම් කෑල්ලක් ගත්තා මැටි ගහලා තාර ෂීට් ගහලා පොඩි ගෙයක් හද ගත්තා. මහත්තයයි දරුවො දෙන්නයි ඒ ගෙදර පදිංචියට ගියා. ජිවත්වෙන්න ක්‍රමයක් නැති නිසා මම ලුණු ඇඹරුවා. ඒකෙන් තමයි කියක් හරි අරගෙන ජිවත් වෙන්නේ. අඩු පාඩු හරියට. ඒත් ජිවත්වෙන්න එපාය. මහත්තයටත් දැන් සනීපයි. එයා දැන් මොන මොනවා හරි කරල කියක් හරි සොයා ගන්නවා. අපේ ළමයි ඉගෙන ගන්න දක්ෂයි. ඒ නිසා කොහාම හරි දුක් විඳගෙන ළමයින්ට උගන්වනවා. අපි වින්ද දුක් ළමයින්ට විදින්න දෙන්න බැහැනේ. මම හබරාදුව සහභාගිත්ව සංවර්ධන පදනමේ වැල්හේන්ගොඩ සමිතියට බැඳිලා ඉන්නේ. ඒකෙන් අපේ පවුලේ ප්‍රශ්ණ ගැන නිතර නිතර කථා කරනවා. ඒ සමිතියෙන් ගෙවතු වගාව කරන්න පුහුණුවක් ලබා දුන්නා. ඒ ආයතනයේ නිලධාරින් අපේ වැඩ කටයුතු බලන්න එනවා. දැන් අපේ ගෙවත්තේ වැඩ කරනවා. මහත්තයාත් ගෙදර ඉන්න කොට වත්තේ වැඩ කරනවා. අපේ ගෙවත්ත දැන් අමතර ආදයම් මාර්ගයක් බවට පත්වෙලා සමිතියෙ උදව්වෙන් අපිට මේ ප්‍රශ්ණ විසඳගෙන හොඳින් ජිවත් වෙන්න හැකි වේවි කියලා මම හිතනවා.

පවුල් ප්‍රකාශ අංක 11

"මම ජානකී. මගේ මහත්තයා පියසෝම. අපි දෙන්නම එකම ගමේ. අපි දුප්පත්. පියසෝමලා අපිට වඩා පොහොසත්. පියසෝමලා ගෙදර අය අපිත් එක්ක හරිම හිතවත්. අපිට උදව් කරනවා. අපේ පවුලේ ගැණු ළමයි තුන් දෙනයි. මම තමයි වැඩිමල්. ගෙදර අඩු පාඩු නිසා මම කොළඹ රස්සාවකට ගියා. කටුනායක නිදහස් වෙළඳ කලාපෙ ගාමන්ට් එකක. කොළඹ නතර වෙලා මම හිටියෙ. පියසෝමත් නිතර නිතර කොළඹ ආවා ගියා. මාත් මුණ ගැහෙන්නත් එනවා. ගමේ කෙනෙක් විදියට. මමත් ඇසුරු කළා මිස ඉන් එහා සම්බන්ධයක් තිබුණේ නැහැ. නමුත් පියසෝම අපේ ගෙදර ඇවිත් තියෙන්නේ මං ගැන බලාපොරොත්තුවෙන්. මම දැන ගත්තෙත් පස්සෙ. මේ ගැන මටවත් කිව්වෙ නැහැ. ඒ මගේ කට සැර නිසාලු ගෙදරට කියලා තියෙනවා. මම කොළඹ රස්සා කරද්දී දවසක් මහ කපටි වැඩක් කරලා තිබුණේ. අපේ ගෙදරට ගිහින් අපේ අම්මලාට තියලා මම කොළඹදී ජානකිව බැන්ද කියලා. අපේ අම්මලාට දරාගන්නා බැරිවෙලා. මම තමයි අපේ පවුලේ බර කරට අරන් හිටියේ. ඒ නිසා අම්මලාට හරි දුක හිතිලා. තරහත් ඇවිල්ලා. එයාලා පිළිගන්න විදියටම කියලා. පස්සේ අම්මලා තාත්තට අන්තිමයි කියලා විදුලි පණිවුඩයක් එවල මාව ගෙදරට ගෙන්නව ගත්තා. ගෙදර එනතුරු මම කිසිවක් දැනගෙන සිටියේ නැහැ. මම ගෙදරට එනවිට රෑ 12.00 ට විතර ඇති. ඒ වන විටත් පියසෝම අපේ ගෙදර. මම ගෙදරට ගොඩ වෙන කොටම පියසෝම නැගිටලා ගියා. ජානකිට කෑමට මොනවා හරි අරගෙන එන්නම් කියලා. ඊට පස්සෙ අම්මයි තාත්තයි මට බැනගෙන බැනගෙන ගියා. උඹ අපිටත් හොරා බැන්ද නේද මට මොනවා වුණාද දන්නේ නැහැ. මමත් පිස්සුවෙන් වගේ බැනගෙන බැනගෙන ගියා. පියසෝම ලග හිටියනම් ගහනවා තරහ යන තුරු. ඒ තරමට මට තරහ ආවා. මුළු ගමේම මේ ආරංචිය පැතිරිලා ගිහින්. කරන්න දෙයක් නැති නිසා ගෙදර තව නංගිලා දෙන්නෙක් ඉන්න නිසාත් මම පියසෝම කසාද බැන්ද. කසාද බැඳලා මම ආපසු කොළඹ රස්සාවට ගියා. මට කසාදෙට වඩා රස්සාව ලොකුයි. අපේ පවුල ජීවත් කරවන්නේ මම නිසා මට රස්සාව අතහරින්න බැහැ. පියසෝම ගෙදර ඉන්දෙද්දී මම කොළඹ රස්සාව කළා. අවුරුදු 2 ක් විතර මෙහෙම හිටියා. පියසෝම සතිපොළවක්වල වෙළදමට යනවා. හම්බ කරනවා. ඒත් වැඩක් නැහැ. එයා මත්පැන් බොනවා. පියසෝම හම්බ කරන සල්ලි ගෙදරටවත් දෙන්නේ නැහැ. බොනවා විතරයි. අම්මා නිතරම මැසිවිලි නගනවා. පියසෝමගේ අම්මටත් මේකට විසඳුමක් නැති තැන කොළඹ ඇවිත් මාව ගෙදර එක්කරගෙන ගියා. අම්මට අයිති කඩ කාමරයක් තිබුණා. ඒකෙ අපිට ඉන්න කියලා දුන්නා. අපි ඒ කඩ කාමරයේ පදිංචි වුණා. පියසෝම ගෙදර දෙරේ කටයුතු වලටත් රස්සාව කරන්නවත් එතරම් උනන්දුවක් නැහැ. බොන්නයි රේස් දමන්නයි තිබුණොත් හොඳටම ඇති. මේ කාලයේදීයි අපිට ලොකු දුව ලැබුණේ. පියසෝම පෙර පුරුදුවලට අමතරව ගෙදර රංඩු කරන්නත් දැන් පටන්

අරන්. පියසෝමගේ දින චරියාවේ නම් කිසිම වෙනසක් නැහැ. දරුවො එක්කෙනා දෙන්නා තුන්දෙනා වුණා. හම්බ කරන දේ ගෙදර වියදමට කෙහෙත්ම මදි. දරුවන්ට කන්න බොන්න හොඳට දෙන්නත් ඕන. අම්මලත් අපිට සලකන නිසා අපි කොහොම හරි ජීවත් වුණා. සමහර වෙලාවට පියසෝම අපි කන බොන විදියක් සොයන්නෙම නැහැ. එයා අම්මලයි ගෙදර ගිහින් කාල බීලා එනවා. ගෙදර අඩුපාඩු එමටයි. දරුවො තුන්දෙනෙක් එක්ක ජීවත්වෙන්න මගක් කල්පනා කර කර දවස් ඇරියා. රට යන අදහස ආවේ එවිටයි. අපේ අම්ම ලඟ දරුවො තියලා මම රට යන්න සූදනම් වුණා. පියසෝමවත් අම්මලාවත් මම රට යනවට කැමති වුනේ නැහැ. නමුත් ඒ අය මගේ ප්‍රශ්ණ විසඳන්නේ නැහැනේ. ළමයි තුන්දෙනා අපේ අම්මා ලග තියලා මම කුවේට් රටේ ගෘහ සේවයට ගියා. මට නිතරම දරුවනුත් පියසෝමත් අම්මලත් මතක් වෙනවා. මම හම්බ කරල පියසෝමටත් දරුවන්ටත් සල්ලි එව්වා. පිටරට ගිහින් සල්ලි හම්බ කරන එක ලේසි වැඩක් නෙවෙයි. දවසේ පැය 15 ක් 16 ක් විතර වැඩ කරනවා. පුදුම දුකක් විඳගෙන හම්බ කරා. තට්ටු තුනක ගෙදරක ගෑස් සිලින්ඩර උස්සගෙන ගිහිල්ලම තුනටිය කැක්කුමත් හැදුනා. දිනෙන් දින අමාරු වැඩි වුණා. ලංකාවට ගියත් දුක් විඳින්න වෙන නිසා අමාරුවෙන් ඉවසගෙන මාස 14 ක් රස්සාව කළා. බැරිම තැන රු. 18000/- ක් වියදම් කරලා ටිකට් එක හදගෙන ලංකාවට ආවා. ඒත් ආවට පස්සේ නාවානම් කියලා හිතුනා. මම කොයි තරම් දුක් විඳලද සල්ලි හම්බ කළේ. ඒත් පියසෝමට එවපු සල්ලිත් නැහැ. බඩු එවපුවත් නැහැ. මොනවා කරලද දන්නේ නැහැ. දරුවො නිසා මේ මිනිහත් එක්ක තවත් ජීවත් වෙන්න ඕනනේ. ඒ නිසා කිසිවක් අහන්නෙ නැතිව නිහඬව හිටියා. නැවත ගෙවල් හද ගෙන පදිංචියට ආවා. පියසෝමගේ අම්මා දුන්නු කඩ කාමරය බදු දුන්නා ලොන්ඩරියකට. එයින් මාසෙකට රු. 1500/- ක් ලැබෙනවා. මොනවා කරන්නද හිත හිතා ඉන්න වෙලාවෙ කොග්ගල ගාමන්ට් එකේ වැඩ කරන ළමයි කිප දෙනෙක් අපේ ගෙදර නවත්තා ගත්තා. ගෙයි කාමරයක් හදලා. ඒ ළඹයින්ට කන්නත් දෙනවා. කාමර දෙක වෙන් කරලා හදලා ළමයි 6 - 7 දෙනෙක්ම නතර කර ගත්තා. පියසෝමට නම් රස්සාවක් කරන්න උවමනාවක් නැහැ. මම එයාගේ රස්සාවල් හොයන්නෙත් නැහැ. මගේ මහන්සියෙන් හම්බ කර ගන්නවා. දහ පහලොස් දෙනෙකුට දවසට දෙසැරයක් උයන එකත් ලේසි වැඩක් නෙවි. ඒත් ඒක මම සතුටින් කරනවා. මම පහසුවෙන් උයන්න හිතාගෙන සමිතියෙන් ණයක් අරගෙන ගෑස් ලිපක් හා සිලින්ඩරයක් ගත්තා. ඉතිරි කරන්න බැරි වුනත් එදා වේල කාලා බීලා ඉන්න හරි මේක යන්තමට ඇති. අපේ මිනිස්සුන්ගේ හැටියට මෙහෙම හරි ජීවත් වෙලා ඉන්න එක ලොකු දෙයක්.